# අරමුණු මගින් කළමණාකරනය

## හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි.
මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කිපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# අන්තර්ගතය

මෙම අත්පොත භාවිත කරන ආකාරය . . . . . . . . . 3
කණ්ඩායම් වැඩ සඳහා යෝජනා . . . . . . . . 4
හැඳින්වීම . . . . . . . . . . . 5
පාඨමාලාවේ අරමුණු . . . . . . . . . . 6

1. අරමුණු මගින් කෙරෙන කළමණාකරනය සඳහා හැඳින්වීමක් . . . . . 7

2. පරමාර්ථයේ දෙවියන්වහන්සේ . . . . . . . . 18

3. පරමාර්ථය . . . . . . . . . . . 29

4. සැලසුම් කිරීම . . . . . . . . . . 40

5. සෙනඟ සහ ක්‍රියා පිළිවෙළ : සැලැස්ම ක්‍රියාත්මක කිරීම . . . . 52

6. පරිපූර්ණ කිරීම : සැලැස්ම ඇගයීම . . . . . . . 65

ඇමුණුම්

හැඳින්වීම . . . . . . . . . . 75
ඇමුණුම එක : ධර්මය පිළිබඳ ප්‍රකාශනය . . . . . 77
ඇමුණුම දෙක : පරමාර්ථය පිළිබඳ ප්‍රකාශනය . . . . . 81
ඇමුණුම තුන : පොදු සංවිධානය . . . . . . 83
ඇමුණුම හතර : සේවය සඳහා සෙනඟ සංවිධානය කිරීම . . . 89
ඇමුණුම පහ : සැලසුම්කිරීම . . . . . . . 99

ස්වයං ඇගයීම් සඳහා පිළිතුරු. . . . . . . . . 105

# මෙම අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ:

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණයද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයින්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයින් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා,** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයින්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්:** ශිෂ්‍යයින් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයින් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**අවසාන පරීක්ෂණය:** ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඨමාලාව සමඟ අවසාන පරීක්ෂණය ලැබෙන්නට ඇත. පාඨමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරීක්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

**මොඩියුලය: සංවිධානය**
**පාඨමාලාව: අරමුණු මගින් කළමණාකරනය**

# හැඳින්වීම

"අරමුණු මගින් කළමණාකරණය" යනු කිතුනු සේවය ක්‍රමවත්ව හා කාර්යක්ෂමව කරනු ලබන ක්‍රමයක් වේ. ඔබගේ ජීවිතය හා සේවය සඳහා දෙවියන්වහන්සේගේ කැමැත්ත පමණක් දැන ගැනීම ප්‍රමාණවත් නොවේ. ඔබගේ ආත්මික කැඳවීම සම්පූර්ණ කිරීම සඳහා ද ස්ථිර සැලැස්මක් ඔබ සකස් කළ යුතුය. දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් හා සැලසුම් සාක්ෂාත් කිරීම සඳහා උන්වහන්සේ සමඟ කටයුතු කිරීමට ඔබ උගත යුතුය.

බොහෝ කිතුනු නායකයින්ට ඇති ප්‍රබල ගැටළුවක් වන්නේ, ඔවුන්ට දෙවියන්වහන්සේ දායාද කොට ඇති සුවිශේෂී සම්පත් සංවිධානය කිරීම හා කළමණාකරනය කිරීම වේ. බයිබලයේ පෙන්වා ඇති පරිදි ආත්මික අස්වැන්න නෙළා ගැනීමට සිටින සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ නම් ඔවුන්ව මනාසේ සංවිධානය කර කළමණාකරනය කළ යුතුය.

කිතුනු සේවය සඳහා කෙරෙන සංවිධානාත්මක සැලසුම් කිරීම, ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිදහස කෙසේවත් සීමා නොකරයි. සත්‍ය වශයෙන්ම එය ඔබ වඩාත් සංවේදී කරනු ඇත. මක්නිසාද ඔබ සචේතනිකවම දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් හා සැලසුම් සෙවීමට තීරණයක් ගනු ඇති බැවිනි. දෙවියන්වහන්සේ සෑම විටම ක්‍රියාත්මක ඇදහිල්ලට ප්‍රතිචාර දක්වන බැවින් දෙවියන්වහන්සේගේ සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඔබගේ ඇදහිල්ල උපකාරී වේ.

මෙම පාඨමාලාව, දෙවියන්වහන්සේ ඔබ කැඳවා ඇති සේවය සාක්ෂාත් කිරීමට ඔබට උපකාරී වනු ඇත. දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් හා සැලසුම් සමඟ අනුරූප වන අභිප්‍රායක් සේවය සඳහා ඔබ සකස් කරනු ඇත. එමෙන්ම අරමුණු පිහිටුවීමටත්, සැලසුම් ක්‍රියාත්මක කිරීමටත් සහ ප්‍රතිඵල ඇගයීමටත් ඔබ ඉගෙන ගන්නෙහිය.

මෙම අධ්‍යයනයෙහි ඇමුණුම් කිතුනු සේවයේ එම පෙදෙසෙහිම සහා සහභාගිත්වය ඇතිව ප්‍රායෝගිකව සංවිධානය කිරීම සඳහා අවශ්‍ය නිදසුන්වලින් සමන්විත වේ.

හාවස්ටයිම් ඉන්ටනැෂනල් නෙට්වර්ක් මගින් පිරිනැමෙන "මොඩියුල සංවිධානය" නමැති අදියර තුනකින් යුත් පුහුණුවේ තෙවැන්න මෙම පාඨමාලාව වේ. මෙම පාඨමාලාවට පෙර ඇත්තේ "බයිබලීය කළමණාකරන මූලධර්ම" හා "පරිසරය විශ්ලේෂණය" නමැති ඒවාය. ඵලදායී සේවයක් සඳහා අවශ්‍ය නායකත්වය, සැලසුම් කිරීම හා සංවිධානය නිවැරදිව අවබෝධ කරගැනීම සඳහා මෙම පාඨමාලා තුන, යෝජනා කර ඇති අනු පිළිවෙළ අනුව අධ්‍යයනය කිරීම උචිත වේ.

සැලසුම් සකස් කිරීමට පෙර කළමණාකරනය පිළිබඳ බයිබලීය මූලධර්ම දැනගැනීම අවශ්‍යය. එමෙන්ම ඔබ සේවයෙහි යෙදීමට පෙර අදාළ පරිසරය විශ්ලේෂණය කිරීම ද වැදගත් වේ. එබැවින් මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඔබට 'බයිබලීය කළමණාකරන මූලධර්ම' හා 'පරිසර විශ්ලේෂණය' පිළිබඳ දැනුමක් ඇතැයි අපේක්ෂා කෙරේ.

# පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට :

- "කළමණාකරන අරමුණු" අර්ථවිග්‍රහ කිරීමට
- සැලසුම් කිරීම පිළිබඳ බයිබලීය පදනම සාරාංශ කිරීමට
- දෙවියන්වහන්සේගේ අභිප්‍රායයන් හඳුනා ගැනීම
- සේවය සඳහා අභිප්‍රාය පිළිබඳ ප්‍රකාශයක් සකස් කිරීමට
- සේවයේ අරමුණු සකස් කිරීමට
- අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ආත්මික සම්පත් සංවිධානය කිරීමට
- ඔබගේ සේවය පරිපූර්ණ කිරීම සඳහා ඔබගේ ක්‍රියාකාරකම් ඇගයීමට
- "කළමණාකරන අරමුණු" ඔබ ප්‍රාදේශීය සභාවට යොදා ගැනීමට
- "කළමණාකරන අරමුණු" ඔබගේ පෞද්ගලික ජිවිතයට හා සේවයට යොදා ගැනීමට හැකිවනු ඇත.

# පළමුවන පරිච්ඡේදය

## අරමුණු මගින් කෙරෙන කළමණාකරනය සඳහා හැඳින්වීමක්

**අරමුණු**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ❖ අරමුණු මගින් කළමණාකරනය යන්න අර්ථවිග්‍රහ කිරීමට
- ❖ අරමුණු මගින් කළමණාකරනය කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට
- ❖ අරමුණු මගින් කළමණාකරනය කිරීමට විරුද්ධ දේ සමඟ කටයුතු කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

**සියල්ල විනීතව ද විධිමත්ව ද කළ යුතුය (1 කොරින්ති 14:40)**

**හැඳින්වීම**

"කළමණාකරනය" යනු මිනිසුන්, ද්‍රව්‍යයන් හා ආත්මික සම්පත් මගින් සැලසුම් සාක්ෂාත් කිරීමේ ක්‍රියාවලිය වේ.

"අරමුණු මගින් කළමණාකරනය" යනු සේවය විධිමත්ව හා ඵලදායිව සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය වේ" බයිබලයේ මෙසේ සඳහන් වේ.

**සියල්ල විනීතව ද විධිමත්ව ද කළ යුතුය (1 කොරින්ති 14:40)**

බයිබලීය වාර්තාවන් ආරම්භයේ සිටම, දෙවියන්වහන්සේ සැලසුම් සකස් කර, ඒවා ප්‍රවේශමෙන් වාර්තා කර ඒවාට කීකරුවන පුරුෂයින් හා ස්ත්‍රීන්ට සන්නිවේදනය කළ සේක.

කූඩාරම ගොඩනැඟීම සඳහා දෙවියන්වහන්සේ මෝසෙස් ලවා ලිඛිත සැලැස්මක් පිළියෙල කළ සේක. දේවමාලිගාව සඳහා සැලැස්ම දෙවියන්වහන්සේ දාවිත්ට දුන් සේක. හෙසකියා ලැබූ දර්ශනය පැහැදිලිව හා විධිමත්ව ලිවීමට දෙවියන්වහන්සේ හෙසකියාට පැවරූ සේක.

මෙම පාඩම "*අරමුණු මගින් කළමණාකරනය*" හඳුන්වා දෙයි. එහි අන්තර්ගතයෙත්, එහි වැදගත්කමත්, ඔබ අභිමුඛයට එන විරෝධතාවන් ඇත්නම් ඒවා සමඟ කටයුතු කරන ආකාරයත් මෙය ඔබට උගන්වයි.

**අරමුණු මගින් කළමණාකරනය**

නිරවද්‍යවම මාතෘකාව මගින් පෙන්නුම් කෙරෙන්නේ "අරමුණු මගින් කළමණාකරනය" වේ. එය සේවයේ අරමුණු කළමණාකරනය කිරීම වේ. "කළමණාකරනය" යනු "ගබඩාකාරත්වය" ට තවත් වචනයකි. "ගබඩාකරුවෙකු" හෙවත් "කළමණාකරුවෙකු" තමන්ට තවත් අයෙකු විසින් පවරන ලද යම් දෙයක් ගැන වගකීම දරන්නෙකු වේ. ඇදහිලිවන්තයෙකු ලෙස ඔබ, දෙවියන්වහන්සේ විසින් ඔබට දී ඇති ආත්මික සම්පත් කෙරෙහි ගබඩාකරු වේ. මේ දේ ද ඊට ඇතුළත් වේ.

**ශුභාරංචිය:** සෑම ඇදහිලිවන්තයෙකුම ශුභාරංචියේ ගබඩාකරු වේ. එහි පණිවුඩය අප අන් අය සමඟ බෙදාගත යුතුය.

**මුදල්:** සෑම ඇදහිලිවන්තයෙකුම, දෙවියන්වහන්සේ විසින් තමන්ට පෞද්ගලිකවම දී ඇති මුදල්වල ගබඩාකරු වේ. එමෙන්ම සභාවක හෝ කිතුනු සංවිධානයක හෝ අරමුදල් භාරව සිටින තැනැත්තෙකු ද ඒ පිළිබඳ ගබඩාකරුවකුය.

**සේවය සඳහා ද්‍රව්‍යමය සම්පත්:** දේවස්ථාන ගොඩනැගිලි, දේපල හා බඩුබාහිරාදිය.

**ආත්මික දීමනා:** සෑම ඇදහිලිවන්තයෙකුටම අවම වශයෙන් එක් දීමනාවක් හෝ ඇත. ඔබගේ ආත්මික දීමනාවෙහිද ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ ඔබගේ සේවයෙහිද ගබඩාකරු ඔබ වේ.

**අනෙකුත් ඇදහිලිවතුන්:** දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැඟීම සඳහා මිනිසුන් මිස වැඩ සටහන් භාවිත කරන්නේ නැත. කළමණාකරනයට හෙවත් ගබඩාකාරත්වයට අයත් වන්නේ මිනිසුන් වේ. ඔබ නායකයෙකු නම්, ඔබ සමඟ සේවයේ යෙදෙන අය සඳහා වගකීම ඔබ දැරිය යුතුය. ආත්මිකවම වර්ධනය වන්නටත් සේවය සඳහා ඔවුන්ගේම ආත්මික දීමනා වර්ධනය කර ගන්නටත් ඔබ ඔවුන්ට අතදිය යුතු වේ.

ඔබ, මෙම සම්පත් පිළිබඳ යහපත් ගබඩාකරුවෙකු විය යුතුය. ගබඩාකරුවෙකුගේ ප්‍රධානතම අවශ්‍යතාව වන්නේ ඔවුන් විශ්වාසවන්තයින් වීම වේ.

**භාරකාරයන්ගෙන් බලාපොරොත්තු වන්නේ ඔවුන් විශ්වාසවන්තව සිටීමය (1 කොරින්ති 4:2).**

සාර්ථක කළමණාකරුවෙකු හෝ ගබඩාකාරයෙකු හෝ වීමට ඔබ සැලසුම් සකස් කළ යුතුය. "අරමුණු" යනු "සැලසුම්" හෝ "ඉලක්ක" හෝ සඳහා තවත් වචනයකි. එබැවින් අරමුණු මගින් කළමණාකරනය යනු "දෙවියන්වහන්සේ විසින් ඔබට දෙනු ලබන ආත්මික සම්පත්වල සාර්ථක කළමණාකරුවෙකු වීම සඳහා සැලසුම් සකස් කිරීම වේ."

මතෙව් 25:14-30 හි, "තලෙන්ත" නමැති සම්පත් තම සේවකයින්ට දුන් ස්වාමියෙකු පිළිබඳ උපමාවක් ජේසුස් වහන්සේ පැවසූ සේක. ඔවුන්ට යහපත් ගබඩාකරුවන් වී අරමුදල් ඥාණාන්විතව භාවිත කරන ලෙස දැන්වීය. එක්කෙනෙක් හැර අනෙක් අයට එය සාර්ථකව අනුගමනය කිරීමට සැලසුම් තිබිණි. සම්පත් සඳහා සැලසුම් සකස් නොකළ හා තලෙන්ත භාවිත නොකළ තැනැත්තාව අවිශ්වාස දාසයෙකු ලෙස විනිශ්චය කරන ලදී.

ජේසුස්වහන්සේ සැලසුම්කරණය සඳහා ධෛර්යවත් කළ සේක.

**ඔබ අතුරෙන් යමෙක් මුර අටල්ලක් ගොඩනැඟීමට අදහස් කරයි නම්, එය නිම කරලීමට කොතරම් වියහියදම් ඇද්දැයි පළමුකොට හිඳ ගණන් නොබලන්නේද? (ලූක් 14:28).**

සැලසුම්කිරීම හා කළමණාකරනය පිළිබඳව මෙම පාඨමාලාවේ අප කතා කරන විට, ලෞකික ව්‍යාපාර ලෝකයේ සැලසුම් ගැන කතා නොකරන්නෙමු. අප කතා කරන්නේ ඵලදායි සේවයක් සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම යටතේ කෙරෙන සැලසුම්කිරීම පිළිබඳවය. දෙවියන්වහන්සේ අනාගතය දන්නා බැවින්, සැලසුම් කිරීම සඳහා ඔබට ප්‍රඥාව දීමට උන්වහන්සේට පුළුවන. අරමුණු මගින් කළමණාකරනය ඔබව දෙවියන්වහන්සේ ඔබට දී ඇති ශුභාරංචියේ හා සේවයේ යහපත් ගබඩාකරුවෙකු කරනු ඇත. උන්වහන්සේගේ අභිප්‍රායන් සාක්ෂාත් කර ගැනීම සඳහා දෙවියන්වහන්සේ සමඟ වැඩ කිරීමට එය ඔබට උපකාරී වනු ඇත. මිනිසුන් ඇදහිල්ලෙන් පියවරක් ගෙන සැලසුමක් අනුව වැඩ කරන විට දෙවියන්වහන්සේ ඔවුන් සමඟ සිටින බව බයිබලය සහතික කරයි.

අරමුණු මගින් කළමණාකරනය සඳහා මේවා ඇතුළත් වේ.

- දෙවියන්වහන්සේගේ අභිප්‍රායන්ට අනුකූලව සේවය සඳහා අභිප්‍රායන් සැකසීම.
- අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුමක් සකස් කිරීම.
- සැලසුම් ක්‍රියාත්මක කිරීමට (ක්‍රියාත්මක කිරීම යනු ක්‍රියාවට නැංවීම වේ.) මිනිසුන් හා ක්‍රියා පිළියෙලයන් සංවිධානය කිරීම.
- ඇගයීම තුළින් සැලසුම පරිපූර්ණ කිරීම.

සාර්ථක ගබඩාකාරිත්වය හා සැලසුම් කිරීම සඳහා වෙහෙස වී ක්‍රියා කළ යුතුය. ඒ සඳහා කාලයත් උත්සාහයත් අවශ්‍ය වේ. ලී, පිදුරු හා ඉපනැලි වැනි ආත්මික කාර්යයන් නිපදවීම පහසුය. එහෙත් ඒවා ක්ෂයවන ද්‍රව්‍ය වේ. රිදී හා රන් සඳහා වඩාත් වෙහෙසක් දැරිය යුතු වුවද ඒවා කල් පවතී.

**මේ අත්තිවාරම මත ගොඩ නැඟීමට යම් අය යොදන්නේ රන්, රිදී, අගනා මැණික් දැව, තෘණ හෝ පිදුරු නම්, ඔවුන්ගේ කර්මාන්තයේ තත්වය හෙළිදරව් වන්නේය. ඒ දවස ගින්න සහිතව උදාවේ. ඒ ගින්නෙන් ඒ ඒ කර්මාන්ත පරීක්ෂා කරනු ලැබීමෙන් ඒවායේ නියම ස්වභාවය හෙළි වේ (1 කොරින්ති 3:12-13)**

**බයිබලීය නිදසුනක්**

ජේසුස්වහන්සේගේ සේවය අරමුණු මගින් කළමණාකරනය කරන ලද්දකි.

**පරමාර්ථය:**

දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ තමන්වහන්සේගේ පරමාර්ථය ජේසුස්වහන්සේ දැන සිටි සේක. උන්වහන්සේගේ මුල් සේවා කාලයේ පරමාර්ථ පිළිබඳ ප්‍රකාශ බොහොමයක් උන්වහන්සේ කර ඇත. නිදසුනක් සඳහා ලූක් 4:18-19 බලන්න.

**සැලැස්ම:**

සේවය සඳහා සැලැස්මක් ජේසුස්වහන්සේට තිබිණි. උන්වහන්සේ ශුභාරංචිය දේශනා කිරීමට හා ඉගැන්වීමටද, රෝගීන් සුව කිරීමට ද යක්ෂයින් පලවා හැරීමටද දේව වචනය තහවුරු කෙරෙන හාස්කම් කිරීමටද සැලසුම් කළ සේක. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පරමාර්ථය සම්පූර්ණ කරන්නේ සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය උදෙසා මිය යාමෙන්ද සතුරාගේ ක්‍රියා විනාශ කිරීමෙන්ද හා බලයෙන් හා මහිමයෙන් යුතුව මරණයෙන් නැවත නැඟිටීමෙන්ද වේ.

**සෙනඟ:**

ජේසුස්වහන්සේ, උන්වහන්සේගේ සේවය සඳහා මනුෂ්‍යයන් යොදාගත් සේක. උන්වහන්සේ, තමන්වහන්සේ සමඟ සේවයේ යෙදීමට සුවිශේෂිව දොළොස් දෙනෙකු කැඳවූ සේක. එමෙන්ම ශුභාරංචිය සියලු ජාතීන් වෙත ගෙන යෑමට සියලු ඇදහිලිවතුන්ට බලය පැවරූ සේක.

**ක්‍රියා පිළිවෙළ:**

දෙවියන්වහන්සේගේ සැලසුම් සම්පූර්ණ කිරීමට ජේසුස් වහන්සේට ක්‍රියා පිළිවෙළක් තිබිණි. ක්‍රියා පිළිවෙළ යනු යම් දෙයක් කරන මාර්ගයකි. නැතහොත් ක්‍රමයකි. උන්වහන්සේ ශුභාරංචිය පැතිරවීමේ ක්‍රියා පිළිවෙළ මතෙව් 10 න් හා ලූක් 10 න් සැකෙවින් දක්වා ඇත.

**පරිපූර්ණත්වය:**

සැලසුම පරිපූර්ණ කිරීම සඳහා උන්වහන්සේ තම ශ්‍රාවකයන්ගේ සේවය ඇගයූ සේක (ලූක් 10:17-24). සැලැස්ම පරිපූර්ණ කළ පසු, එහි කොටස්කරුවන් වීමට සියලු ඇදහිලිවතුන්ට බලය පැවරූ සේක (මතෙව් 28:19-20 හා ක්‍රියා 1:8).

**යහපත් කළමණාකරනයේ වැදගත්කම**

දෙවියන්වහන්සේ ඔබට පවරා ඇති සේවය යහපත් ලෙස කළමණාකරනය කිරීම වැදගත් වේ. ඒ පහත දැක්වෙන හේතු නිසාය.

**පරමාර්ථයක් හා මඟපෙන්වීමක් ලබා දෙයි**

ඔබගේ සේවයේ ඔබ සාර්ථක වීමට නම්, ඔබගේ සැලසුම් හා පරමාර්ථයන් දෙවියන්වහන්සේගේ ඒවා සමඟ ගැළපිය යුතුය.

ඔබ, ඔබගේ සේවයේ සුවිශේෂී පරමාර්ථය දන්නෙහි නම් හා එම පරමාර්ථය සාක්ෂාත් කිරීමට සැලසුම් සකස් කරන්නේ නම්, එවිට අන් අයට මඟපෙන්වීමට පුළුවන. තම අනුගාමිකයිනට මඟපෙන්වීම සඳහා යහපත් නායකයින් තමන් යන්නේ කොතැනකට දැයි දත යුතුය. උපදේශනය හා සේවයේ එකඟත්වයට පොදු පරමාර්ථයක් හා මඟපෙන්වීමක් තිබේ.

නිවැරදි මඟපෙන්වීමක් ඇති විට ව්‍යාකූලත්වයක් නොමැති වේ.

> **මන්ද දෙවියන්වහන්සේ ව්‍යාකූලත්වයේ නොව සාමයේ දෙවියන්වහන්සේය (1කොරින්ති 14:33)**
>
> **ඔබ දෙවියන්වහන්සේගේ ප්‍රේමණීය දරුවන් බැවින්, උන්වහන්සේ මෙන් වන්නට උත්සාහ කරන්න (එපීස 5:1).**

දෙවියන්වහන්සේට, ආරම්භයේ පටන්ම පරමාර්ථයක් හා සැලැස්මක් තිබූ බව මෙම පාඨමාලාවෙන් ඔබ ඉගෙන ගනු ඇත. දෙවියන්වහන්සේගේ ක්‍රියාකාරකම් ව්‍යාකූලත්වයේ ගතිලක්ෂණ නොතිබිණි නම්, උන්වහන්සේගේ සේවකයන්ගේ සේවයන්ද එසේම විය යුතුය.

**නිවැරදි තිරණ ගැනිමට ඔබට අවසර ලැබේ.**

ඔබගේ ඉරණම නිශ්චය කරනු ලබන්නේ තිරණවලිනි. මෙය ගැළවීම උදෙසා වුවද සත්‍යයකි. ශුභාරංචිය පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ඔබ තිරණය කළ යුතුය. ඔබගේ සදාතන ඉරණම නිශ්චය කරනු ලබන්නේ ඔබගේම තිරණයෙනි.

ඔබගේ වර්තමාන ජිවිතය හා මෙහෙය නිශ්චය කර ඇත්තේ ඔබ කලින් ගත් තිරණ අනුව වේ. සිතාමතා සැලසුම් කිරීමෙන් හෝ ක්ෂණිකව ඒ මොහොතේම හෝ ඔබට තිරණ ගැනිමට පුළුවන. ස්වාමින්වහන්සේගේ මඟපෙන්වීම ඇතිව කෙරෙන සැලසුම් කිරීම හා කළමණාකරනය මගින් නිවැරදි තිරණ ගැනිමට ඔබට හැකිවේ.

**සේවය සඳහා ප්‍රමුඛතාවන් ප්‍රතිස්ථාපිත කෙරේ.**

දෙවියන්වහන්සේගේ සැලසුම් හා පරමාර්ථ දැනගැනිම, ඔබගේ ජිවිතය හා සේවය සඳහා ප්‍රමුඛතා ප්‍රතිස්ථාපනය කිරීමට උපකාරී වේ. ප්‍රමුඛතාවන් යනු ඔබට තෝරාගත හැකි ඒවායින් එක් දෙයකට වඩා වැදගත් වන තවත් ක්‍රියාකාරකමක් වේ.

ඔබ සවේතනිකවම නිශ්චය කළත් නැතත්, ඔබට ජිවිතයේ ප්‍රමුඛතාවන් ඇත. ඔබ ප්‍රමුඛතාවන් ප්‍රතිස්ථාපනය කරනු ලබන්නේ, ඔබ වටා සිටින අය හෝ අවස්ථාවන් හෝ නිසා ඇතිවන පීඩනයන් මගින් හෝ ජිවිතයේ පුරුදුවලින් හෝ දෙවියන්වහන්සේගේ පරමාර්ථයන් පදනම් කරගෙන ගත් ස්ථිර තිරණයකින් හෝ වේ.

ලූක් 12:16-20 න් පවසන්නේ අනිසි ලෙස තෝරාගත් ප්‍රමුඛතාවන් ඇති මිනිසෙකු පිළිබඳ කතාවකි. මෙම පාඨමාලාවේදී ඔබ මෙම උපමාව පසුව අධ්‍යයනය කරනු ඇත. මෙම කතාවෙන් පෙන්නුම් කෙරෙන්නේ අනිසි ලෙස තෝරාගත් ප්‍රමුඛතාවන් නිසා සෑම විටම වන්දියක් ගෙවීමට සිදුවන බවය.

**ප්‍රතික්‍රියා කිරීමට වඩා ක්‍රියා කිරීමට ඔබට ඉඩ ලැබේ.**

බොහෝ අය අනාගතය වෙනුවෙන් සැලසුම් කිරීමට වඩා වර්තමානයේ ඇති අත්‍යවශ්‍ය දේ වෙනුවෙන් ප්‍රතික්‍රියා දැක්වීමට උත්සුක වෙති. මේ නිසා ප්‍රඥාවන්තව හා පරමාර්ථයක් ඇතිව ක්‍රියා කිරීමට වඩා ප්‍රතික්‍රියා කිරීමට ඔවුන්ට සිදුවී ඇත.

සැලසුමක් නොමැතිව ඔබ කරන දෙය හෝ එය කිරීමට හේතුව හෝ එය කරන ආකාරය හෝ ඔබ නොදනී. ඔබට සැලැස්මක් හෝ පරමාර්ථයක් හෝ නොමැති බැවින්, ඔබට කැපවීමට දෙයක්ද, දෙවියන්වහන්සේ වෙනුවෙන් ඔබගේ ඵලදායිකත්වය ඇගයීමට ක්‍රමයක් ද නොමැත. ඒ නිසා අර්බුධ අවස්ථාවක් ආ විට ඔබ කරන දෙය අත්හැර දැමීමට ඔබ පහසුවෙන්ම පෙළඹේ. සැලසුම්කිරීම මගින් ආගාව ක්‍රියාවටත් දර්ශනය, යථාර්ථයක් බවටත් පත් වේ. දෙවියන්වහන්සේගේ පරමාර්ථය සාක්ෂාත් කිරීම සහ ඔබ කළ යුතු දෙය හා එය කළ යුතු ආකාරය නිර්ණය කිරීමට එය ඔබට උපකාරී වේ.

**ඔබ ගණන්දීමට සලස්වයි.**

ඔබට සැලැස්මක් ඇති විට, සෙනඟ ඔවුන්ගේ වගකීම දනිති. මේ නිසා ඔව්හු දෙවියන්වහන්සේටත්, අන් අයටත් තමන්ටත් ගණන්දීම සඳහා පෙළඹෙති. ගණන්දීම යනු ඔබට යම් කෙනෙක් පවරා ඇති දෙයක් වෙනුවෙන් ඔබ ඔවුන්ට පිළිතුරු දීම වේ.

මතෙව් 25:14-30 හි ඇති තලෙන්ත පිළිබඳ උපමාවේ දාසයෝ ඔවුන්ගේ ස්වාමියා ඔවුන්ට දෙන ලද තලෙන්ත වෙනුවෙන් ගණන් දිය යුතු වූහ. ඔවුන්ගේ ස්වාමියාට සැලැස්මක් තිබිණි. එය ඔහු දාසයින්ට සන්නිවේදනය කළේය. ඒ අනුව එය සාක්ෂාත් කිරීම සඳහා ඔවුන්ට නියම කළ පරිදි ඔවුන් ඒ මුදල් ආයෝජනය කළ යුතු විය.

ඔබ ගණන් දිය යුත්තේ ඔබගේ ජීවිතය හා සේවය වෙනුවෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීම පමණක්ම නොවේ. එය ක්‍රියාවට නැංවීම සඳහාද වේ.

**සිය ස්වාමියාගේ අදහස දැනගෙනත්, ඒ අදහස පරිදි කටයුතු සංවිධානය නොකළාවූ ද ක්‍රියා නොකළාවූ ද දාසයා බොහෝ පහර ලබන්නේය (ලූක් 12:47).**

**ඇගයීමට ඉඩ දෙයි.**

ඔබ දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා සැලැස්ම සාක්ෂාත් කර ඇත්දැයි බැලීම සඳහා ඇගයීමට, සැලසුම් කිරීම නිසා ඉඩ ලැබේ. ඔබට සැලැස්මක් නැත්නම් ඔබ සාර්ථක ද අසාර්ථකදැයි බලන්නේ කෙසේද? ඔබට පරමාර්ථයක් නොමැති නම් යමක් ඉටු වී ඇත්දැයි බලන්නේ කෙසේද?

**ආත්මික සම්පත් ප්‍රඥාවන්තව භාවිත කිරීමට ඉඩ දෙයි.**

නියමාකාරයෙන් ආත්මික සම්පත් කළමණාකරනය කිරීමටද, අරමුදල්, ද්‍රව්‍යමය දේ, සෙනඟ, ආත්මික දීමනා හා දේව රාජ්‍යයේ වැඩ කිරීම සඳහා කැඳවීම ප්‍රඥාවන්තව භාවිත කිරීමට ද සැලසුම් කිරීම ඔබට උපකාරී වෙනු ඇත.

**විවෘත දොරවලින් ඇතුළුවීමට ඔබව සූදානම් කරයි.**

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟට දොරවල් විවෘත කරන සේක.

**... කිසිවෙකුට වැසිය නොහැකි විවෘත දොරක් මම ඔබ ඉදිරියෙහි තැබුවෙමි (එළිදරව් 3:8).**

දෙවියන්වහන්සේ දොරවල් විවෘත කරන විට ඒ තුළින් යෑමට සූදානම්ව සිටීම අවශ්‍යය. කලින් සූදානම් නොවී මෙය කළ හැකි දෙයක් නොවේ. මතෙව් 25:1-13 හි නුවණ ඇති හා නුවණ නැති යුවතියන් පිළිබඳ උපමාව කියවන්න. දෙවියන්වහන්සේ දොරවල් විවෘත කරන අතර ඒවා සදහටම විවෘතව නොතබනු ඇත. ඒවා විවෘතව ඔබ ඇතුළුවන තුරු බලා සිටී. ඉන්පසු ඇතැම් විට නැවත කිසිදු දිනෙක විවෘත නොවීමට ඒවා වැසේ.

**ඔබගේ කැමැත්ත දෙවියන්වහන්සේගේ කැමැත්ත හා සුසංගත කරන්න.**

හැරීමෙන් පසු ප්‍රේරිත වූ පාවුලුගේ පළමුවන ප්‍රශ්නය වූයේ "මා කවරක් කිරීම ඔබවහන්සේට අවශ්‍යද?" යන්නය. එනම් ඔහු දෙවියන්වහන්සේගෙන් අසන ලද්දේ "මාගේ ජීවිතයට හා සේවය සඳහා ඔබ වහන්සේගේ සැලැස්ම කවරක්ද?" යන්න වේ. ඔබගේ කැමැත්ත දෙවියන්වහන්සේගේ කැමැත්ත හා අනුකූල වූ විට ඔබ සාර්ථක වන්නෙහිය (මාක් 14:36 හා ලූක් 5:11 බලන්න).

## සැලසුම් කිරීමට විරුද්ධවීම

ඔබ මෙම පාඨමාලාවෙන් ඉගෙන ගන්නා "අරමුණු මගින් කළමණාකරන" මූලධර්ම භාවිත කරන විට, අන් අය ඔබට විරුද්ධවීමට ඉඩ තිබේ. සේවයේදී සැලසුම් කරණයට හා කළමණාකරනයට ඇතැම් අය විරුද්ධවීමේ පොදු හේතු කීපයක් පහත දැක්වේ.

### දැනුමේ ඌනතාවය

ඇතැම් අය ඥාණාන්විතව සැලසුම් කිරීම හා කළමණාකරනය නොකරන්නේ ඔවුන් එසේ කිරීමට නොදන්නා බැවිනි. මෙම පාඨමාලාවෙන් ඔබ කළමණාකරනය පිළිබඳව ඉගෙන ගන්නෙහිය. ඉන් ඔබගේ සේවයට යහපත් වනවා පමණක් නොව ඔබ මේ පිළිබඳව අන් අයට උපකාර කිරීමට ද ඔබට හැකිවනු ඇත.

### පරමාර්ථයේ ඌනතාව

මිනිසුන් දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ ඔවුන්ගේ සුවිශේෂී පරමාර්ථය නොදන්නා විට, සැලසුම් කිරීම අපහසු වේ. ඔබට යම් දෙයක් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය නම් පළමුවෙන්ම ඔබට ඇති පරමාර්ථය ඔබ දත යුතුය. මෙම පාඨමාලාවෙන් ඔබ, දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ පරමාර්ථයත් උන්වහන්සේගේ සැලැස්ම තුළ ඔබගේ සුවිශේෂී පරමාර්ථයත් ඉගෙන ගන්නවා ඇත. ඔබ මේ දේ අවබෝධ කරගත් විට එය අන් අයට සන්නිවේදනය කිරීමටත්, දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ ඔවුන්ගේ කාර්යය හඳුනා ගැනීමට උපකාර කිරීමටත් ඔබට හැකිවනු ඇත.

### එය ශුද්ධ ලියවිල්ලට අනුකූල නොවන බවට ඇති විශ්වාසය

සැලසුම් කිරීම බයිබලයට අනුකූල නොවන්නේ යයි සමහරු විශ්වාස කරති. එහෙත් දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම යටතේ සැලසුම් සකස් කළ පුරුෂයන්ගෙන් හා ස්ත්‍රීන්ගෙන් බයිබලීය වාර්තා පිරී තිබේ. ඔබ මේ පිළිබඳව මෙම පාඩමේ "තව දුරටත් අධ්‍යයනය කිරීම" යන කොටසින් තව දුරටත් ඉගෙන ගනු ඇත.

එමෙන්ම දෙවන පරිච්ජේදයෙන් දෙවියන්වහන්සේ පරමාර්ථයේ හා සැලසුම් කිරීමේ දෙවි කෙනෙකු බවද ඔබ ඉගෙන ගන්නෙහිය. උන්වහන්සේ පුද්ගලයින්ද, ජාතීන්ද, ඉශ්‍රාලයද, ජේසුස්වහන්සේද, ශුද්ධාත්මයාණන්වහන්සේද, සභාවද උන්වහන්සේගේ සැලැස්ම සඳහා යොදාගෙන ඇත. කාලයාගේ ආරම්භයේ සිටම උන්වහන්සේගේ පරමාර්ථය ස්ථාපිත කළ සේක. අද ලෝකය තුළද උන්වහන්සේගේ සැලැස්ම උන්වහන්සේ ක්‍රියාත්මක කරමින් සිටින සේක.

### එය ශුද්ධාත්මයාණන්වහන්සේට අවහිර කරන බවට ඇති විශ්වාසය:

සැලසුම් කිරීම හා සංවිධානය ශුද්ධාත්මයාණන්ගේ නිදහස අවහිර කරන්නේ යයි සමහරු විශ්වාස කරති. මෙය සත්‍යයක් නොවේ. ක්‍රියා 2 හි සඳහන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මහත් වූ වැගිරවීමෙන් ටික කලකට පසු, ශුද්ධාත්මයාණන්වහන්සේ මඟපෙන්වීම යටතේ සැලසුම් කිරීම හා සංවිධානය ඇරඹිණි (ක්‍රියා 6).

සේවය සඳහා කෙරෙන සංවිධානාත්මක සැලසුම් කිරීම ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිදහසට කෙසේවත් අවහිර නොකෙරේ. එය ස්වාමීන්වහන්සේගේ මඟපෙන්වීමට ඔබ වඩ වඩාත් සංවේදී කෙරේ. මක්නිසාද ඔබ උන්වහන්සේගේ පරමාර්ථයන් හා සැලසුම් සෙවීමට සචේතනිකවම තීරණ ගන්නා බැවිනි.

සැලසුම් කිරීම නමස්කාර ක්‍රමයක් විය හැකිය. එය දෙවියන්වහන්සේගේ පරමාර්ථයන් හා සැලසුම් දෙස නැවත හැරී බැලීමේ කාලයක් සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ මාර්ගෝපදේශනයට ඔබගේ ආත්මය විවෘත කිරීමක් වේ. ශුද්ධාත්මයාණන් වහන්සේට දෙවියන්වහන්සේගේ මනස ඇති බැවින්

ද දෙවියන්වහන්සේගේ සැලසුම් හා පරමාර්ථයන් ඔබට එළිදරව් කරන බැවින් ද උන්වහන්සේ ඔබගේ හදවත හා ආත්මය පරීක්ෂා කර බලනු ඇත. ඔබ යාච්ඤා කරන විටද, දේව වචනය අධ්‍යයනය කරන විට සහ ශුද්ධාත්මයාණන්ගේ ආභාෂය යටතේ සැලසුම් කරන විටද, සැලසුම් කිරීම ආත්මික ක්‍රියාකාරකමක් වේ. එය ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාවනට අවහිර නොකරයි.

ජෝෂුවා 8 හි සඳහන් අයි නගරය පිළිබඳ ජෝෂුවාගේ සැලැසුම මීට හොඳ උදාහරණයකි. ජෝෂුවාට සැලැස්මක් තිබූ අතර (4 පදය) එය දෙවියන්වහන්සේගේ හාස්කමේ ක්‍රියාවනට අවහිරයක් නොවීය (18 පදය). ස්වභාවික සැලසුම් කිරීම්ද අධිස්වාභාවික ක්‍රියාවන්ද සාගතභාවයෙන් යුතුව එකට ක්‍රියා කරයි.

**සම්ප්‍රදායන්:**

ඔබ යම් ආකාරයක වෙනස් දෙයක් කිරීමට උත්සාහ ගන්නා සෑම විටම සම්ප්‍රදායන් හා බැඳී ඇති අයගෙන් විරෝධතාවන් පැන නගිනු ඇත. ඔවුන්ට වෙනසක් අවශ්‍ය නැත. ඔවුන් සමහර දේ බොහෝ කලක් එක්තරා ක්‍රමයකට කිරීමට පුරුදු වී ඇති අතර දැන් එය සම්ප්‍රදායක් වී තිබේ. ජේසුස්වහන්සේටද මෙම ගැටලුව පරිසිවරුන්ගෙන් හා විනයධරයන්ගෙන් තිබිණි.

ඇතැම්විට මේ "සම්ප්‍රදායික" පුද්ගලයන්ව ධනාත්මක වෙනසක් කරා ගෙන යා හැකිය. අනෙක් අවස්ථාවල ඔබට ජේසුස්වහන්සේ පැවසුවාක් මෙන් "නව මිදියුෂ පරණ බඳුන් වලට" වත් කළ නොහැකිය. එවිට දෙවියන්වහන්සේගේ සැලැස්මට ඇතුළු වීමට කැමති නව ඇදහිලිවතුන් බිහි කිරීම අවශ්‍ය වේ.

සම්ප්‍රදායන් වලින් බැඳී අය ගැළවීම නොලද්දවුන් හෝ ක්‍රිස්තුන්වහන්සේගේ ශරීරයේ කොටස්කරුවන් නොවන්නන් හෝ බව මින් අදහස් නොකෙරේ. ඔවුහු ස්වාමින්වහන්සේ තුළ අපගේ සහෝදර සහෝදරියන් වෙති. අප ඔවුන්ට හැකි පමණ උපකාර කළ යුතුය. ප්‍රේම කළ යුතුය. එහෙත් ඔවුන් ශුද්ධාත්මයාණන්ගේ මඟපෙන්වීම යටතේ අලුත් දේ සොයමින් ඉදිරියට නොයා මිනිසුන්ගේ සම්ප්‍රදායන්ට බැඳී සිටීම තෝරා ගෙන ඇත. ජේසුස්වහන්සේත් පාවුලුතුමාත් යන දෙදෙනාම දේවමාලිගාවේ සහ සිනගෝගවල ඔවුන්ට ඉඩ දෙන ලද ප්‍රමාණය අනුව සේවයෙහි යෙදුනාහ. මේවා එකල නමස්කාරය සඳහා භාවිත කළ "සම්ප්‍රදායික" ස්ථාන විය. එහෙත් සම්ප්‍රදාය නිසා ඔවුන්ව ප්‍රතික්ෂේප කළ බැවින්, ඔවුන්ගේ පණිවුඩය විවෘතව පිළිගන්නා අලුත් ඇදහිලිවතුන් වෙත එය ගෙන යෑමට ඔවුන්ට සිදුවිය.

**අනාගතය ගැන බියවීම**

සැලසුම් කිරීම අනාගතය සඳහා වේ. ඇතැමුන් අනාගතයට බිය බැවින් ඒ ගැන සිතීමට හෝ සැලසුම් කිරීමට හෝ කැමති නැත. එහෙත් දෙවියන්වහන්සේ අනාගතය පාලනය කරන බැවින් ඔබ බිය විය යුතු නැත. ඔබ සඳහා ඇති දෙවියන්වහන්සේගේ සැලසුම උන්වහන්සේ දැනටමත් දන්නා සේක. ඔබ සැලසුම් කිරීමේදී කරනු ලබන්නේ උන්වහන්සේගේ සැලැස්ම ඔබට එළිදරව් කරන මෙන් අයැදීම වේ.

**නුඹලාගේ සෞභාග්‍ය පිණිස මිස විපත්තිය පිණිස නොවන, නුඹලාගේ අනාගත බලාපොරොත්තු මුදුන් පමුණුවා දෙන මාගේ යෝජනා මම හොඳින් දනිමි. මෙසේ පවසන්නේ ස්වාමින් වන මමය (ජෙරමියා 29:11).**

**අලසකම**

ඇතැමුන් සැලසුම් කිරීම හා සංවිධානය කිරීම නොකරන්නේ ඊට කාලය අවශ්‍ය නිසා හා එය අසිරු කාර්යයක් නිසා වේ. ඔවුහු අලසයෝ වෙති. අලසකම යනු නොසැලකීම හා කම්මැලි වීම වේ. අලසයාගේ කෙත (වැඩ) ගැන හිතෝපදේශ 24:30-34 හි විස්තර කර ඇත. ඉන් ආත්මික අස්වැන්නක් නොලැබේ.

**අසාර්ථකවීමේ බිය**

මතෙව් 25:14-30 හි සඳහන් අවිශ්වාසී දාසයා, අසාර්ථක වීම ගැන බිය විය. එබැවින් ඔහු ඔහුගේ ස්වාමියා විසින් ඔහුට දෙන ලද දෙය භාවිත කිරීමට උත්සාහයක් ගත්තේ නැත (25 පදය බලන්න).

ඔබ අසාර්ථක වන එකම අවස්ථාව, උත්සාහ කිරීම නැවැත්වූ විට වේ. එක්සත් ජනපදයේ සිටි ශ්‍රේෂ්ඨ විද්‍යාඥයෙකු වූ තෝමස් එඩිසන්, විදුලිය සොයා ගැනීමට පෙර ගත් උත්සාහයන් වලින් සියයකට වඩා අසාර්ථක විය. එහෙත් ඔහු උත්සාහයන් නොනැවැත්වූ බැවින් සාර්ථක ඵල නෙලා ගත්තේය. ඔහු අවසානයේ විදුලිය නිපදවීමට සමත් විය.

උත්සාහයන් නොනැවැත්වූ නිසා, දෙවියන්වහන්සේ වෙනුවෙන් සාර්ථක වූ ශ්‍රේෂ්ඨ පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ කතාවලින් බයිබලිය වාර්තා පිරී පවතී.

සැබවින්ම ඔබ සැලසුම් කිරීමට අසමත් වූ විට, අසමත්වීමට සැලසුම් කළා හා සමාන වේ.

## ස්වයං පරීක්ෂණ

1. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න

2. "අරමුණු මගින් කළමණාකරනය" යන්න පැහැදිලි කරන්න.

3. අරමුණු මගින් කළමණාකරනය වැදගත්වීමේ හේතු කිපයක් ලැයිස්තුගත කරන්න.

4. සැලසුම් කිරීම පිළිබඳව ඔබට මුහුණ දීමට සිදුවිය හැකි විරෝධතා වර්ග සාරාංශ කරන්න. ඒවා ගැන ඔබ කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සඳහන්ව ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

1. සැලසුම් කිරීම පිළිබඳ බයිබලයේ ඇති උදාහරණ කිපයක් මෙහි දැක්වේ.

   - උත්පත්ති 1-3, දෙවියන්වහන්සේ මුළු මැවිල්ල සැලසුම් කළ සේක. මිනිසා සඳහා සැලසුම් සකස් කර, උන්වහන්සේගේ ගැළවීමේ සැලැස්ම එළිදරව් කළ සේක.

   - නෝවා නැව සෑදිම සඳහා සැලසුම් සකස් කළේය. උත්පත්ති 6

   - ආබ්‍රහම් තම දාසයා වන එලිසාර්ට අරමුණු සැකසිය. උත්පත්ති 24

   - සාගත කාලය සඳහා ජෝසෙප් සැලසුම් කළේය. උත්පත්ති 41

   - ඉශ්රායෙල් සෙනඟ වහල් භාවයෙන් මුදවා ගැනිමට මෝසෙස්ට සැලැස්මක් දෙන ලදී. නික්මයාම 3-6

   - කූඩාරම පිළිබඳ සැලැස්ම විස්තරාත්මකය. නික්මයාම 24:12-40:38

   - ගණන් කථාවේ, සෙනඟ ගණන් කිරීම සඳහාත් (1:1-54) කඳවුර පිළියෙල කිරීම සඳහාත් සැලසුම් අපට දැකගත හැකිය (2:1-34).

   - පොරොන්දු දේශය අල්ලාගෙන එය බෙදා ගැනිම සඳහා ජොෂුවා ඉශ්රාලයට මඟපෙන්වීම පිණිස විස්තරාත්මක සැලසුම් සකස් කළේය. ජොෂුවාගේ පොත.

   - දෙවියන්වහන්සේ ක්‍රියාත්මක කළ ගැළවීමේ සැලසුම් ගණනාවක් විනිශ්චයකාරයාගේ පොතේ ඇත.

   - බෝවස් සඳහා රූත්, නයෝමිගේ සැලැස්ම අනුගමනය කළාය. රූත්ගේ පොත

   - යෝධයා මැරීමට දාවිත් සූදානම් විය. 1 සාමුවෙල් 17

   - ඉශ්රාලය එක්සත් කිරීමේ සැලැස්මක් හෙසකියා රජු සකස් කළේය. තවද දේවමාලිගාව ප්‍රතිසංස්කරණය කිරීමටත් ජෙරුසලමට ජල පද්ධතියක් සකස් කිරීමටත් ඔහු සැලසුම් කළේය. 2 ලේකම් 28-31¦ 2 රාජාවලිය 16-20

   - පවුර නැවත ගොඩනැංවීමට නෙහෙමියා සැලසුම් සකස් කළේය. නෙහෙමියා පොත

   - පැරණි ගිවිසුමේ දිවැසිවරු ජාතින් වෙනුවෙන් දෙවියන්වහන්සේගේ සැලසුම් එළිදරව් කළහ.

   - ජේසුස්වහන්සේ: විසින් තම ජිවිතය හා සේවය සඳහා දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම පිණිස කරන ලද තමන්වහන්සේගේ පරමාර්ථයන් හා සැලසුම් පිළිබඳ ප්‍රකාශවලින් ශුභාරංචි පිරී තිබේ. ජේසුස්වහන්සේ මේ පරමාර්ථයන් හා සැලසුම් උන්වහන්සේගේ අනුගාමිකයන්ටත් පොදුවේ සියලු ඇදහිලිවතුන්ටත් සන්නිවේදනය කළ සේක.

   - ප්‍රේරිතවූ පාවුලුතුමා සැලසුම් සකස් කළේය. ඔහුට සැලසුම් නොතිබුණේ නම් ක්‍රියා 16:6-10 හි දක්වා ඇති පරිදි ශුද්ධාත්මයාණන්වහන්සේට ඒවා වෙනස් කළ නොහැකිය.

   - එළිදරව් පොත අනාගතය සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලසුම් එළිදක්වයි.

2. සැලසුම් කිරීම පිළිබඳව හිතෝපදේශ පොත කියවන්න. 13:16; 14:8; 15:22; 16:3,9; 24:3-4; 29:18 බලන්න.

3. මෙම පරිච්ඡේදයේ අවධාරණය කර ඇති පරිදි අප අධ්‍යයනය කරන්නාවූ සැලසුම් කිරීම, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආභාෂය යටතේ කෙරෙන සැලසුම් කිරීමක් වේ. එය ලෝකයා

සැලසුම් කරන්නාක් මෙන් කෙරෙන සැලසුමක් නොවේ. මාර්ගෝපදේශනය සඳහා ලෝකයේ සංවිධාන දෙස ඔබ බලන්නේ නැත.

එවැනි ලෞකික සැලසුම් කිරීම් පිළිබඳව බයිබලයේ සඳහන් අනතුරු ඇඟවීම් දෙස බලන්න.

**සමිඳුණෝ මෙසේ වදාළ සේක. ජුදා දේශය පාලනය කරන අය මට විරුද්ධව කැරළි ගසන බැවින් ඔවුන්ට වන විපතක මහත! ඔවුහු පව් පිට පව් කරමින් මා නොකළ සැලසුම අනුගමනය කරති. මාගේ කැමැත්තට විරුද්ධව ගිවිසුම්වලට අත්සන් කරති.**

**මාගෙන් උපදෙස් නොගෙන ඔවුහු උපකාර ලබන පිණිස මිසරයට යති. ඔවුන් මිසරයේ ආරක්ෂාව පතන නිසා එහි රජවරුන්ගේ රැකවරණය කෙරෙහි ඔවුහු විශ්වාසය තබති. (යෙසායා 30:1-2)**

4. 2 රාජාවලිය 4:1-7 හි සඳහන් එලිෂා සහ තෙල් වැඩි කිරීමේ හාස්කම පිළිබඳ කතාව කියවන්න. ස්ත්‍රිය සකස් කළ සියලුම භාජන පිරෙන තෙක් දෙවියන්වහන්සේ තෙල් වැඩි කළ සේක. ඇය භාජන සූදානම් නොකළේ නම් කුමක් සිදුවේද? අගනා තෙල් නැති වී යන්නට ඉඩ තිබිණි. නැතහොත් ඇය එය ලබා ගැනීමට සූදානම් නැති නිසා දෙවියන්වහන්සේ එය වැඩි නොකරන්නට වුවද ඉඩ තිබිණි.

   අප සූදානම් නම්, දෙවියන්වහන්සේ උන් වහන්සේගේ ආශිර්වාද අපගේ ජීවිතවලට හා සේවයට වගුරුවන සේක.

# දෙවන පරිච්ඡේදය

## පරමාර්ථයේ දෙවියන්වහන්සේ

**අරමුණු**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- දෙවියන්වහන්සේගේ දිව්‍යමය පරමාර්ථය පැහැදිලි කිරීමට
- දෙවියන්වහන්සේගේ පරමාර්ථ සහ සැලසුම් අවබෝධ කරගැනීමේ වැදගත්කම පැහැදිලි කිරීමට
- දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පරමාර්ථයන් හා සැලසුම් සාක්ෂාත් කරගන්නා උපකරණ හඳුනාගැනීමට
- ජේසුස්වහන්සේගේ සේවය දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් වලට සම්බන්ධ වී ඇති ආකාරය පැහැදිලි කිරීමට
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් අතර බැඳීම පැහැදිලි කිරීමට
- සභාවේ සේවය සහ දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් අතර බැඳීම පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **උන්වහන්සේගේ කැමැත්තේ අබිරහස අපට දන්වා වදාළ සේක. එසේ කරන ලද්දේ, තමන්වහන්සේ ක්‍රිස්තුන්වහන්සේ තුළ සිය කැමැත්තෙන් නියම කරගත් ස්වකීය අභිප්‍රාය අනුවය.**
>
> **දෙවියන්වහන්සේගේ ඒ අභිප්‍රාය නම්, නියමිත කාලයේදී ස්වර්ගයෙහිද පොළොවෙහිද එනම්, මුළු විශ්වයෙහි ඇති සියල්ල ක්‍රිස්තුන්වහන්සේ යටතේ එක්සත් කිරීමය (එපී. 1: 9-10).**

**හැඳින්වීම**

දෙවියන්වහන්සේ පරමාර්ථයේ හා සැලසුම් කිරීමේ දෙවි කෙනෙකි. උන්වහන්සේ සූදානම් වීමේ දෙවි කෙනෙකි. අප දැන් දන්නා පරිදි ආරම්භයේ සිටම දෙවියන්වහන්සේ ලෝකය සඳහා වූ උන්වහන්සේගේ පරමාර්ථ සාක්ෂාත් කිරීම සඳහා සූදානම්ව සිටිමින් ක්‍රියාත්මක වූ සේක.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා භාවිත කරන උපකරණය මනුෂ්‍යයන් වේ. උන්වහන්සේ පුද්ගලයන් මගින්ද ජාතීන් මගින්ද උන්වහන්සේගේ ආත්මික ශරීරය වන ස්වාමී වූ ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ සභාව මගින්ද ක්‍රියා කරන සේක. තමන්ගේ ජීවිත පරමාර්ථ හා සේවා සැලසුම් උන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් සමඟ අනුකූල වන ස්ථානයට ගෙනෙන්නාවූ අය දෙවියන්වහන්සේ විශේෂයෙන් ආලේප කර භාවිත කරන සේක.

දෙවියන්වහන්සේගේ පරමාර්ථ ඔබ අවබෝධ කර නොගන්නෙහි නම්, ඔබ උන්වහන්සේගේ සැලැස්ම හා අනුකූල නොවේ. බොහෝ සේවයන් අසාර්ථක වන්නේ මේ නිසාය. මෙම පාඩමෙන් ඔබ සැලසුම් කිරීම පිළිබඳ බයිබලීය පදනම ගවේෂණය කරන අතර දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ට පරමාර්ථය ඉගෙන ගන්නෙහිය. එවිට ඔබට ඔබගේ ම පරමාර්ථ හැඳින ගන්නටත් දෙවියන්වහන්සේගේ සැලසුම් සමඟ අනුකූල සැලසුම් සකස් කරන්නටත් හැකිවනු ඇත.

**සූදානම්වීමේ දෙවියන්වහන්සේ**

දෙවියන්වහන්සේ සැලසුම් කිරීමේ දෙවි කෙනෙකි. පහත දැක්වෙන යොමු කිරීම් ඇසුරෙන් මෙය අධ්‍යයනය කරන්න:

- දෙවියන්වහන්සේ ස්වර්ගය, උන්වහන්සේගේම නවාතැන; උන්වහන්සේගේ සිංහාසනය හා රාජ්‍යය සූදානම් කළ සේක: ගීතාවලිය 103:19; හිතෝපදේශ 8:27.

- උන්වහන්සේ මෙම ලෝකය මනුෂ්‍ය වර්ගයා සඳහා සූදානම් කළ සේක: උත්පත්ති 1-3.

- දෙවියන්වහන්සේට උන්වහන්සේගේ අභිප්‍රාය අනුව ඕනෑම දෙයක් සූදානම් කර භාවිත කළ හැකිය. ජෝනාගේ පොතේ පමණක් දෙවියන්වහන්සේ මාළුවෙක්, ලබු ගෙඩියක් හා පණුවෙක් සූදානම් කර භාවිත කළ සේක: ජෝනා 1-4.

- සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපයන් සඳහා පූජා වීමට දෙවියන්වහන්සේ, ජේසුස්වහන්සේ සූදානම් කළ සේක: හෙබ්‍රෙව් 5:10; ශෙපනියා 1:7.

- ජේසුස්වහන්සේ සේවයට පැමිණීමට පෙර, ජොහන් නම් වූ මිනිසෙක් මාර්ගය සූදානම් කිරීම සඳහා උන්වහන්සේට පෙර එවූ සේක: ලූක් 1:76, 3:4.

- සදාතනයේ දිගටම ජීවත් වීම සඳහා අලංකාර සදාතනික නගරයක් දෙවියන්වහන්සේ සූදානම් කර ඇත: හෙබ්‍රෙව් 11:16.

- අපත් කොටස්කාරයන් වන රාජ්‍යයක් උන්වහන්සේ සූදානම් කර ඇත: මතෙව් 25:34.

- අපට ස්ථානයක් සූදානම් කරන පිණිස උන්වහන්සේ යන බව ජේසුස් වහන්සේ පැවසූ සේක: ජොහන් 14:2-3.

- දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නන් හට උන්වහන්සේ සූදානම් කර ඇත්තේ කිසිවෙකු කවරදාවත් ඇසින් නුදුටු, කණින් නොඇසූ, සිතින් නොසිතූ දෙයක් බව අපට පවසා තිබේ: 1 කොරින්ති 2:9.

- නොඇදහිලිවතුන්ට දෙවියන්වහන්සේ විනිශ්චය සූදානම් කර ඇත: හිතෝපදේශ 19:29.

- යක්ෂයාට හා ඔහුගේ දූතයන්ට නිරය සූදානම් කර ඇත: මතෙව් 25:41.

- දෙවියන්වහන්සේ සොයන්නේ තමාගේ ස්වාමි පුරුෂයාට සරසන ලද මනාලියක මෙන් සූදානම් කරනු ලැබූ අය වේ. එළිදරව්ව 21:2.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වැඩ සඳහා යොදා ගනු ලැබුවේ සූදානම් සෙනඟක් බව බයිබලිය වාර්තාවල සඳහන් වේ. මේ බව පහත දැක්වෙන යොමු කිරීම් වලින් පෙනේ:

- ඇදහිල්ල කරණකොටගෙන නෝවා නැවක් සෑදුවේය: හෙබ්‍රෙව් 11:7.

- පරීක්ෂාවන් හා විපත්ති මගින් සූදානම් කළ ජෝසෙප්, සාගතයෙන් ජාතිය බේරා ගත්තේය: උත්පත්ති 41.

- කාන්තාරයේ හුදකලා ස්ථානයක සූදානම් කරන ලද මෝසෙස්, පාළුකරය මුළුල්ලේම මුළු ජාතියටම මඟ පෙන්වූයේය: නික්මයාම පොත.

- එස්තර් භෝජන සංග්‍රහයක් සූදානම් කර ජාතියක් සම්පූර්ණයෙන්ම බේරා ගත්තාය: එස්තර් 7.

- ගිඩියොන් හමුදාවක් සූදානම් කළේය. විපත්ති හා කරදර මැද්දේ වුවද දාවිත් දේවමාළිගාව ගොඩනැගීමට සූදානම් විය. සොලමොන් දේවමාලිගාවක් සූදානම් කළේය. නෙහෙමියා පවුරක් සූදානම් කළේය.

- ස්නාවක ජොහන් ස්වාමින්වහන්සේ සඳහා සෙනඟක් සූදානම් කළේය: ලූක් 1:17.

- ස්වාමින්වහන්සේ ඉදිරියේ තම හදවත් නියමාකාරයෙන් සූදානම් කර නොගත් බැවින් අසාර්ථක වී නපුරු දේ කළ බොහෝ නායකයන් පිළිබඳ දීර්ඝ වාර්තා විනිශ්චයකාරයාගේ පොතේ හා ලේකම් පොතේ සඳහන් වේ. (2 ලේකම් 12:14 එක් නිදසුනකි)

දෙවියන්වහන්සේ සූදානම් සෙනඟ භාවිත කරන සේක. එබැවින් අපට සූදානම්ව සිටින සේ අණ කර ඇත:

- දෙවියන්වහන්සේ සම්මුඛ වීමට සූදානම් වන්න: ආමොස් 4:12

- ස්වාමින්වහන්සේ සඳහා ඔබේ හදවත් සූදානම් කර ගන්න: 1 සාමුවෙල් 7:3

- සූදානම් කරගත් හදවතක් ඇතිව සිටින්න: 2 ලේකම් 19:3

- ස්වාමින්වහන්සේ සෙවීමට ඔබගේ හදවත් සූදානම් කරගන්න: 2 ලේකම් 27:6

- ඔබද සූදානම් වන්න. අන් අයවද සූදානම් කරන්න: එසකියෙල් 38:7

- සෑම යහපත් වැඩකටම සූදානම්ව සිටින්න. ස්වාමියාගේ වැඩට සූදානම් වන්න: 2 තිමෝති 2:21

- උන්වහන්සේගේ මහිමය සඳහා සූදානම් වූ භාජනයක් වන්න: රෝම 9:23

දෙවියන්වහන්සේ සූදානම් වීමේ දෙවිකෙනෙකි. උන්වහන්සේ සූදානම් වූ සෙනඟ තුළින් ක්‍රියා කරන සේක. උන්වහන්සේ සූදානමක් නැති, පෙළඹවීමක් නැති, ක්‍රියාශීලි නුවූ පරාජය වූ ඇදහිලිවතුන් සොයන්නේ නැත. උන්වහන්සේ සොයන්නේ සූදානම් වූ පුරුෂයින් හා ස්ත්‍රීන් වේ. ස්වාමින්වහන්සේගේ කැමැත්ත දැනගෙනත් එය ඉටු කිරීමට සූදානම් නුවූ දාසයෙකු ගැන උපමාවක් ජේසුස්වහන්සේ පැවසූ සේක.

> **සිය ස්වාමියාගේ අදහස දැනගෙනත්, ඒ අදහස පරිදි කටයුතු සංවිධානය නොකළාවූද ක්‍රියා නොකළාවූද දාසයා බොහෝ පහර ලබන්නේය. (ලූක් 12:47)**

සූදානම් වීම පිළිබඳව දෙවියන්වහන්සේ මෙතරම් උද්යෝගයක් දක්වන්නේ මන්ද? උන්වහන්සේ සෙනඟ භාවිත කරන්නේත්, ආලේප කරන්නේත් මන්ද? අප සූදානම්ව ඇත්තේ කුමකටද?

### පරමාර්ථයේ දෙවියන්වහන්සේ

දෙවියන්වහන්සේගේ සියලු සූදානම් වීම් උන්වහන්සේගේ පරමාර්ථ කෙරෙහි යොමු කෙරිනි. එය අවිනිශ්චිත පරමාර්ථයක් හෝ “බලාපොරොත්තු වන්නාවූ” පරමාර්ථයක් හෝ නොවේ. උන්වහන්සේ සුවිශේෂී, තහවුරු කළ පරමාර්ථයක් වෙනුවෙන් ක්‍රියා කරන සේක. දෙවියන්වහන්සේගේ පරමාර්ථය උන්වහන්සේගේ වචනයෙන් පැහැදිලිව සන්නිවේදනය කෙරේ. ඇතැම්විට උන්වහන්සේගේ පරමාර්ථ පිළිබඳ ඉතා හොඳ සාරාංශයක් එපීස පොතේ දී ඇත. දෙවියන්වහන්සේගේ “පරමාර්ථ පිළිබඳ ප්‍රකාශනය” මෙසේ වේ:

> **... අපගේ ස්වාමින් වන ක්‍රිස්තුස් ජේසුස්වහන්සේ තුළින් උන්වහන්සේ ඉටු කළ ස්වකීය සදාකාලික අභිප්‍රායට අනුකූලවය.**
>
> **උන්වහන්සේගේ කැමැත්තේ අබිරහස අපට දන්වා වදාළ සේක. එසේ කරන ලද්දේ, තමන්වහන්සේ ක්‍රිස්තුන්වහන්සේ තුළ සිය කැමැත්තෙන් නියම කරගත් ස්වකීය අභිප්‍රායට අනුවය.**
>
> **දෙවියන්වහන්සේගේ ඒ අභිප්‍රාය නම්, නියමිත කාලයේ ස්වර්ගයෙහිද පොළොවෙහිද එනම් මුළු විශ්වයෙහි ඇති සියල්ල ක්‍රිස්තුන්වහන්සේ යටතේ එක්සත් කිරීමය. (එපීස 3:11, 1:9-10)**

සියලුම මනුෂ්‍යයින් තමන්වහන්සේ සමඟ නිවැරදි සබඳතාවකට ගෙන ඒමට දෙවියන්වහන්සේට අවශ්‍යය.

> **පමාවී ඇතැයි සමහරුන් සිතන නුමුත්, ස්වාමින්වහන්සේ සිය පොරොන්දු ඉටු කිරීමට පමා වී නැත. එහෙත්, කිසිවකු විනාශ වීම උන්වහන්සේගේ කැමැත්ත නොවන බැවින් සියල්ලන්ට මනස්ථාපනය සඳහා අවස්ථාවක් ලැබෙනු පිණිස උන්වහන්සේ ඔබ ගැන බොහෝ කල් ඉවසන සේක. (2 පේදුරු 3:9)**

දෙවියන්වහන්සේගේ පරමාර්ථය වන්නේ ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ තුළින් සියලු දෙනාම පාප කමාව අත්දැක, උන්වහන්සේ සමඟ නිවැරදි සබඳතාවකට පැමිණ දේව රාජ්‍යයේ කොටස්කරුවන් වීම වේ. (ජොහන් 3)

දෙවියන්වහන්සේ ස්ත්‍රීන් හා පුරුෂයින් සුදානම් කර උන්වහන්සේගේ අභිප්‍රායන් සාක්ෂාත් කරගැනීමට ඔවුන් යොදා ගන්නා සේක. උන්වහන්සේ, විශේෂයෙන්ම තම ජීවිත පරමාර්ථ හා සේවා සැලසුම් උන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් සමඟ අනුරූප වන අය ආලේප කර භාවිත කරන සේක. ඔබ දෙවියන්වහන්සේගේ පරමාර්ථ අවබෝධ කර නොගන්නෙහි නම්, ඔබගේ ජීවිතය හා සේවය උන්වහන්සේගේ සැලැස්ම සමඟ අනුරූප නොවනු ඇත.

නිදසුනක් වශයෙන්, ජේසුස් වහන්සේ, තමන් වහන්සේ දුක් විඳ මරණයට පත්වන බව තම ශ්‍රාවකයන්ට එළිදරව් කළ විට පේදුරුතුමා උන්වහන්සේට තරවටු කළේය. පේදුරුතුමා දෙවියන්වහන්සේගේ පරමාර්ථ අවබෝධ කරගත්තේ නැත. එබැවින් ඔහු දෙවියන්වහන්සේගේ සැලසුම් සමඟ අනුරූප නොවීය. ජේසුස්වහන්සේ ඔහුට තරවටුකොට මෙසේ පැවසූ සේක:

> **සාතන් අහක්ව යව, නුඹ සිතන්නේ මිනිසුන් සිතන විධියට මිස දෙවියන්වහන්සේ සිතන විධියට නොවේ. (මාක් 8:33)**

දාවිත් රජතුමා දෙවියන්වහන්සේගේ පරමාර්ථ සමඟ අනුරූපව සිටි මනුෂ්‍යයෙකි:

> **දාවිත් දෙවියන්වහන්සේගේ අභිප්‍රාය ලෙස සිය පරම්පරාවේදී මෙහෙ කළ පසු මරණයට පත්ව තමාගේ පියවරුන් අතර තැන්පත් කරනු ලැබ, අභාවයට පත්විය. (ක්‍රියා 13:36)**

දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් සාක්ෂාත් වන බවට බයිබලය සහතික වේ:

> **සියලු බලැති සමිඳාණන්වහන්සේ මෙසේ දිවුරා ඇත. මා අදහස් කළ ලෙස සිදුවන්නේය. මා කරන්න අධිෂ්ඨාන කළ දේ කරනු ලබන්නේමය. (යෙසායා 14:24)**
>
> **මුළු පොළොව පිළිබඳ මාගේ තීරණය මෙය වේ. ජාතීන්ට දඬුවම් කරන පිණිස මම මාගේ අත ඔසවාගෙන යමි.**
>
> **සව් බලැති සමිඳුන් මෙසේ කිරීමට අධිෂ්ඨාන කර ඇත. එය නිෂ්ප්‍රභා කරන්නේ කවරෙක්ද? දඬුවම් කිරීමට එතුමන් ස්වකීය හස්තය ඔසවා ඇත. එය නැවැත්විය හැක්කේ කාටද? (යෙසායා 14:26-27)**

## සැලසුම් කිරීමේ දෙවියන්වහන්සේ

දෙවියන්වහන්සේ පරමාර්ථ ස්ථාපිත කර ඇතිවා පමණක් නොව, එම පරමාර්ථය සාක්ෂාත් කරගැනීමට සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කරන සේක. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සැලැස්මේ කොටස්කරුවන් ලෙස පුද්ගලයින්, ජාතින්, ජේසුස්වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේ හා සභාව යොදා ගන්නා සේක.

**පුද්ගලයින්:**

අප දන්නා පරිදි යුගයේ ආරම්භයේ සිටම දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අභිප්‍රායන් සාක්ෂාත් කරගැනීමට පුද්ගලයින් මගින් ක්‍රියා කර ඇත. දෙවියන්වහන්සේ විවිධ පුරුෂයින් හා ස්ත්‍රීන් යොදා ගත් ආකාරය පිළිබඳ කතාවලින් බයිබලය පිරී ඇත.

පැරණි ගිවිසුම් සමයේ දෙවියන්වහන්සේ නෝවා, ආබ්‍රහම්, ජෝසෙප් හා මෝසෙස් වැනි ශ්‍රේෂ්ඨ නායකයින් එසවූ සේක. එමෙන්ම සිය අභිප්‍රායන් සාක්ෂාත් කරගැනීමට දිවැසිවරුන්, රජවරුන් හා විනිශ්චයකාරයන් ආලේප කළ සේක. නව ගිවිසුම් සමයේ දෙවියන්වහන්සේ ස්නාවක ජොහන්, ජේසුස්වහන්සේගේ ශ්‍රාවකයන්, පාවුලු, තිමෝති, බාර්ණබස් හා තව බොහෝ පුද්ගලයන් යොදාගත් සේක.

දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ සැලසුම් හා සමඟ නොගැළපෙන පාපී මිනිසුන් වුවද ගෙන, තමන්වහන්සේගේ අභිප්‍රායන් සාක්ෂාත් කරගැනීම සඳහා ඔවුන්ගේ නපුරු සැලසුම් කණපිට පෙරළූ සේක. ඔවුන්ගේ පාපතර ක්‍රියාවලට හේතුව දෙවියන්වහන්සේ නොවේ. එහෙත් ඒවා තිබියදීත් ඒවා තුළින්, උන්වහන්සේගේ සැලසුම් සාක්ෂාත් කරගැනීමට ක්‍රියා කළ සේක.

නිදසුනක් වශයෙන් මිසරයේ දුෂ්ට පාරාවෝ ගැන දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක:

> **ඔබට මාගේ බලපරාක්‍රමය පෙන්වන පිණිසත්, මාගේ නාමය මුළු ලෝකය පුරා ප්‍රකාශ වන පිණිසත් ඔබට ජීවත් වන්නට ඉඩ හැරියෙමි.** (නික්මයාම 9:16)

ජීවිතය මෙන්ම සේවයද දෙවියන්වහන්සේගේ අභිප්‍රාය හා බැඳී පවතී. අභිප්‍රාය සම්පූර්ණ වූ කල, මෙලොව ජීවිතය අවසන් වේ:

> **දාවිත් දෙවියන්වහන්සේගේ අභිප්‍රාය ලෙස සිය පරම්පරාවේදී මෙහෙ කළ පසු මරණයට පත්ව තමාගේ පියවරුන් අතර තැන්පත් කරනු ලැබ අභාවයට පත්විය.** (ක්‍රියා 13:36)

**ජාතින්:**

පැරණි ගිවිසුම් සමයේ දෙවියන්වහන්සේ, ලෝකයේදී තමන්වහන්සේගේ අභිප්‍රාය හා සැලැස්ම සාක්ෂාත් කරගැනීමට ඉශ්රායෙල් ජාතිය නැගිටවූ සේක. ජාතියක් වශයෙන් ඉශ්රායලයේ පරමාර්ථය වූයේ ලෝකයේ මිථ්‍යා දෘෂ්ටි ජාතින් වෙත දෙවියන්වහන්සේගේ සැලැස්ම එළිදරව් කිරීම වේ. නැවත නැවත මේ වගකීම ඉටු කිරීම පිළිබඳව ඔවුන් අසාර්ථක විය.

මේ නිසා ඉශ්රායලය වටා සිටි මිථ්‍යා දෘෂ්ටි ජාතින් තුළින් ඔවුන් වෙත විනිශ්චය පැමිණියේය. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සැලැස්ම සාක්ෂාත් කරගැනීමට අධිෂ්ඨාන කරගෙන සිටි බැවින් මේ පාපී ජාතින්ගේ නපුරු ක්‍රියාවන් තුළින් වුවද උන්වහන්සේ ක්‍රියා කළසේක. දෙවියන්වහන්සේ මෙම ක්‍රියාවන් අනුමත කළේ නැත. එහෙත් ඒවා තුළින් වුවද ක්‍රියා කළසේක.

**ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ**

වසර ගණනාවක්, දෙවියන්වහන්සේගේ සැලැස්මේ කොටසක් අබිරහසක්ව පැවතිණි. සියලු මනුෂ්‍ය වර්ගයාට පාප කමාව ලබා දීම සඳහා ගැළවුම්කරුවෙකු එවීමට දෙවියන්වහන්සේ ඈත අතීතයේදී පොරොන්දු වූ සේක.

පළමුවෙන්ම මෙම පොරොන්දුව දෙන ලද්දේ ඒදන් උයනේදී ආදම්ට හා ඒවට වේ. ඒ ඔවුන් පාපයට වැටුනු පසුවය. දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක:

> **තා සහ ස්ත්‍රිය අතරද තාගේ වංශය සහ ඈගේ වංශය අතරද බද්ධ වෛරය තබන්නෙමි. ඔහු තගේ හිස පොඩි කරන්නේය. තෝද ඔහුගේ විලුඹ දෂ්ඨ කරන්නෙහිය. (උත්පත්ති 3:15)**

මෙය ගැළවුම්කරුවෙකුගේ පොරොන්දු බොහොමයක ආරම්භය වේ. මෙම සැලැස්ම සාක්ෂාත් කරගන්නා අන්දම බොහෝ කාලයක් යනතුරු දෙවියන්වහන්සේ එළිදරව් කළේ නැත. එය මහත් අබිරහසක් විය.

පසුව, පැරණි ගිවිසුම් දිවැසිවරුන්ගේ කාලයේ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සැලැස්මේ විස්තර එළි දැක්වූ සේක. නව ගිවිසුම් කාලයේ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ඒකජාතක පුත්‍ර, ස්වාමිවූ ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය වෙනුවෙන් දිවි පිදීමට එවීමෙන් එම විස්තරය සම්පූර්ණ කළ සේක.

දෙවියන්වහන්සේගේ සැලැස්ම තවදුරටත් අබිරහසක් නොවීය. උන්වහන්සේගේ සැලැස්ම හා පරමාර්ථය ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ මගින් විවෘතව එළිදරව් වීය:

> **උන්වහන්සේගේ කැමැත්තේ අබිරහස අපට දන්වා වදාළ සේක. එසේ කරන ලද්දේ, තමන්වහන්සේ ක්‍රිස්තුන්වහන්සේ තුළ සිය කැමැත්තෙන් නියම කරගත් ස්වකීය අභිප්‍රාය අනුවය.**
>
> **දෙවියන්වහන්සේගේ ඒ අභිප්‍රාය නම්, නියමිත කාලයේදී ස්වර්ගයෙහිද පොළොවෙහිද එනම්, මුළු විශ්වයෙහි ඇති සියල්ල ක්‍රිස්තුන්වහන්සේ යටතේ එක්සත් කිරීමය. (එපීස 1: 9-10)**

දෙවියන්වහන්සේගේ අභිප්‍රාය සියලු මනුෂ්‍ය වර්ගයාට ගැළවීම ලබා දීම සහ සියලු මිනිසුන් හා ජාතීන් උන්වහන්සේ සමඟ නැවතත් සහභාගි කමට ගෙන ඒම බව ළමා කාලයේ සිටම ජේසුස්වහන්සේ දැන සිටි සේක.

ජේසුස්වහන්සේ උන්වහන්සේගේ මෙලොව ජීවිතය ගත කළේ දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් සාක්ෂාත් කිරීම සඳහාය. ළමයෙකු වශයෙන් වුවද ජේසුස් වහන්සේ සැලකිලිමත් වූයේ තමන්වහන්සේගේ සැලසුම් හා අභිප්‍රායන් ගැන නොව, දෙව් පියාණන්වහන්සේගේ සැලසුම් හා අභිප්‍රායන් ගැන වේ.

> **ඔබ මා සෙව්වේ මන්ද? මා පියාණන්ගේ මැඳුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නහුදැයි ඔවුන්ට වදාළ සේක. (ලූක් 2:49)**

ජේසුස්වහන්සේගේ ජීවිතය හා සේවය යොමු වූයේ දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් වෙතය. සෑම සැලැස්මක්ම, සෑම තීරණයක්ම සේවයේ සෑම ක්‍රියාවක්ම ඒ අභිප්‍රාය සඳහාම විය.

> **ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසාද දිළිඳුන් හට සුබ ආරංචිය දේශනා කරනු වස්, උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීමද අන්ධයන්ට පෙනීමද ලැබෙන බව දන්වන්ටත් පීඩිත වුවන් මුදන්ටත් ස්වාමින්වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්ටත් මා එවා වදාළ සේක. (ලූක් 4:18-19)**

මෙය ජේසුස්වහන්සේ විසින් කරන ලද පරමාර්ථ ප්‍රකාශයන් කීපයකින් එකකි. මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" යන කොටසෙහි උන්වහන්සේගේම සේවය පිළිබඳව උන්වහන්සේ විසින්ම කරන ලද තවත් පරමාර්ථ ප්‍රකාශනයන් සමහරක් සඳහන් වේ. දෙවියන්වහන්සේගේ

අභිප්‍රායන් සාක්ෂාත් කිරීම සඳහා ජේසුස්වහන්සේ සැබෑ ඇදහිලිවතුන්ද ඇතුළුව සිය අනුගාමිකයන්ට බලය පැවරූ සේක.

> **එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේද පුත්‍රයාණන්ගේද ශුද්ධාත්මයාණන්ගේද නාමයෙන් ඔවුන් බව්තීස්ම-ස්නාපනය කරන්න.**
>
> **මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න. මමද කල්පාන්තය දක්වා සදහටම ඔබ සමඟ සිටිමි. (මතෙව් 28:19-20)**

මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" යන කොටස පෙරළා බලන්න. එහි සඳහන් ජේසුස් වහන්සේ තම අනුගාමිකයන්ට පැවසූ අනෙක් පරමාර්ථ ප්‍රකාශන අධ්‍යයනය කරන්න. ඔබද ඇදහිලිවන්තයකු හා ජේසුස්වහන්සේගේ අනුගාමිකයෙකු බැවින් මේවා වැදගත් වේ.

**ශුද්ධාත්මයාණන්වහන්සේ**

ශුද්ධාත්මයාණන්වහන්සේද දෙවියන්වහන්සේගේ සැලැස්මේ කොටසකි. ජේසුස්වහන්සේ ස්වර්ගයට ගිය පසු, ක්‍රියා 4 හි විස්තර කර ඇති පරිදි ශුද්ධාත්මයාණන්ගේ වැගිරීමෙන් සුවිශේෂී බලයක් දෙනු ලැබීය. මේ අත්දැකීමට කියනු ලබන්නේ ශුද්ධාත්මයාණන්ගේ බව්තීස්ම-ස්නාපනය ලෙසිනි.

ශුද්ධාත්මයාණන්ගේ බලය දෙනු ලැබුවේ, මොලොව දෙවියන්වහන්සේගේ අභිප්‍රාය සාක්ෂාත් කිරීම පිණිස වේ:

> **එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල, ඔබ බලය ලබන්නහුය. එවිට ඔබ ජෙරුසලමෙහිද මුළු ජුදයෙහි හා සමාරියෙහිද පොළොවේ සීමාන්තයන් දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් සාක්ෂාත් කිරීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය කෙතරම් වැදගත්ද යත් "*ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය*" (*Ministry of the Holy Spirit*) නමින් පූර්ණ (Harvestime International Institute) හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතන පාඨමාලාවක් ඒ සඳහා කැපකර ඇත.

මෙම ආයතනයෙන් පිරිනැමෙන තවත් පාඨමාලාවක් වන්නේ "*බල මූලධර්ම*" (*Power Principles*) වේ. ඉන් ආත්මික වර්ධනය හා ශුභාරංචිය පැතිරවීම සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්ම සාක්ෂාත් කර ගැනීමේදී ආත්මික බලයේ වැදගත්කම පැහැදිලි කරයි.

බලයට අමතරව, ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවතුන්ට දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් සාක්ෂාත් කරගැනීමට මාර්ගෝපදේශනය හා මගපෙන්වීම සපයයි. ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත දන්නා බැවින්ද උන්වහන්සේ මිනිසාගේ ආත්මය විමසා බලා අවබෝධ කරගන්නා බැවින්ද උන්වහන්සේ, දෙවියන්වහන්සේ හා ඔබ අතර පුරුකක් ලෙස ක්‍රියා කරන අතර දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් හා සැලසුම් සාක්ෂාත් කරගැනීමට ඔබට උපකාරී වේ:

> **අප සිත් සතන්හි ඇති සියල්ල විමසා බලන දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගේ අයදුම් දන්නා සේක. මන්ද, ශුද්ධාත්මයාණන් සැදැහැවතුන් උදෙසා කරන අයදුම් දේව අදහසට එකඟ වන බැවිනි. (රෝම 8:27)**

දෙවියන්වහන්සේගේ පරමාර්ථයන් හා සැලසුම් සාක්ෂාත් කරගැනීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ සහකරුවෙකු ලෙස ක්‍රියා කරන සේක. ඔබ දේව වචනය කතා කරන විට, උන්වහන්සේ ඔබ ආලේප කරන අතර අභක්තිකයන් පාපයට වරද කරුවන් කරමින් ශුභාරංචිය පිළිගැනීමට මඟ පෙන්වන සේක. (ජොහන් 16:7-11 බලන්න)

**සභාව**

නැවත උත්පාදනය ලැබූ සියලුම ඇදහිලිවතුන්ට ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ප්‍රදානය කරන ලදි. සියලුම සැබෑ ඇදහිලිවතුන් සභාවේ කොටසක් වේ. දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ අභිප්‍රායන් හා සැලසුම් සාක්ෂාත් කරගැනීම සඳහා දැන් භාවිත කරන උපකරණය සභාව වේ.

> **මේ අබිරහස් අරමුණ ක්‍රියාත්මක කරනු ලබන ආකාරය එළිදරව් කිරීමටත්ය. කල්ප ගණනාවක් මුළුල්ලේ ඒ අබිරහස් විශ්වයේ මැවුම්කරුවාණන් වන දෙවියන්වහන්සේ තුළ සැඟවී තිබිණි.**
>
> **එසේ වූයේ, (මෙයින් අදහස් කරන්නේ දෙවියන්වහන්සේගේ අභිප්‍රාය) මේ කාලයේදී ශුද්ධ සභාව මගින් ස්වර්ග ලෝකවල අධිපතීන්ටත් බලධාරීන්ටත් දෙවියන්වහන්සේගේ විවිධාකාර ප්‍රඥාව (දෙවියන්වහන්සේගේ සැලැස්ම හා අභිප්‍රාය) දන්වනු ලබන පිණිසය. (එපීස 3:9-10)**

දෙවියන්වහන්සේ ඇදහිලිවතුන්ගේ ජීවිත තුළ ක්‍රියා කරන්නේ උන්වහන්සේගේ අභිප්‍රායන් සාක්ෂාත් කරගැනීම පිණිස වේ:

> **මන්ද ඔබ දෙවියන්වහන්සේගේ යහපත් කැමැත්තට අවනත වී එය ඉෂ්ට කරවීමට උන්වහන්සේම ඔබ තුළ ක්‍රියා කරන සේක. (පිලිප්පි 2:13)**

"දෙවියන්වහන්සේගේ යහපත් කැමැත්ත... ඉෂ්ට කරවීම" යනු උන්වහන්සේගේ අභිප්‍රාය හා සැලැස්ම ඔබගේ ජීවිතය තුළ සාක්ෂාත් කිරීමට උන්වහන්සේ ඔබ තුළ ක්‍රියා කරන බව වේ. මීට ගැළවීමද, ශුද්ධාත්මයාණන්ගෙන් පරිපූර්ණ වීමද, අන් අය වෙනුවෙන් සේවය කිරීමට ඔබ යොදා ගැනීමද හා නිරන්තරයෙන්ම උන්වහන්සේගේ පුත්‍ර වූ ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ ප්‍රතිරූපයට ස්ථිර කිරීමද ඇතුළත්ය.

උන්වහන්සේගේ අභිප්‍රායන් සාක්ෂාත් කිරීමට ඔබගේ ජීවිතය තුළින්ද උන්වහන්සේ ක්‍රියා කරන සේක:

> **ඔබේ ඉන්ද්‍රියයන් අධර්මිෂ්ටකමේ ආයුධ වන ලෙස පාපයට භාර නොදෙන්න. එසේ නොකර මළවුන් කෙරෙන් උත්ථාන වූ අය මෙන් දෙවියන්වහන්සේට කැපවී ඔබේ ඉඳුරන් ධර්මිෂ්ඨකමෙහි ආයුධ වන ලෙස උන්වහන්සේට භාර කරන්න. (රෝම 6:13)**

ඔබ, ඔබව "ධර්මිෂ්ඨකමෙහි ආයුධ වන ලෙස උන්වහන්සේට භාර කිරීම" යනුවෙන් අදහස් වන්නේ ඔබ ඔබගේ ජීවිතයත් සේවයත් උන්වහන්සේගේ අභිප්‍රාය හා සැලසුමට අනුරූප වන ලෙස ගෙන ඒම වේ. මේ දේ කිරීමෙන් ඔබ තුළින් උන්වහන්සේට ක්‍රියා කළ හැකි ආයුධ බවට පත්වේ.

> **"අපි ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් තානාපතියන්... වෙමු" (2 කොරින්ති 5:20)**
>
> **"එබැවින් දේව සේවයේ පංගුකාරයන් වශයෙන්... " (2 කොරින්ති 6:1)**

දෙවියන්වහන්සේ ඔබ තුළ හා ඔබ තුළින් ක්‍රියා නොකරන සේක් නම්, ඔබගේ සියලු ක්‍රියාවන් නිශ්ඵල වේ.

> **සමිඳාණෝ ගෙය නොසාදන සේක් නම් එය ඉදි කරන්නෝ නිකරුණේ වෙහෙසෙති. සමිඳාණෝ නගරය රැකබලා නොගන්නේ නම් මුරකරුවෝ නිකරුණේ පිබිද සිටිති. (ගීතාවලිය 127:1)**

ඔබ මනුෂ්‍යයාගේ නොව දෙවියන්වහන්සේගේ සදාතනික අභිප්‍රාය මත ඔබගේ සේවය ගොඩනගන්නේ නැත්නම් එය අසාර්ථක වනු ඇත.

> **ඔවුන්ගේ මේ ව්‍යාපාරය හෝ ක්‍රියා මාර්ගය හෝ මිනිසාගෙන් වන දෙයක් නම්, එය කඩාකප්පල් වන්නේය. එහෙත් එය දෙවියන්වහන්සේගෙන් වන දෙයක් නම්, ඔවුන් පරාජය කරන්නට ඔබට නොහැකිය. එපමණක් නොව ඔබ අදහස් කරන දේ දෙවියන්වහන්සේට විරුද්ධව සටන් කිරීමක් වීමටද ඉඩ ඇත. (ක්‍රියා 5:38-39)**

## පරමාර්ථය හා සැලැස්ම

ආරම්භයේ සිටම දෙවියන්වහන්සේගේ පරමාර්ථය වෙනස් වී නැත. පරමාර්ථය හා සම්බන්ධ විවිධ සැලසුම් උන්වහන්සේට තිබිණි. එහෙත්, උන්වහන්සේගේ පරමාර්ථය වෙනස් නොවේ.

ඔබ මෙම පාඩමෙන් උගත් පරිදි දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ලිඛිත වචනයේ උන්වහන්සේගේ සුවිශේෂී පරමාර්ථය එළිදරව් කර ඇත. එමෙන්ම උන්වහන්සේගේ පොදු සැලැස්මද උන්වහන්සේ එළිදරව් කර ඇත. එය නම් උන්වහන්සේගේ පරමාර්ථයන් සාක්ෂාත් කරගැනීමට උන්වහන්සේ භාවිත කරන ආයුධ සභාව බවය.

එහෙත් ඇදහිලිවන්තයෙකු ලෙස උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට නම් ඔබ සුවිශේෂී විස්තරාත්මක සැලසුම් සකස් කළ යුතු වේ. සැලසුම් කිරීම හා අරමුණු මගින් කළමනාකරණය අදාළ වන්නේ එතැනදීය. දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ පරමාර්ථය තුළ ඔබගේ සුවිශේෂී පරමාර්ථය ඔබ සොයා ගත යුතුය. ඉන්පසු දෙවියන්වහන්සේගේ පරමාර්ථයට අනුකූලව ඔබ ඔබගේ සේවයේ සැලැස්ම සකස් කළ යුතු වේ.

ඊළඟ පාඩමේදී ඔබ පරමාර්ථ ප්‍රකාශයක් සකස් කරන්නට ඉගෙන ගන්නා විට මේ දෙය කිරීම ආරම්භ කරනු ඇත.

**ස්වයං-පරීක්ෂණය**

01. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

02. දෙවියන්වහන්සේගේ දිව්‍යමය පරමාර්ථය කුමක්ද?

03. දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා සැලැස්ම අවබෝධ කරගැනීම වැදගත් වන්නේ මන්ද?

04. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් සාක්ෂාත් කරගන්නේ කුමන උපකරණ භාවිතයෙන්ද?

05. දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම්වලට අදාළව ජේසුස්වහන්සේගේ මෙහෙය සාරාංශ කරන්න.

06. දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම්වලට අදාළව ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය සාරාංශ කරන්න.

07. දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම්වලට අදාළව සභාවේ මෙහෙය පැහැදිලි කරන්න.

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

01. දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් වෙනුවෙන් උන්වහන්සේගේ කොටස පිළිබඳව ජේසුස්වහන්සේට මනා අවබෝධයක් තිබිණි. පහත දැක්වෙන යොමුවීම් මගින් ඒ ගැන තවදුරටත් අධ්‍යයනය කරන්න.

**මතෙව්:** 5:17; 8:3, 7; 9:13; 10:34-35; 13:41-42; 15:24; 18:11, 20; 19:28-29; 20:18-19, 28; 21:13; 24:35; 25:31; 26:24, 29, 32, 39, 64

**මාක්:** 1:38; 2:17; 10:33-34, 45; 14:21

**ලූක්:** 2:49; 4:18-19, 43; 5:32; 9:22, 56; 11:49; 12:51; 13:32-33; 19:5, 10; 22:37, 69; 24:44, 46-47

**ජොහන්:** 3:16-17; 4:34; 5:30, 43; 6:37-40, 51; 7:16, 33; 8:26, 29, 49-50; 9:4, 38-39; 10:10, 16-18; 12:24-27, 32, 46, 49-50; 13:5; 14:2, 16-18; 18:36; 16:12, 22, 25; 18:37; 12:24-27; 17 පරිච්ජේදය සම්පූර්ණයෙන් අධ්‍යයනය කරන්න. උන්වහන්සේගේ පරමාර්ථය පිළිබඳ බොහෝ දේ එහි ඇත.

02. ජේසුස්වහන්සේගේ අනුගාමිකයන් වෙනුවෙන් ඇති පරමාර්ථ පිළිබඳව තවත් අධ්‍යයනය කරන්න.

**මතෙව්:** 7:33; 9:37-38; 10:7-8, 38-39; 16:24-25; 28:18-20

**මාක්:** 1:17; 16:15-18; 8:34-35

**ලූක්:** 5:10; 9:2; 10:2-9; 12:29; 14:26-27, 33; 22:29; 24:46-49

**ජොහන්:** 4:35; 6:27; 15:16; 20:21

**ක්‍රියා:** 1:4-5, 8

03. පහත දැක්වෙන යොමුවීම් මගින් "පරමාර්ථය" පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන්න:

එස්රා 4:5; ගීතාවලිය 17:3; හිතෝපදේශ 15:22; ධර්මදේශකයා 3:1, 17; 8:6; යෙසායා 14:24-27; 23:9; 46:11; යෙරමියා 4:28; දානියෙල් 1:8; ක්‍රියා 11:23; 19:21; 20:3; 26:13; රෝම 8:28; 9:11, 17; 2 කොරින්ති 9:7; එපීස 1:4-11; 3:11; කොලොස්සි 4:8; 2 තිමෝති 1:9; 3:10; 1 ජොහන් 3:8

04. දාවිත් දෙවියන්වහන්සේගේ පරමාර්ථ උදෙසා ඔහුගේ පරම්පරාවේ අය උදෙසා සේවය කළේය (ක්‍රියා 13:36). ඔබගේ පරම්පරාවේ ඔබ උදෙසා දෙවියන්වහන්සේගේ පරමාර්ථය කුමක්ද?

# තෙවන පරිච්ඡේදය

# පරමාර්ථය

**අරමුණු:**

මෙම පරිච්ජේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:
- "පරමාර්ථ ප්‍රකාශය" යන පදය අර්ථවිග්‍රහ කිරීමට
- පරමාර්ථයේ වැදගත්කම පැහැදිලි කිරීමට
- පරමාර්ථය සහ අරමුණු අතර වෙනස පැහැදිලි කිරීමට
- ධර්මනියාමක ප්‍රකාශය හා පරමාර්ථ ප්‍රකාශය අතර වෙනස පැහැදැලි කිරීමට
- පරමාර්ථ ප්‍රකාශයක් ලිවීමට
- පරමාර්ථ අන් අයට සන්නිවේදනය කළ හැකි ක්‍රම ලයිස්තුගත කිරීමට

හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

**ඔබ ජීවත්වන පිළිවෙළ ගැන ඉතා සැලකිලිමත් වන්න. අඥානයන් මෙන් නොව ඥානවන්තයන් මෙන් ජීවත්වන්න.**
**කාලය නපුරු බැවින්, ඇති හැම අවස්ථාවකින්ම ප්‍රයෝජන ගන්න (එපීස 5:15-16).**

### හැඳින්වීම

දෙවියන්වහන්සේ පරමාර්ථයේ දෙවි කෙනෙකු බවත්, උන්වහන්සේගේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා නිරන්තරයෙන්ම සැලසුම් සකස් කරමින් ඒවා ක්‍රියාත්මක කරන බවත් පසු ගිය පාඩමෙහි උගත්තෙහිය.

දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ පරමාර්ථය අවබෝධ කරගන්නා සහ උන්වහන්සේගේ සැලැස්මේ පංගුකාරයින්වීමට කැමති අයව ආලේප කර භාවිත කරන සේක. දෙවියන්වහන්සේගේ සැලැස්මේ පංගුකාරයෙකු වීමට ඔබගේ ජීවිතය හා සේවය, උන්වහන්සේගේ පරමාර්ථය සමඟ අනුරූප විය යුතුය. ජේසුස් වහන්සේගේ ජීවිතයට හා සේවයට මඟපෙන්වන ලද පරමාර්ථයේ හැඟීමම ඇතිව ඔබ ද ජීවත් විය යුතුය. සේවය කළ යුතුය. මෙම පාඩම, දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම්වලට අනුරූප පරමාර්ථ ප්‍රකාශයක් සැකසීමට ඔබට උපකාරී වේ.

### පරමාර්ථ ප්‍රකාශයක්

පරමාර්ථ ප්‍රකාශයක් යනු පැවැත්මට හේතු දක්වන ප්‍රකාශයකි. එය ඔබ වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සුවිශේෂී කාර්යය පිළිබඳ ඔබගේ අවබෝධය පෙන්නුම් කෙරේ. එය දර්ශනයේ හා ඇදහිල්ලේ ප්‍රකාශයකි.

පරමාර්ථ ප්‍රකාශයක් මගින් සේවාවක් සංවිධානයක් හෝ සභාවක් සාමූහික කණ්ඩායමක් වශයෙන් පැවතීමට හේතු පෙන්වා දෙයි. එමෙන්ම එය කණ්ඩායමක් ලෙස ඔබගේ මෙහෙය පැවතීමට හේතු පැහැදිලි කරයි. එක් පුද්ගලයෙකුට නම් "පරමාර්ථ ප්‍රකාශය" මගින් හඳුන්වා දෙන්නේ දෙවියන්වහන්සේගේ සැලැස්මේ තමන්ගේ පෞද්ගලික කොටස වේ.

පරමාර්ථ ප්‍රකාශයක්, ධර්මනියාමක ප්‍රකාශයක් නොවේ. ධර්මනියාමක ප්‍රකාශයකින් පැවසෙන්නේ ඔබගේ සේවයේ දේවධාර්මික විශ්වාසය වේ. ධර්මනියාමක ප්‍රකාශයක් තිබීම වැදගත්ය. එහෙත් එය පරමාර්ථ ප්‍රකාශයක් හා සමාන නොවේ (ධර්මනියාමක ප්‍රකාශයක නිදසුනක් සඳහා මෙම අත් පොතේ ඇමුණුම බලන්න).

පරමාර්ථය, අරමුණුවලට වඩා වෙනස්ය. පරමාර්ථය යනු සේවය පැවතීමට හේතුව දැක්වෙන ප්‍රකාශයකි. අරමුණු යනු පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා සේවය විසින් ක්‍රියාත්මක කරනු ලබන සැලසුම් ප්‍රකාශන වේ.
අරමුණ ඔබ කරන දෙයය. පරමාර්ථ ඔබ ඉන්නේ මන්ද යන්න වේ. සැලසුම් කිරීම පිළිබඳ ඇති ඊළඟ පාඩමෙන් ඔබ අරමුණු පිළිබඳව තව දුරටත් ඉගෙන ගනු ඇත.

පරමාර්ථ සභාවේ වැඩ සැලැස්ම හා සමාන නොවේ. වැඩ සැලසුම් යනු පරමාර්ථය හා සබැඳි පිටත ගොස් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් වේ. පරමාර්ථ ප්‍රකාශයක ඔබගේ සේවය පැවතීමට සුවිශේෂි හේතුව හඳුනාගත හැකිය. එය ඔබ ක්‍රිස්තුන්වහන්සේගේ ශරීරයේ සම්පූර්ණ කරන්නාවූ සේවයේ ස්ථානය කවරක්දැයි සුවිශේෂිව සාරාංශගත කරනු ඇත.

දෙවියන්වහන්සේගේ සැලැස්මේ තමන්ගේ සුවිශේෂි පරමාර්ථය දන්නාවූ දෙවියන්වහන්සේගේ පුරුෂයන් හා ස්ත්‍රීන් පිළිබඳ නිදසුන්වලින් බයිබලය පිරී පවති. අපි මින් එක් පුද්ගලයෙකු, ප්‍රේරිතවූ පාවුල්තුමා ගැන සලකා බලමු.

පාවුලුතුමාට පරමාර්ථය පිළිබඳ ස්ථිර හැඟීමක් තිබිණි. ඔහු එය දත් අතර එය අන් අයට ද සන්නිවේදනය කළේය. ඔහු තිමෝතිට මෙසේ ලිවේය.

> **...මාගේ ඉගැන්වීමද හැසිරීමද අරමුණද... ඔබ දන්නෙහිය** (2 තිමෝති 3:10)

ඔහුගේ ජීවිත ඉලක්කය වූයේ එම පරමාර්ථය සම්පූර්ණ කිරීමය.

> **මේ සියල්ල දැනටම මට ලැබී තිබෙන බවක්වත්, දැනටම මා සම්පූර්ණ වී සිටින බවක් වත් මම නොකියමි. යමක් පිණිස ක්‍රිස්තුස් ජේසුස්වහන්සේ මා අත්කර ගත් සේක්ද ඒ දේ අත්කර ගැනීම පිණිස මමත් වීර්යයෙන් දුවමි** (පිලිප්පි 3:12).

පාවුලුතුමාගේ පරමාර්ථය ඔහුට දෙවියන්වහන්සේ විසින් සන්නිවේදනය කළ සේක.

> **ඔහු මාගේ නාමය විජාතීන් ද රජුන් ද ඉශ්රායෙල් පුත්‍රයන් ද වෙත ගෙන යාමට මා විසින් තෝරාගත් භාජනයකි** (ක්‍රියා 9:15)

සියලුම පුරුෂයන් සහ ස්ත්‍රීන් ස්වාමිවූ ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ දැනගැන්මේ පූර්ණත්වයට ගෙන ඒම දෙවියන්වහන්සේගේ පොදු පරමාර්ථය බව ඔබ පසුගිය පරිච්ඡේදයෙන් ඉගෙන ගත්තෙහිය.

පාවුලුමාගේ සේවයේ පරමාර්ථය දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා සැලසුම් සමඟ අනුරූප විය. පාවුලුතුමා "පරමාර්ථ ප්‍රකාශන" ලිවේ නම් එය මෙසේ විය හැකිය. මාගේ සේවයේ පරමාර්ථය වන්නේ ස්වාමිවූ ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ නාමය ... විජාතීන් ද (ඉශ්රායෙල් හැර අනෙක් ජාතීන්)

...රජවරුන්ද (නායකයන්)

...ඉශ්රායෙල් ජාතියද (ජුදෙව්වන්)

වෙත ගෙන යාමට වේ.

## පරමාර්ථයේ වැදගත්කම

පරමාර්ථ ප්‍රකාශයක් වැදගත් වන්නේ පරමාර්ථය ...

**මඟපෙන්වීමක් දෙන බැවිනි :**

දර්ශනයක් යනු ඔබ සාක්ෂාත් කර ගැනීමට අදහස් කරන දෙයෙහි චිත්ත රූපයකි. බයිබලයේ මෙසේ සඳහන් වේ.

> **ජීවිත දර්ශනයක් නැති තැන විනයක් නැත ...** (හිතෝපදේශ 29:18)

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයෙන් පොදු දර්ශනයක් දී ඇත. එහෙත් ඔබට සුවිශේෂි දර්ශනයක්ද තිබිය යුතුය. ඔබගේ සේවයෙන් සාක්ෂාත් කරගැනීම සඳහා දෙවියන්වහන්සේ නිසැකවම කැඳවා ඇත්තේ කුමන සේවයකටද යන්න පිළිබඳව පැහැදිලි දැනුමක් ඔබට තිබිය යුතුය. ඔබ සේවය කළ යුත්තේ පැහැදිලි ස්ථිර දර්ශනයක් අනුව වේ.

දෙවියන්වහන්සේ දර්ශනයක් පිහිටවූ විට, මිනිසුන් මෙන් උන්වහන්සේගේ මනස් වෙනස් කරන්නේ නැත. මිනිසුන් හා සංවිධාන දෙවියන්වහන්සේ ඔවුන්ට දී ඇති දර්ශනය වෙනත් මාර්ගයකට පිවිසි කල, ඔවුන් ව්‍යාකූලත්වය, ගැටලු හා අසාර්ථකවීම් අත්දකිනු ඇත.

### බයිබලීය ලෝක දර්ශනයකට අනුබල දෙයි

ඔබගේ පරමාර්ථය නිර්ණය කිරීම සඳහා ඔබ සේවය කරන පරිසරය ඔබ විශ්ලේෂණය කරන බැවින් පරමාර්ථය, බයිබලීය ලෝක දර්ශනකයකට අනුබල දෙයි. මේ දෙය ඔබ කරන විට, ඔබ සේවය කරන සමාජයේ, ජාතියේ හා ලෝකයේ ආත්මික අවශ්‍යතා ගැන දැනුවත් වනු ඇත.

නිදසුනක් වශයෙන් පාවුලුතුමා ඇතන්ස් නගරයේ ආත්මික තත්වයේ විශ්ලේෂණයක් කළේය. ඔහුගේ හදවත කැළඹුනේය. එමෙන්ම ඔහු ඔහුගේ සේවයේ පරමාර්ථය දන්නා නිසා හා අවබෝධ කරගත් නිසා ඔහු මේ විජාතික නගරයේ වැසියන් සමඟ ශුභාරංචිය බෙදා ගත්තේය (ක්‍රියා 17:16-34 බලන්න).

පරමාර්ථය සෑම විටම අවශ්‍යතාවන් හා සම්බන්ධය. අවශ්‍යතා හැඳිනගැනීමෙන් බයිබලීය ලෝක දර්ශනය පෝෂණය වේ. ඔබද, දෙවියන්වහන්සේ ලෝකය දක්නා සේ ලෝකය දැකීම ආරම්භ කරනු ඇත.

### සැලසුම් කිරීමට ඉඩ දෙයි

පරමාර්ථය, සැලසුම් කිරීමට ඉඩ දෙයි. ඔබ පරමාර්ථය දන්නා විට, ඒ දර්ශනය සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් සකස් කිරීමට ඔබට පුළුවන. අවිනිශ්චිත පරමාර්ථවල ප්‍රතිඵලය වන්නේ අවිනිශ්චිත සැලසුම් වේ.

ඔබට දෙවියන්වහන්සේ වෙනුවෙන් වැඩක් ඉටු කළ හැක්කේ ඒ සඳහා ඇති කැමැත්තෙන්ම පමණක් හෝ ඒ ගැන වෙහෙස වී වැඩ කිරීමෙන් වුවද හෝ නොවේ. ඔබට සුවිශේෂි දර්ශනයක් නොමැති නම් වැඩය නිසා ඉලක්කය මඟහැරීමට ඉඩ තිබේ.

ඔබට කළ හැකි යහපත් වැඩ බොහෝමයක් ඇත. ඔබට දෙවියන්වහන්සේ වෙනුවෙන් නිරන්තරයෙන්ම කාර්ය බහුලව සිටිය හැකිය. එහෙත් උන්වහන්සේ ඔබට ඉටු කිරීම සඳහා දී ඇති සුවිශේෂි සේවය කුමක්ද? ඔබ දෙවියන්වහන්සේට වගකිව යුත්තේ මේ සඳහා වේ. බොහෝ දේ ඉටු කිරීමට වඩා දෙවියන්වහන්සේ ඔබ කැඳවා ඇති මේ එක් දෙය යහපත්ව කිරීම වැදගත් වේ.

ජේසුස් වහන්සේ පරමාර්යේ ප්‍රමුඛතාව මාර්තාට පැවසූ දෙයින් අවධාරණය කළ සේක.

> **මාර්තා, මාර්තා නුඹ බොහෝ දේවල් ගැන නලංගු වී කැළඹෙන්නෙහිය (ලූක් 10:41)**

ප්‍රමුඛතා පිහිටුවීමේ පදනම වන්නේ පරමාර්ථය වේ. ඔබගේ ප්‍රමුඛතා දේව රාජ්‍යයේ ප්‍රමුඛතා සමඟ එකඟතාවයකට එන්නේ නම්, සේවය ඉටු කිරීම සඳහා අවශ්‍ය සියල්ල ඔබට ලැබෙනු ඇත.

> **පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ටකමද සොයාපල්ලා¦මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය (මතෙව් 6:33)**

පරමාර්ථයේ දී ඔබගේ ප්‍රමුඛතාව දේව රාජ්‍යය නම් ඵලදායි සේවයක් සඳහා ඔබට අවශ්‍ය ඕනෑම දෙයක්... මිල මුදල්, සෙනඟ, ද්‍රව්‍යමය දේ ආදිය ඔබට සපයනු ඇත.

සෑම සේවයක් සඳහාම ප්‍රමුඛතා තිබේ. දේව වචනය හා එකඟ වන සේ ඔබ ප්‍රමුඛතා පිහිටවූයේ නොමැති නම්, පුරුද්දක් ලෙස ඒවා වෙත ඇදී යාමෙන් හෝ සෙනඟගේ, අවශ්‍යතාවන්ගේ හෝ අර්බුදයේ පීඩනය නිසා හෝ ඒවා වර්ධනය වනු ඇත. එවිට ඔබ ඔබගේ ප්‍රමුඛතාවන්, දෙවියන්වහන්සේට පිහිටුවීමට ඉඩ දෙනවා වෙනුවට ලෝකයාට පිහිටුවීමට ඉඩ දෙනු ඇත.

ඵලදායි සේවයක් සඳහා සැලසුම් කිරීමට, පරමාර්ථය ඉඩ සලයසි. එය සැලසුම් තේරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ද මුදල් වෙන්කිරීමේද පදනම වනු ඇත. එය ඔබ අවධාරණය කළ යුතු දේ

පෙන්වන අතර දෙවියන්වහන්සේ ඔබ නොකැඳවූ හෝ ඔබව හොඳින් සන්නද්ධ නොකළ හෝ සේවාවන් වෙත ඇදීයාම වළක්වනු ඇත.

ස්වාමීන්වහන්සේ නැවත පැමිණීමට ඇති කාලය කෙටි බැවිනුත් අවශ්‍යතාව වැදගත් හා දවස් නපුරු බැවිනුත්, ඔබ පරමාර්ථයක් ඇතිව ජීවත් විය යුතුය.

> **නුඹලා ඥානය නැත්තන් මෙන් නොව ඥානවන්තයන් මෙන් ප්‍රවේසමෙන් හැසිරෙන්ට බලාගෙන දවස් නපුරු බැවින් ප්‍රස්තාව අල්ලාගනිල්ලා (එපීස 5:15-16)**

පාවුලුතුමා තම සියලු ගමන් හා සේවය, තමා කැඳවූ පරමාර්ථයට සුවිශේෂී සබඳතාවක් ඇතිව සැලසුම් කලේය. යහපත් වැඩ කිරීමෙන් ඔහු කාලය ගත කළේ නැත. ඔහු ඔහුගේ ජීවිතය කැප කළේ දෙවියන්වහන්සේ විසින් ඔහුව ආලේප කරනු ලැබූ සේවය සඳහා වේ.

**ව්‍යාකූලත්වය ඉවත් කරයි**

පැහැදිලි ලෙස විග්‍රහ කළ පරමාර්ථයක් නොමැති තැන, ව්‍යාකූලත්වය පවතී. ක්‍රියාව හා සිතුවිල්ල අතර එකඟතාවක් නැත. එවිට ප්‍රතිඵලය වන්නේ බොහෝ විට අනවබෝධය හා ගැටුම වේ.

පැරණි ගිවිසුමේ, යුද්ධයට සෙනඟ එක්රැස් කිරීම සඳහා ඉශ්‍රායෙල් නායකයෝ හොරණෑව භාවිත කළහ. හොරණෑවෙන් ප්‍රබල, පැහැදිලි සංඥාවක් දිය යුතුය. නැතහොත් දෙවියන්වහන්සේගේ හමුදාව ව්‍යාකූලත්වයට පැමිණෙනු ඇත (ගණන් කථාව 10:9 හා 1 කොරින්ති 14:8).

පැහැදිලි පරමාර්ථය යුධ බිමේ හොරණෑවේ ශබ්දය මෙනි. එය දෙවියන්වහන්සේගේ සෙනඟ යුද්ධයට කැඳවයි. ආත්මික යුද්ධයේදී අන් අයව ඉදිරියට කැඳවන නායකයිනට පැහැදිලි පරමාර්ථයක් තිබිය යුතුය.

**ඇගයීමට ඉඩ දෙයි**

ඔබගේ සේවයේ පරමාර්ථය ඔබ දන්නෙහි නම්, ඔබ දෙවියන්වහන්සේගේ සැලැස්ම සාක්ෂාත් කර ඇත්දැයි බැලීමට ඇගයීමක් කළ හැකිය. පාවුලුතුමා ඔහුගේ පරමාර්ථය දැන සිටි බැවින් හා අවබෝධ කරගත් බැවින් ඔහුගේ සේවය ඇගයීමට ලක්කර මෙසේ පැවසීමට හැකි විය.

> **ඔබ ස්වර්ගීය දර්ශනයට අකීකරු නොවී...(ක්‍රියා** 26:19)

ඇගයීම පිළිබඳව ඔබ පසුව මෙම පාඨමාලාවෙන් ඉගෙන ගන්නෙහිය.

**ආධිපත්‍යයෙන් හා අලේප කිරීමෙන් යුතුව සේවය කිරීමට හැකිවනු ඇත.**

ඔබ ඔබගේ සුවිශේෂී පරමාර්ථය දන්නා නිසාත් එය දෙවියන්වහන්සේගේ පරමාර්ථයට අනුරූප නිසාත්, උන්වහන්සේ ඔබගේ සේවය ආලේප කරන සේක. දෙවියන්වහන්සේ ඔබ කැඳවා ඇත්තේ කුමකටද යන්න ඔබ දන්නා බැවින් ඔබට බලයෙන් හා අධිකාරිත්වයෙන් යුතුව සේවය කළ හැකිය.

## පරමාර්ථ ප්‍රකාශයක් සකස් කිරීම

දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා සැලසුම් සමඟ එකඟ වන පරමාර්ථ ප්‍රකාශයක් දැන් ඔබට සකස් කළ හැකිය. පහත දැක්වෙන පිළිතුරු සපයන පෞද්ගලික පරමාර්ථ ප්‍රකාශයක් ඔබට අවශ්‍යය. "මාගේ පෞද්ගලික සේවය, දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා සැලසුම් සමඟ ගැළපෙන්නේ කෙසේද?"

එයින්ම මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයෙන සාමූහික පරමාර්ථ ප්‍රකාශයක්ද අවශ්‍යය. "මා කොටස්කරුවෙකු වන සංවිධානය, සහභාගිකම හෝ සභාව දෙවියන්වහන්සේගේ සැලැස්ම ගැළපෙන්නේ කෙසේද?"

(ඔබගේ සංවිධානය හෝ සභාවට හෝ දැනටමත් ලිඛිත පරමාර්ථ ප්‍රකාශයක් ඇත්නම්, මෙම පාඩමේ "තව දුරටත් අධ්‍යයන කිරීම සඳහා" යන කොටසෙහි ඇති උපදෙස් අනුව එය නැවත සකස් කරන්න)

ඔබ "පරමාර්ථ ප්‍රකාශය" ලිවිය යුතුය.

> **ස්වාමීන්වහන්සේ මට උත්තර දෙමින් දර්ශනය කියවන්නා ඉක්මනින් කියවන්නට පුළුවන් වන පිණිස එය ලෑලිවල පැහැදිලි ලෙස ලියන්න (හබක්කුක් 2:2).**

ඔබ එය ලිවිය යුතු හේතුව වන්නේ:

1. එය සරල විමටය. පරමාර්ථය පිළිබඳ අවිනිශ්චිත අදහසක් ඔබ සිත්හි ඇත්නම් එය අපැහැදිලි වනු ඇත. "පරමාර්ථ ප්‍රකාශයක්" ලිවීමෙන්, සිදුවන්නේ දෙවියන්වහන්සේ ඔබ කැඳවා ඇති දෙය නිවැරදිව පැහැදිලි කර ගැනීම වේ.

2. එය අන් අයට සන්නිවේදනය කළ හැකිය. සෙනඟ දර්ශනය කියවා අවබෝධ කරගත් විට ඒ සමඟ "දිවීමට" පෙළඹෙනු ඇත.

සේවය සඳහා පරමාර්ථ ප්‍රකාශයක් සකස් කිරීමේ පියවර පහත දැක්වේ.

**යාච්ඤා කරන්න**
සේවයේ, ඔබගේ සුවිශේෂී පරමාර්ථය දැන ගැනීම සඳහා ඔබ දෙවියන්වහන්සේ සමඟ සන්නිවේදනය කළ යුතුය. ඔබ ඔබගේ පරිසරය විශ්ලේෂණය කරන විට සහ උන්වහන්සේගේ වචනය අධ්‍යයනය කරන විට ඔබට මඟපෙන්වන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

**පරිසරය විශ්ලේෂණය කරන්න**
ඵලදායිවීම සඳහා, ඔබගේ පරමාර්ථය දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා බැඳී පැවතිය යුතු අතරම, එය ඔබ සේවය කරන පරිසරයටද බැඳී පැවතිය යුතුය. එමෙන්ම ඔබගේ පරමාර්ථය ඔබ සේවය කිරීම සඳහා කැඳවා ඇති සෙනඟගේ අවශ්‍යතාවන් සමඟද බැඳී තිබීම අවශ්‍ය වේ.

පරිසර විශ්ලේෂණය යනු ඔබ සේවය කරන සෙනඟ හා භූගෝලීය ප්‍රදේශය පිළිබඳව කරන අධ්‍යයනයකි. මෙය කෙතරම් වැදගත්ද යත්, මේ විෂය පිළිබඳව හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනය සම්පූර්ණ පාඨමාලාවක් පිරිනමා ඇත.

යෝජනා කර ඇති අනුපිළිවෙළ අනුව ඔබ මෙම ආයතන පාඨමාලා හදාරන්නේ නම් ඔබ දැනටමත් "*පරිසර විශ්ලේෂණය*" යන පාඨමාලාව අධ්‍යයනය කර ඇත. ඔබගේ විශ්ලේෂණයේ දී ඔබ රැස්කර ගත් තොරතුරු විමර්ශනය කර පරමාර්ථ ප්‍රකාශය ලිවීම සඳහා එය භාවිත කරන්න.

ඔබ "*පරිසර විශ්ලේෂණය*" යන පාඨමාලාව හදාරා නොමැති නම් ඔබගේ සේවය සඳහා පරමාර්ථ ප්‍රකාශයක් ලිවීමට පෙර එය අධ්‍යයනය කරන ලෙස යෝජනා කරමු. ඉතා කෙටියෙන් සාරාංශගත කළ "පරිසර විශ්ලේෂණය" ඔබට, ඔබ සේවය කරන සෙනඟද, ඔවුන්ගේ ආත්මික තත්වයද, ඔවුන්ගේ අවශ්‍යතා ද සහ ඔවුන් ජීවත්වන සමාජ, සංස්කෘතික හා භූගෝලීය පරිසරය ද අවබෝධ කර ගැනීමට උපකාරී වනු ඇත. මේ දැනුම සමඟ ශුභාරංචිය සන්නිවේදනය කිරීමට ඔබ වඩාත් ඵලදායි වේ. පරමාර්ථ හා සැලසුම් කිසිම දිනෙක යහපත් අදහස් හෝ වැඩසටහන් හෝ පදනම් කරගෙන සකස් නොකළ යුතුය. දෙවියන්වහන්සේගේ ප්‍රකාශිත පරමාර්ථ පාපී ලෝකයේ අවශ්‍යතාවලට බැඳී පවතින්නාක් මෙන් ඔබගේ පරමාර්ථ හා සැලසුම් ද ආත්මික අවශ්‍යතා හා බැඳී පැවතිය යුතුය. බොහෝ සේවයන් අසාර්ථක වන්නේ, ඒවා සුවිශේෂිව පිටස්තර අයට පිරිනැමුවද ඒවා ඔවුන් සේවය කරන පරිසරයට සම්බන්ධ නැති බැවිනි. පරිසරය විශ්ලේෂණය කිරීම වැදගත්වීමට තවත් හේතුවක් නම් ඔබ නිරන්තරයෙන්ම වෙනස් වන ලෝකයක ජීවත් වීමය. එවැනි වෙනස්වීමක ආත්මික අභියෝගයට මුහුණ දීමට නම් ඔබ පරිසරය අවබෝධ කරගත යුතුය.

යම් ප්‍රදේශයක වෙසෙන සෙනඟට එරෙහිව ක්‍රියා කරන සෘණාත්මක ආත්මික බලවේග කවරක්දැයි පරිසර විශ්ලේෂණය මගින් එළිදරව් කිරීම ඉතාම වැදගත් වේ. ඔබට එවිට මේ ආත්මික බලවේග ගැන යාච්ඤා කර ඒවා බැඳ දැමිය හැකිය.

ඔබගේම ආත්මික ශක්තීන් හා දුර්වලතා විශ්ලේෂණය කිරීම ද පරිසර විශ්ලේෂණයට අයත් වේ. යම් සේවයකට සුවිශේෂී ලෙස හැඩ ගැසීම සඳහා අවශ්‍ය ආත්මික ශක්තීන් හා දීමනා සෑම පුද්ගලයෙකුට ද සෑම සේවයකට ද තිබේ. එමෙන්ම සෑම පුද්ගලයෙකුටම හා සෑම සේවයකටම දුර්වලතා ද ඇත. ඒවා ස්වභාවිකව ගත් කල ඔවුන්ගේ සේවය සම්පූර්ණ කිරීමේ හැකියාවනට බල පෑ හැකිය.

ඔබගේ දුර්වලතා ගැන සලකා බැලීම ඍණාත්මක චින්තනයක් නොවේ. ස්වයං-ඇඟයීම, අසාර්ථකවීම් වළක්වයි. ඉශ්‍රාලය ආයිහිදී ඔවුන්ගේ තත්වය ඇඟයීමට ලක් කර යාච්ඤා කලේ නම් ඔවුන් පරාජය නොවන්නට ඉඩ තිබිණි. දෙවියන්වහන්සේ ගැටලුව එළිදරව් කරන්නට හා සතුරා සමඟ සටනට යෑමට පෙර ඒ ගැන කටයුතු කිරීමට ද එවිට ඔවුන්ට හැකි වනු ඇත (ජොෂුවා 7 බලන්න).

එහෙත් ඔබගේ දුර්වලතා සමඟ විසීමෙන් ඔබ සාර්ථක නොවේ. ඔබ සාර්ථක වන්නේ ඔබගේ ශක්තීන් අවධාරණය කිරීමෙන් හා ඒවා දෙවියන්වහන්සේගේ මහිමය සඳහා යොදා ගැනීමෙනි. ඒ අතරම, දෙවියන්වහන්සේගේ බලය විදහා දැක්වීමට ඔබගේ දුර්වලතා අවස්ථාවක් වන බව ද ඔබ පිළිගත යුතුය.

ඔබගේ දුර්වලතා අගයන විට මේ ගැන සිතන්න.

> **උන්වහන්සේ ද මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වල කමේදී මාගේ බලය සම්පූර්ණ වන්නේ යයි මට කීසේක. එබැවින් ක්‍රිස්තුන්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරගන්නෙමි (2 කොරින්ති 12:9).**

ඔබගේ ශක්තීන් අගයන විට මේ ගැන සිතන්න.

> **නුඹලා එකිනෙකා සුදුසු තරමට වඩා තම තමා ගැන උතුම්කොට නොසිතා දෙවියන්වහන්සේ එකිනෙකාට බෙදා දුන් ඇදහිල්ලේ ප්‍රමාණය ලෙස පමණ දැන සිතන හැටියට, මට දෙන ලද අනුග්‍රහයෙන් නුඹලා අතරෙහි එකිනෙකාට කියම් (රෝම 12:3).**

**ශුද්ධ ලියවිලි පරමාර්ථ ප්‍රකාශව අධ්‍යයනය කරන්න.**

ඔබගේ පරමාර්ථ ප්‍රකාශන බයිබලය හා එකඟ විය යුතුය. මින් අදහස් කෙරෙන්නේ, එය දෙවන පරිච්ඡේදයේ සාකච්ඡා කළ පරිදි දෙවියන්වහන්සේගේ පොදු පරමාර්ථය හා එකඟ විය යුතු බව වේ.

බයිබලීය පරමාර්ථ කවදුරටත් අවබෝධ කර ගැනීම සඳහා උපකාරී වන පද සමහරක් පහත දැක්වේ. ඔබ මේවා අධ්‍යයනය කරන විට, ඔබගේ පරමාර්ථ ප්‍රකාශය ලිවීම සඳහා උපකාරී විය හැකි ඇතැම් ප්‍රධාන සිතිවිලි හා වචන ලියන්න.

- යෙසායා 1:1-20
- මතෙව් 7:33; 9:37-38; 10:7-8 ,38-39; 16:24-25; 28:18-20
- මාක් 1:17; 8:34-35; 11:25-26; 16:15-18
- ලූක් 4:16-19; 5:10; 9:2; 10:2-9; 12:29 ;14:26-27; 22:29; 24:46-49
- යොහන් 2:21; 4:35; 6:27; 15:16; 20:21-22
- ක්‍රියා 1:1-14; 2:42-47; 12:5,12; 14:27
- රෝම 10:13-15
- 1 කොරින්ති 13
- 2 කොරින්ති 4:3-4
- එපීස 1:21; 2:1-9, 19-22, 4:14-16; 5:25
- කොලොස්සි 1:2,18; 4:5-6; 3:12-16
- 1 තෙසලෝනික 2:12
- 1 තිමෝති 6:17-19

- තිතස් 2:14; 3:1,8,14
- හෙබ්‍රෙව් 9:12; 10:25
- යාකොබ් 1:17-27
- 1 පේතෘස් 2:1-12

**පරමාර්ථ ප්‍රකාශය ලියන්න**

ඔබ යාච්ඤාව, පරිසර විශ්ලේෂණය, හා උන්වහන්සේගේ වචනයෙන් එළිදරව් කර ඇති පරිදි දෙවියන්වහන්සේගේ පරමාර්ථය අධ්‍යයනය අනුගමනය කළෙහි නම්, ඔබගේම පරිසර විශ්ලේෂණය ලිවීමට දැන් ඔබ සූදානම්ය.

මේ වගන්තිය සම්පූර්ණ කරන්න.

"මාගේ පුද්ගලික සේවයේ පරමාර්ථය වන්නේ ...."

ඔබගේ පරමාර්ථ ප්‍රකාශයට අනුබල දෙන ඔබ උගත් සුවිශේෂී ශුද්ධලියවිලි පාඨ මොනවාද? ඒ යොමුවීම් ලයිස්තුගත කරන්න.

දැන් ඔබ සහභාගී වී සිටින සාමූහික සේවය සඳහා පරමාර්ථ ප්‍රකාශයක් ලියන්න. (එනම් ඔබගේ සභාව, ආගමික සංවිධාන, නිකාය, ධර්ම දූත සේවය ආදිය)

මේ සේවයේ පරමාර්ථය වන්නේ ...

මෙම සංවිධානයේ පරමාර්ථ ප්‍රකාශයට අනුබල දෙන, ඔබ උගත් සුවිශේෂී ශුද්ධලියවිලි පාඨ මොනවාද? ඒ යොමුවීම් ලයිස්තුගත කරන්න.

**පරමාර්ථ ප්‍රකාශය ඇගයීමට ලක්කරන්න**

ඔබ ලියා ඇති ප්‍රකාශය ඇගයීමට ලක්කරන්න.

1. බයිබලයෙන් එළිදරව් කෙරෙන පරිදි, එය දෙවියන්වහන්සේගේ පොදු පරමාර්ථය හා එකඟ වේද? එය බයිබලයට අනුකූලද? ඔබගේ පරමාර්ථයට අනුබල දෙන සුවිශේෂී ශුද්ධ ලියවිලි පාඨ ඔබ හඳුනා ගත්තෙහිද?

2. ඔබගේ පරමාර්ථ ප්‍රකාශය පහසුවෙන් අවබෝධ කරගත හැකි වන සේ පැහැදිලිව ලියා තිබේද?

3. එම පරමාර්ථ ප්‍රකාශය, ඔබ සේවය කරන පරිසරයට අදාළ ද? එය දැනට පවතින ආත්මික අවශ්‍යතාවන් සපුරන්නේද?

4. එය සුවිශේෂී වැඩ සටහන්, සේවයන් හෝ මිනිසුන් දිනා ගැනීම සඳහා ඇති වැඩ සටහන් සාකච්ඡා කරනවාට වඩා ඔබගේ සේවය පැවතීමට හේතුව සඳහන් කරන්නේද?

5. එය අනාගත සේවාවන් සඳහා අසීමිත අවස්ථාවන් ලබා දෙන්නේද? එසේ නොමැති නම් එය සීමා සහිතය. බොහෝ සේ සීමා සහිත වූ ප්‍රකාශයකි මේ.

   "හාවස්ටයිම් අන්තර්ජාතික ජාලයෙහි පරමාර්ථය වන්නේ කිතුනු නායකයින් ලෙස ගිහියන් 100 දෙනෙකු පුහුණු කිරීම වේ."

   අප නායකයින් 100 ක් පුහුණු කළ පසු අපගේ පරමාර්ථය ඉටු වී ඇත. ඉදිරි සේවය සඳහා දර්ශනයක් අපට නැත. අපගේ පරමාර්ථය අප සීමා සහිත කර ඇති අතර එය බොහෝ සේ පටු වේ.

6. එය සුවිශේෂිද? එම ප්‍රකාශය බොහෝ සේ සාමාන්‍ය නම්, ඔබ එය ප්‍රමාණවත් තරම් ඉටුකර ඇත්දැයි සොයා ගැනීම අපහසුය.

බොහෝ සේ සාමාන්‍ය පරමාර්ථ ප්‍රකාශයක් පහත දැක්වේ.

"*භාවස්ටයිම් අන්තර්ජාතික ජාලයේ පරමාර්ථය වන්නේ කිතුනු ගිහියන් පුහුණු කිරීම වේ'*

සේවය, එහි පරමාර්ථය සාක්ෂාත් කර ඇත්දැයි බැලීම සඳහා ඇගයීමට මෙම ප්‍රකාශය ප්‍රමාණවත් තරම් සුවිශේෂි නැත. පුහුණු කරන්නේ කුමන සේවයකට ද? පරමාර්ථය කුමක්ද? පුහුණු කරන්නේ ඇයි? පුහුණුව අවධාරණය කරන්නේ කවරක්ද?

දැන් මෙම පාඩම "තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා" යන කොටසට පෙරලා, භාවස්ටයිම් අන්තර්ජාතික ජාලයේ අප අනුගමනය කරන පරමාර්ථ ප්‍රකාශය කියවන්න. මෙම ප්‍රකාශය බොහෝ දුරට සුවිශේෂි වන අතර එය අසීමිතය. එය වඩාත් විස්තර සහිත බැවින් අපගේ පරමාර්ථය සාක්ෂාත් කර ඇත්දැයි බැලීමට අපට එය ඇගයිය හැකිය. ඔබගේ "පරමාර්ථ ප්‍රකාශය" ශුද්ධලියවිල්ලට අදාළ නොවේ නම්, අපැහැදිලි නම්, අවශ්‍යතාවනට අවධාරණය නොකරන්නේ නම්, බොහෝ දුරට සීමිත නම් හෝ සාමාන්‍ය නම් එය නැවත ලියන්න.

**පරමාර්ථය සඳහා එක්සත් වීම**

දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම ඇතිව, මුළු සේවය, සභාව හෝ සංවිධානය සඳහා නායකයින් සාමුහික පරමාර්ථයක් ප්‍රතිස්ථාපිත කළ යුතුය. මෙම පරමාර්ථය සෑම දෙපාර්තමේන්තුවකටම, සභාවේ හෝ සංවිධානයේ හෝ පිටත කෙරෙන වැඩ සටහන්වලට සන්නිවේදනය කළ යුතුය. සෑම දෙපාර්තමේන්තුවකටම හෝ කණ්ඩායමක හෝ සෑම පුද්ගලයෙක්ම මෙම පරමාර්ථය අවබෝධ කරගත යුතුය.

මෙම පරමාර්ථය ප්‍රදේශයේ සෑම ඇදහිලිවන්තයෙකු වෙතම සන්නිවේදනය කළ යුතුය. පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා සේවයේ දී එක්සත්වීමට නම් සෑම පුද්ගලයෙකුම පරමාර්ථය දැනගත යුතු වේ. සෑම කෙනෙක්ම පරමාර්ථය දත්විට, එම පරමාර්ථයට ළං වීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීමට සෑම පුද්ගලයෙකුටම හැකි වේ. එවිට සෑම කෙනෙක්ම, දෙවියන්වහන්සේගේ පරමාර්ථයේ හා සැලැස්මේ තම කොටස ඉටු කිරීමට එක්සත්ව, එක්සිත්ව කටයුතු කරනු ඇත.

ස්වාමීන්වහන්සේගේ වැඩ කටයුතු සාක්ෂාත් කර ගැනීමට මිනිසුන් හා මුදල් යෙදවීම සඳහා වැදගත් වන්නේ පැහැදිලිව සන්නිවේදනය කළ හැකි දර්ශනයක් වේ. පහත දැක්වෙන්නේ මුළු ඇදහිලිවතුන් සමූහය වෙතම පරමාර්ථය සන්නිවේදනය කිරීම සඳහා යොදාගත හැකි මාර්ග කිපයකි.

1. පරමාර්ථ ප්‍රකාශය ලියා, එහි පිටපතක් සෑම කෙනෙකුටම දෙන්න.
2. අවම වශයෙන් වසරකට වරක්වත් පරමාර්ථය ගැන උගන්වන්න, දේශනා පවත්වන්න.
3. විධිමත් සැලසුම් සැසිවලදීත්, නොවිධිමත් රැස්වීම්වලදීත් පරමාර්ථය සාකච්ජා කරන්න.
4. නිතරම, සේවයේ යෙදී සිටින සියලුම නායකයින් එක් වී පරමාර්ථය සමාලෝචනය කරන බවට සහතික වන්න. මෙය, ඔවුන්ගේ සිත් තුළ දැක්ම අලුත් කිරීමට හේතු වනු ඇත.

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න

2. පරමාර්ථ ප්‍රකාශයක් යනු කවරේද?

3. පරමාර්ථ ප්‍රකාශයක් වැදගත් වන්නේ මන්ද?

4. පරමාර්ථයක් හා අරමුණක් අතර ඇති වෙනස කුමක්ද?

5. පරමාර්ථ ප්‍රකාශයක් හා දේවධාර්මික ප්‍රකාශයක් අතර වෙනස කුමක්ද?

6. සම්පූර්ණ ඇදහිලිවතුන් සමූහය කෙරෙහිම පරමාර්ථය සන්නිවේදනය කළ හැකි ක්‍රම සතරක් ලයිස්තුගත කරන්න.

7. මෙම පාඩමේ ඔබගේ අධ්‍යයනයේ කොටසක් වශයෙන් ඔබගේම පෞද්ගලික සේවය උදෙසා ඔබ පරමාර්ථ ප්‍රකාශයක් ලියුවෙහිද? ඔබගේ සභාවට හෝ කිතුනු සංවිධානයට හෝ පරමාර්ථ ප්‍රකාශයක් ඔබ ලියුවෙහිද?

(මෙම පරීක්ෂණයට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයෙන් පසු සපයා ඇත)

## තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. ඔබගේ සේවය සඳහා පරමාර්ථ ප්‍රකාශයක් දැනටමත් තිබේ නම්, එය පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම මගින් නැවත අධ්‍යයනය කරන්න.
   - පරමාර්ථ ප්‍රකාශය පහසුවෙන් තේරුම්ගැනීමට හැකිවන සේ පැහැදිලිව ලියා තිබේද?
   - එය ලියන ලද්දේ කවදාද?
   - එම පරමාර්ථ ප්‍රකාශය මගින් දැනට සේවයේ කෙරෙන දෙය සැබවින්ම පෙන්නුම් කෙරෙන්නේද?
   - එය බයිබලයට අනුකූලද?
   - මෙම පරමාර්ථය ඉටු කිරීමේදී ඔබගේ සේවය සාර්ථක වී ඇත්තේ කෙසේද?
   - එම පරමාර්ථය ඉටු කිරීමේදී ඔබගේ සේවය අසාර්ථක වී ඇත්තේ කෙසේද?
   - එය අසාර්ථක වූයේ මන්ද? මේ අසාර්ථකවීම් මග හරවා ගැනීමට කළ හැක්කේ කුමක්ද?
   - එම පෙදෙසේ සහභාගිකම් තුළින් එම පරමාර්ථය ප්‍රමාණවත් තරම් සන්නිවේදනය කර තිබේද?

මේවා නිර්ණය කිරීම සඳහා මෙම ප්‍රශ්න සලකා බලන්න.

- පසුගිය වසර දෙක ඇතුළත ඔබගේ නායකයන් මෙය අධ්‍යයනය කර තිබේද?
- පසුගිය වසරේ එය පදනම් කරගෙන දේශනාවක් කර තිබේද?
- පරමාර්ථ ප්‍රකාශය මුද්‍රණය කර ඔබ කණ්ඩායම් සාමාජිකයන් අතර බෙදා හැර තිබේද?
- සේවයේ පරමාර්ථය පවසන ලෙස සාමාජිකයන් කිහිප දෙනෙකුගෙන් ඉල්ලා සිටින්න. ඔවුන්ට එය කළ හැකි වූයේද?
- ඔබ සේවයට, සැලසුම්, වැඩ සටහන්, අය-වැය ලේඛන, හා අරමුණු තිබේ නම් ඒවා පරමාර්ථ ප්‍රකාශයට සම්බන්ධ ද? ඔබගේ පරමාර්ථ ප්‍රකාශය ඔබ සේවය කරන පරිසරයට සම්බන්ධ ද? එය දැනට පවතින ආත්මික අවශ්‍යතාවලට ගැළපේද?
- එය සුවිශේෂි වැඩ සටහන්, සේවයන් හා පිටත කෙරෙන වැඩ සටහන් ගැන සාකච්ඡා කිරීමට වඩා සේවය පවතින්නේ මන්දැයි සඳහන් කරන්නේද?
- එය අනාගත සේවය සඳහා අසීමිත අවස්ථා ලබා දේද? නැතහොත් එය සීමිතද?
- එය සුවිශේෂි ද? ඔබගේ ප්‍රකාශය බොහෝ දුරට සාමාන්‍ය නම් පරමාර්ථය ප්‍රමාණවත් තරම් ඉටුවේදැයි කීම අපහසු වනු ඇත.
- පරමාර්ථය නැවත ලිවිය යුතුද? එසේ නම් මෙම පාඩම් "පරමාර්ථ ප්‍රකාශයක් සකස් කිරීම" යන කොටසෙහි ඇති උපදෙස් අනුගමනය කරන්න.

2. දාවිත් රජතුමා තම ජීවිතයේ දී හා සේවයේ දී දෙවියන්වහන්සේගේ පරමාර්ථ සඳහා සේවය කළ බව ක්‍රියා 13:35 හි සඳහන් වේ. දාවිත්ගේ ජීවිතය ගැන 1 හා 2 සාමුවෙල් මගින් අධ්‍යයනය කර මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   - දාවිත් රජතුමා පරමාර්ථය සොයා ගත්තේ කෙසේද?
   - දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉටු කිරීමට ඔහු කළේ කුමක්ද?
   - දාවිත්ට ලිඛිත පරමාර්ථ ප්‍රකාශයක් තිබිණි නම්, එය කුමක් විය හැකිද?
   - දාවිත්, තම පරමාර්ථය ඉටු කිරීම සඳහා අරමුණු ලයිස්තුවක් ලියුවේ නම් එය කවරක් විය හැකිද?

3. හාවස්ටයිම් අන්තර්ජාතික ජාලයේ පරමාර්ථ ප්‍රකාශය මෙසේ වේ.

# හාවස්ටයිම් අන්තර්ජාතික ජාලය

## *පරමාර්ථ ප්‍රකාශය*

ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ නිරන්තරයෙන්ම උන්වහන්සේගේ ශ්‍රාවකයන්ගේ අවධාරණය යොමු කළේ ආත්මික අස්වැන්න ඇති කෙත් වතු වෙතය.

*තව සාර මසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේ යයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි. නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලාපල්ලා (යොහන් 4:35)*

ස්වාමීන්වහන්සේ අභියෝග කර ඇත්තේ ගොවියන්ටය. දේව රාජ්‍යය වෙනුවෙන් ආත්මික කුඹුරුවල ගොයම් කැපීමට දන්නා පුරුෂයන් හා ස්ත්‍රීන්ටය. හාවස්ටයිම් අන්තර්ජාතික ජාලය කැපවී ඇත්තේ මේ පරමාර්ථය උදෙසාය. එනම් පහත දැක්වෙන කාර්යයන් සඳහා හැකියාව ඇති අන්තර්ජාතික ගොයම් කපන්නන් ජාලයක් බඳවා ගැනීම, පුහුණු කිරීම, පෙළඹවීම හා ඒ කාර්යයන්වල යෙදවීම සඳහාය.

1. **අන්තර්ජාතික ආත්මික අස්වැන්නක් නෙලා ගැනීමට මැදහත් යාච්ඤා කිරීම.**
   *ගොයම නම් බොහෝය, නමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය. එබැවින් තමන් ගොයම් කැපීමට ගොවියන් එවන ලෙස ගොයමේ ස්වාමියාට යාච්ඤා කරපල්ලා (මතෙව් 9:37-38)*

2. **ආත්මික අස්වැන්නේ මූලධර්ම පැවසීම**

   *බොහෝ සාක්ෂිකරුවන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථ වූ විශ්වාස වූ මනුෂ්‍යයන්ට භාරදීපන්න (2 තිමෝති 2:2).*

3. **ආත්මික අස්වැන්නේ මූලධර්ම ආදර්ශනය කිරීම**

   *මාගේ කථාවත් මාගේ දේශනා කිරීමත් ප්‍රඥාවේ සිත් පොළඹවන්නා වූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේ ද බලයේ ද ප්‍රකාශ කිරීමෙන් විය. එසේ වූණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය (1 කොරින්ති 2:4-5).*

4. **ලොව පුරා ආත්මික අස්වැන්නක් සඳහා දී ඇති ආඥාවේ හදිසි අවශ්‍යතාව සන්නිවේදනය කිරීම**

   *ගොයම් කපන කාලය පසුවිය, ග්‍රීෂ්ම කාලය කෙළවර විය. එහෙත් අපි නොගැළවුණෙමුව (යෙරමියා 8:20).*

5. **ලොව පුරා අවසාන කාලයේ ඔවුන්ව පත් කර ඇති කෙත්වතුවල අස්වැන්න කපා ගැනීම සඳහා ක්‍රිස්තුන්වහන්සේගේ ශරීරයේ සාමාජිකයන් යොදා ගැනීම**

   *ගොයම් කැපීමට නියම සති අපට සලස්වා දෙන්නාවූ ... (යෙරමියා 5:24)*

# හතරවන පරිච්ඡේදය

## සැලසුම් කිරීම

**අරමුණු**

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට

- ❖ "අරමුණු" යන වචනය අර්ථ විග්‍රහ කිරීමට
- ❖ පරමාර්ථ සහ අරමුණු අතර වෙනස පැහැදිලි කිරීමට
- ❖ මූලික අරමුණු වර්ග දෙකක් හඳුනාගැනීමට
- ❖ අරමුණුවල වැදගත්කම සාකච්ඡා කිරීමට
- ❖ දිගු කාලීන හා කෙටි-කාලීන අරමුණු අතර වෙනස පැහැදිලි කිරීමට
- ❖ අරමුණු තෝරා ගන්නා ආකාරය පැහැදිලි කිරීමට
- ❖ පෞද්ගලික සේවා අරමුණු ලිවීමට
- ❖ සාමූහික සේවය සඳහා
- ❖ ඔබ ලියූ අරමුණු ඇගයීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **තමාගේ ස්වාමියාගේ කැමැත්ත දැනගනත් සූදානම් නොකළාවූ, ඔහුගේ කැමැත්ත ලෙස නොකළාවූ දාසයා බොහෝ පහර ලබන්නේය (ලූක් 12:47).**

### හැඳින්වීම

පසුගිය පාඩම් දෙකෙන් පෙන්වූයේ සේවය සඳහා පරමාර්ථයේ ඇති වැදගත්කමය. එහෙත් පරමාර්ථය හා දැක්ම ගැන නිරන්තරයෙන්ම ඔබට කතා කළ හැකි වුවද දැක්ම සාක්ෂාත් කිරීමට කෙදිනකවත් නොහැකි වීමට ඉඩ ඇත. ඔබගේ සේවය සඳහා වූ දෙවියන්වහන්සේගේ පරමාර්ථය දැන ගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. එය ඉටු කිරීම සඳහාද ඔබ සූදානම් විය යුතුය.

> **තමාගේ ස්වාමියාගේ කැමැත්ත දැනගනත් සූදානම් නොකළාවූ ඔහුගේ කැමැත්ත ලෙස නොකළාවූ දාසයා බොහෝ පහර ලබන්නේය (ලූක් 12:47).**

ඔබගේ සේවය සඳහා දෙවියන්වහන්සේගේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට ඔබ සූදානම්වන්නේ ප්‍රඥාවන්තව සැලසුම් කිරීමෙනි. මෙම පාඩමේ සහ ඉදිරි පාඩම් දෙකේ මාතෘකාව සැලසුම් කිරීම වේ.

මෙම පාඩමෙන් සැලසුම් කරන්නේ කෙසේද යන්න පිළිබඳව ඔබ ඉගෙන ගනු ඇත. සැලසුම් ක්‍රියාත්මක කරන ආකාරය පස්වන පරිච්ඡේදයෙන් ද ඒවා අගයන ආකාරය හයවන පරිච්ඡේදයෙන් ද පැහැදිලි වේ.

### අරමුණු

"අරමුණු" යනු ඉලක්කයකි නැතහොත් ක්‍රියාවක අවසානයයි. එමෙන්ම එය ළඟා කරගත හැකි අභිප්‍රායකි. එය සැලැස්මකි. ඔබ, ඔබගේ සේවය සඳහා අරමුණු පිහිටවූ විට ඔබ කරනුයේ දෙවියන්වහන්සේගේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා සංවිධානාත්මක සැලසුම් සකස් කිරීමය. එසේ කිරීමට ඔබ සචේතනිකවම තීරණයක් ගත්තත් නොගත්තත් ඔබ සැලසුම් කරන්නෙහිය. සෑම දිනකම ඔබ යම් යම් කාර්යයන් හි නියැලේ. සචේතනිකවම ඔබ ඒ ගැන සිතුව ද නොසිතුව ද එය ඔබගේ එදින සැලැස්ම වේ. අරමුණු ඇතිව සැලසුම් කිරීම යනු ඔබ දැනටමත් කරන දෙය සංවිධානාත්මකව කිරීමය. එය සෑම දිනකටම යොමුවක් හා මඟපෙන්වීමක් ගෙන දීමට උපකාරී වේ. එය ඔබගේ ක්‍රියාකාරකම් සේවයේ පරමාර්ථය හා සුසංගත කරයි. සැලසුම් කිරීම යනු ස්වාමීන්වහන්සේට කීකරු වීමේත් ඔබගේ ජීවිතය හා සේවය සඳහා උන්වහන්සේගේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමේත් මාර්ගයකි.

අරමුණු යනු ශුද්ධ ආඥා නොවේ. ඒවා අනාගතය වෙනුවෙන් ඔබ කරන කැපවීම වේ. ඒවා ඔබේ අනාගතය තීරණය කරන්නේ නැත. ඒවා දෙවියන්වහන්සේගේ කාර්යයන් කිරීම සඳහා දෙවියන්වහන්සේගේ සෙනඟ සංවිධානය කරන ක්‍රමයකි.

### පරමාර්ථය හා අරමුණු

පරමාර්ථය හා අරමුණු අතර වෙනසක් ඇත. පරමාර්ථය යනු මූලිකවම ආත්මික දර්ශනයක් බව ඔබ උගත්තෙහිය. එය සේවය සඳහා ඔබගේ සුවිශේෂි හේතු දෙවියන්වහන්සේගේ සැලැස්මේ ඔබගේ කොටස දැනගැනීම වේ.

අරමුණු යනු දෙවියන්වහන්සේ ඔබට දී ඇති පරමාර්ථය ඉටු කිරීම සඳහා ඔබ ගන්නා පියවර වේ. ඒවා පරමාර්ථය සාක්ෂාත් කර ගන්නා සැලසුම්ය. පරමාර්ථය හා දර්ශනය ඒවා පවතින නිසාම සම්පූර්ණ නොවේ. ඒවා ඉටු කිරීම සඳහා ඔබ ක්‍රියා මාර්ග ගත යුතුය. පරමාර්ථය ඔබව පොළඹවයි. එහෙත් අරමුණු දර්ශනය සාක්ෂාත් කිරීමට ඔබව ඉදිරියට ගෙන යයි. පරමාර්ථය ඇදහිල්ල වැනිය. අරමුණු ක්‍රියාවන් වැනිය. සැලසුම් නොමැති පරමාර්ථය ඵලදායි නොවේ. එය ක්‍රියාවන් නොමැති ඇදහිල්ල මිය ගියාක් මෙනි. දෙවියන්වහන්සේගේ සැලැස්මේ ඔබගේ පරමාර්ථය කෙතරම් ශ්‍රේෂ්ඨදයත් එය ඉටු කිරීම සඳහා ඔබගේ මුළු ජීවිත කාලයම ගත කිරීමට සිදුවනු ඇත. සැලසුම් යනු දෙවියන්වහන්සේ ඔබට දී ඇති දර්ශනය සම්පූර්ණ කිරීම පිණිස ඔබ ගන්නා කුඩා පියවර වේ. මෙය අවබෝධ කර ගැනීමට උපකාරී වන රූප සටහනක් පහත දැක්වේ.

අරමුණු → අපගේ සුවිශේෂි පරමාර්ථය | දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ පරමාර්ථය | ලෝකය දිනා ගැනීම

රූප සටහන දෙස පරෙස්සමෙන් බලන්න. දෙවියන්වහන්සේගේ පරමාර්ථයේ කොටසක් වන ඔබගේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුණු උපකාරී වන ආකාරය ඉන් දැක්වේ. ක්‍රිස්තුන්වහන්සේගේ ශරීරයේ සෑම කොටසක්ම තමන්ගේ සුවිශේෂි පරමාර්ථය සාක්ෂාත් කරන්නේ නම්, ලෝකයට ශුභාරංචිය ගෙන යෑමේ දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ පරමාර්ථය සම්පූර්ණ වනු ඇත.

### පාවුලුතුමාගේ අරමුණු

තෙවෙනි පරිච්ඡේදයෙන් ඔබ උගත් පාවුලුතුමාගේ "පරමාර්ථ ප්‍රකාශය" අපි නැවත සලකා බලමු. ඔහු මෙසේ පැවසීය.

මාගේ සේවයේ පරමාර්ථය වන්නේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ නාමය:

--- අන්‍යජාතීන් ද (ඉශ්‍රායලය හැර අනෙක් ජාතීන්)
--- රජුන් ද (නායකයන්)
--- ඉශ්‍රායෙල් පුත්‍රයන් වෙතට ගෙන යාමට වේ (ක්‍රියා 9:15)

දෙවියන්වහන්සේ, තමන්වහන්සේග් පරමාර්ථය සාක්ෂාත් කරගැනීම සඳහා පාවුලුතුමාට දුන් සැලැස්ම, එනම් පාවුලුතුමාගේ අරමුණු මෙසේය.

මා සේවයේ යෙදෙමින් සාක්ෂි දරන්නේ:

--- ඔවුන්ගේ ඇස් විවෘත කිරීමට
--- ඔවුන්ව අඳුරෙන් ආලෝකයට ගෙන ඒමට
--- ඔවුන්ව සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතට හැරවීමට
--- පාපයෙන් කමාව ලැබීමට මඟපෙන්වීමට
--- ආත්මික උරුමය වෙතට මඟපෙන්වීමට වේ. (ක්‍රියා 26:15-18 බලන්න)

## අරමුණු වර්ග

මූලික අරමුණු වර්ග දෙකක් ඇත.

**පෞද්ගලික අරමුණු:** මේවා ඔබගේම සේවා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට ඔබ සකස් කරන සැලස්ම් වේ.

**කණ්ඩායම් අරමුණු:** මේවා ඔබගේ සාමූහික සහභාගිත්වය, සභාව, නිකාය, සංවිධානය ආදියේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අන් අය සමඟ කරන සැලැසුම් වේ.

## ඇදහිල්ලේ ප්‍රකාශය

අරමුණු යනු අනාගතයේදී ඔබ කිරීමට බලාපොරොත්තුවන දේ පිළිබඳ ප්‍රකාශ බැවින්, ඒවා දෙවියන්වහන්සේගේ කැමැත්ත සමඟ සුසංගත වන ඇදහිල්ලේ ප්‍රකාශ වේ.

> **ඇදහිල්ල නම් බලාපොරොත්තු වන දේවල් ගැන සහතිකයය, නොදක්නා දේවල් ගැන ඔප්පුවය (හෙබ්‍රෙව් 11:1).**

ඔබගේම ආත්මාර්ථකාමී සැලසුම් ඔබ සාදන්නේ නැත. ඔබ සැලසුම් සකස් කරන්නේ දෙවියන්වහන්සේගේ පරමාර්ථය සම්පූර්ණ කිරීමටය. උන්වහන්සේගේ මඟපෙන්වීමට ඔබ සෑම විටම විවෘතය.

> **මක්නිසාද හෙට මක්වේද යන්න නුඹලා දන්නේ නැත. නුඹලාගේ ජීවිතය මොකක්ද? නුඹලා ස්වල්ප වේලාවක් පෙනී පසුව නොපෙනී යන මීදුමක්ය. එබැවින් ස්වාමීන්වහන්සේ කැමතිසේක් නම්, අපි ජීවත්ව මේකවත් ඒකවත් කරන්නෙමු යයි නුඹලා විසින් කිය යුතුය (ජාකොබ් 4:14-15).**

අරමුණු ඇදහිල්ලේ ප්‍රකාශ බැවින්, ඒවායේ අවදානමක් ඇත. ඔබ ඇදහිල්ලෙන් පියවරක් තබා ක්‍රියා කිරීම ආරම්භ කළ යුතුය. දෙවියන්වහන්සේ අනාගතය දන්නා බැවින්, සැලසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රඥාව දීමට උන්වහන්සේට පුළුවන.

## අරමුණුවල වැදගත්කම

ඔබගේ සේවය සඳහා වූ දෙවියන්වහන්සේගේ සුවිශේෂී පරමාර්ථ සාක්ෂාත් කරගැනීමට අරමුණු ඉඩ සලයසි. අරමුණු තිබීමේ ප්‍රධාන හේතුවක් වන්නේ, ඔබගේ පරමාර්ථය ඉටු කිරීම සඳහා කළ යුතු දේ කිරීමට උපකාරී වීමය. යම් දෙයක් ඉබේ සිදුවීමට ඉඩ හැරීමට වඩා අවශ්‍ය ආකාරයට ඉටු කිරීමට සැලසුමක් තිබීම උපකාරයකි. සැලසුමක්, යම් දෙයක් සඳහා හදිසි ප්‍රතිචාරයක් දැක්වීම වෙනුවට කිසියම් පරමාර්ථයක් ඇතිව ක්‍රියා කිරීමට ඉඩ සලසයි.

අරමුණු මඟපෙන්වීමක් සපයයි. කළයුතු දෙය අරමුණු මගින් හඳුන්වා දෙන බැවින්, සෑම කෙනෙක්ම සැලැස්ම දනියි. පොදු ඉලක්කයක් කරා මඟපෙන්වීමක් හා කැපවීමක් ඇති බවක් සියල්ලන්ට හැඟෙයි. ව්‍යාකූලත්වය මඟහැරේ. ඔබ යන්නේ කොතැනටදැයි නොදන්නෙහි නම් මඟපෙන්වීම අසීරුය. අරමුණු මගින් ඔබ යන තැන දැනුවත් කෙරේ. ඔබ කල් ඇතිවම සැලසුම් කරන බැවින්, පැමිණිය හැකි ගැටලු පිළිබඳව බලාපොරොත්තුවක් ඇතිව, ඒවා පැමිණීමට ප්‍රථම විසඳුම් සකස් කළ හැකිය. ඔබට ආරක්ෂාකාරී ආත්මික සටනක නොව ආක්‍රමණශීලී ආත්මික සටනක යෙදිය හැකිය.

ක්‍රිස්තුන්වහන්සේගේ ශරීරය තුළ තම සේවා ස්ථානය සොයා ගැනීමට අරමුණු අපට උපකාරී වේ. එක් එක් කෙනා කළ යුතු දෙය අරමුණු මගින් හඳුන්වා දෙන බැවින්, සේවයේ යෙදී සිටින සෑම කෙනෙක්ම තමාගේ සුවිශේෂී කාර්යය දන්නේය. එබැවින් එක්සත් පරමාර්ථයක් හා සැලසුමක් වෙනුවෙන් සියලුම සහභාගිත්වයේ ඇදහිලිවතුන් එක්රැස් කිරීමට පුළුවන.
අරමුණු සේවය ඇගයීමට ඉඩ සලසයි. ඔබගේ සැලසුම් පරීක්ෂා කර, ඒවා ඔබගේ සේවය සඳහා වූ දෙවියන්වහන්සේගේ පරමාර්ථ ඉටු කරන්නේ දැයි බැලිය හැකිය. ඔබ මේ පිළිබඳව හයවන පරිච්ඡේදයෙන් වැඩි දුරටත් ඉගෙන ගන්නවා ඇත. සේවය වෙනත් පැත්තකට යොමුවීම, අරමුණු මගින් වළක්වයි. ඔබට අරමුණු නොතිබුනි නම් ජීවිත කාලයක් වැඩ කර එක්වරම "මා දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉටු කර නැතැ" යි පිළිගනු ඇත. ඔබ සැලැස්මක් හෝ

සංවිධානයක් හෝ නොමැතිව, සේවය ඇගයීමක් නොකර වෙනත් මං ඔස්සේ ලිස්සා යෑම නිසා අසාර්ථක වී ඇත.

ඔබගේ චේතනාවන් හඳුනාගැනීමට සැලසුම් කිරීම උපකාරී වේ. චේතනාව යනු ඔබ යමක් කිරීමේ හේතුව වේ. ඔබගේ සේවයේ සෑම ක්ෂේත්‍රයකම අරමුණු හා චේතනා ඔබ විමසා බලන බව ඔබට පෙනෙනු ඇත. "මේ දේශනාව දේශනා කිරීමේ මාගේ අරමුණ කුමක්ද?," "මේ රැස්වීම පැවැත්වීමේ මාගේ අරමුණ කුමක්ද?", "මේ පාඩම ඉගැන්වීමේ මාගේ අරමුණ කුමක්ද?", "මේ පුද්ගලයාට උපදෙස් දීමේ මාගේ අරමුණ කුමක්ද?", "මේ ලිපිය ලිවීමේ අරමුණ" ආදී වශයෙන් ප්‍රශ්න කිරීමට ඔබ පෙළඹෙනු ඇත. මෙසේ වන්නේ ඔබ කරන සෑම ක්‍රියාවක්ම ඔබගේ සේවයේ පරමාර්ථයට අදාළව ඔබ ඇගයීමක යෙදෙන බැවිනි.

## අරමුණු තෝරාගැනීම

අරමුණු සකස් කළ යුත්තේ, යාච්ඤාවෙන්, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීමෙන්, දේව වචනය අධ්‍යයනයෙන් හා දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ ඔබගේ සුවිශේෂී පරමාර්ථය අවබෝධ කරගැනීමෙන් වේ. සැලසුම් කිරීම යාච්ඤාවට හා බයිබල් අධ්‍යයනයට ආදේශයක් නොවේ. යාච්ඤාවේ හා බයිබල් අධ්‍යයනයේ ප්‍රතිඵලය සැලසුම් කිරීම විය යුතුය. සැලසුම් කිරීම, පරමාර්ථයට ද බැඳී පැවතිය යුතුය.

ඔබ සේවය කරන ප්‍රදේශයේ හා සෙනඟගේ ආත්මික අවශ්‍යතා, පරිසර විශ්ලේෂණයක් මගින් එළිදරව් වන අයුරු ඔබ පසුගිය පාඩමෙන් උගත්තෙහිය. සේවයේ පරමාර්ථය, මෙම අවශ්‍යතා වලටද දෙවියන්වහන්සේගේ පරමාර්ථයටද සම්බන්ධ විය යුතු ආකාරය ද ඔබ උගත්තෙහිය. සැලසුම් කිරීම සඳහා යාච්ඤාව, බයිබල් අධ්‍යයනය, හා පරමාර්ථය පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වේ. මේවා නොමැතිව ඔබ සැලසුම් කරන්නේ මිනිස් සිතුවිලි අනුවය. ඔබගේ මාර්ගය දෙවියන්වහන්සේගේ මාර්ගය නොවේ.

> **මක්නිසාද මාගේ යෝජනා නුඹලාගේ යෝජනා නොවේය. නුඹලාගේ මාර්ග ද මාගේ මාර්ග නොවේයයි ස්වාමීන්වහන්සේ කියන සේක.**
>
> **අහස පොළොවට වඩා උස්ව තිබෙන්නාක් මෙන් මාගේ මාර්ග නුඹලාගේ මාර්ගවලටත් මාගේ යෝජනා නුඹලාගේ යෝජනාවලටත් වඩා උසස්ව තිබේ. (යෙසායා 55:8-9)**

ලූක් 12:16-20 හි සඳහන් පොහොසත් තරුණයාගේ වැරැද්ද ඔහු "ඔහු තුළම සිතීම" වේ. ඔහු සැලසුම් සකස් කළේ දෙවියන්වහන්සේගේ මඟපෙන්වීමක් නොමැතිව වේ.

ඔබ වෙනුවෙන් දෙවියන්වහන්සේට ඇති සැලැස්ම උන්වහන්සේ දැනටමත් දන්නා සේක. ඔබගේ වගකීම වන්නේ උන්වහන්සේගේ සැලැස්ම අවබෝධ කරගෙන ඒ අනුව ක්‍රියා කිරීමය.

> **මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි. නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනා යයි ස්වාමීන්වහන්සේ කියන සේක. (යෙරමියා 29:11)**

අරමුණු ඔබ තෝරාගන්නා බැවින්, සැලසුම් කිරීමේදී තීරණ ගැනීමට සිදුවේ. ඔබ ඇතැම් දේ කිරීමටත්, ඇතැම් දේ නොකිරීමටත් තීරණය කරනු ඇත. ඔබ ප්‍රමුඛතා පිහිටුවනු ඇත. ප්‍රමුඛතා යනු එක් දෙයකට වඩා වැදගත් තවත් දෙයකි. ලූක් 12:16-20 කොටසෙහි "තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා" යන කොටස යෝග්‍ය ප්‍රමුඛතාවල වැදගත්කම පෙන්වා දෙයි.

හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "*බයිබලීය කළමණාකරන මූලධර්ම*" හා "*දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම*" යන පාඨමාලාවල දී ඇති බයිබලීය තීරණ ගැනීමේ මූලධර්ම නැවත අධ්‍යයනය කිරීම ඔබට අවශ්‍ය විය හැකිය. සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ දී තීරණ ගැනීමට ඒවා ඔබට උපකාරී වනු ඇත.

## අරමුණු සකස් කිරීම

සේවය සඳහා අරමුණු සකස් කිරීමේ මාර්ග නිර්දේශ කිහිපයක් පහත දැක්වේ.

**අරමුණු ලිවිය යුතුය:**

> **දර්ශනය කියවන්නා ඉක්මනින් කියවන්ට පුළුවන් වන පිණිස එය ලෑලිවල පැහැදිලි ලෙස ලියන්න (හබක්කුක් 2:2)**

ඔබ අරමුණු ලියූ විට, ඒවා මතක තබා ගන්නත්, ක්‍රියාත්මක කරන්නත් ඔබගේ සැලැස්ම අගයන්නත් පහසු වේ. දෙවියන්වහන්සේගේ ආභාෂය යටතේ දේවමාලිගාව සැලසුම් කළ විට දාවිත් කළේ ද ඒ දේමය. දාවිත් මෙසේ පැවසිය.

> **මේ සටහනේ සියලු වැඩ තේරුම් කර දුන්නාවූ ස්වාමින්වහන්සේගේ අතින් මා ලවා සියල්ලම ලියවා තිබේ යයි දාවිත් කීවේය. (1 ලේකම් 28:19)**

**අරමුණු, පරමාර්ථය හා සම්බන්ධ විය යුතුය.**

මෙය සැලසුම් කිරීමේ ඉතා වැදගත් අංගයකි. ඔබගේ සේවයේ පරමාර්ථය හා බැඳි සැලසුම් ඔබ සකස් නොකරන්නෙහි නම්, ඔබ යහපත් වැඩ කළද ඒ ඔබට දෙවියන්වහන්සේ දී ඇති ඒවා නොවේ. ඔබගේ සියලුම අරමුණු පරමාර්ථය හා බැඳී පවතින්නේ නම්, එවිට ඒවා එකිනෙකට බැඳී පවතින අතර, සේවයේ පොදු සැලැස්මක් අනුව එකට ක්‍රියාකරනු ඇත. ඔබ සකස් කරන සෑම සැලසුමක්ම ඔබගේ පරමාර්ථය හා සුසංගත වේ.

ඔබගේ පරමාර්ථය දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා සුසංගත වන්නේ නම් හා ඔබ සකස් කරන සැලසුම් ඔබගේ පරමාර්ථය හා සුසංගත වේ නම්, එවිට ඔබගේ අරමුණු බයිබලයට අනුකුල වනු ඇත.

**අරමුණු පැහැදිලිව සටහන් කළ යුතුය.**

අරමුණු පැහැදිලිව ලියා නොමැති නම්, ඒවා කිසිවෙකුට අවබෝධ කරගත නොහැකි වනු ඇත. සෑම අරමුණක්ම පැහැදිලිව ලියන්න. සැලසුම අවබෝධ කර ගැනීමට පහසු කරන්න. හබක්කුක් 2:2 මගින් පෙන්වා ඇත්තේ, සෙනඟ පොළඹවනු ලබන්නේ අවබෝධ කරගත හැකි දර්ශනවලින් පමණක් බව යයි යන්න මතක තබා ගන්න.

**අරමුණු සමබර විය යුතුය.**

සැලසුම්, ඇදහිල්ල හා යථාතත්වය අතර සමබරව පැවතිය යුතුය. ඒවා යථාතත්වයේ නොපවතී නම් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වනු ඇත. එහෙත් ඒ සමඟම, ඔබට ඇති සම්පත්, ස්වභාවික චින්තනය, පෞද්ගලිකත්වය හෝ මූල්‍යමය සම්පත් මගින් සීමා නොවන්න. ඇදහිල්ලේ අසීමිත සැලසුම් පිහිටුවන්න.

> **මනුෂ්‍යයන්ට නම් නුපුළුවන, නමුත් දෙවියන්වහන්සේට එසේ නොවේය. මක්නිසාද දෙවියන්වහන්සේට සියල්ලම පුළුවන. (මාක් 10:27)** බව මතක තබා ගන්න.

**අරමුණු නිශ්චිත විය යුතුය.**

සැලසුම් නිශ්චිත විය යුතුය. ඒවා පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන බව ඉන් අදහස් වේ.

- අප කරන්නට යන්නේ කුමක්ද? ඔබ කරන දෙය සුවිශේෂිව ලියන්න.
- අප එය කරන්නට යන්නේ කෙසේද? සැලැස්ම සාක්ෂාත් කර ගැනීමට ඔබ ගන්නා ක්‍රියා පිළිවෙත් හා ක්‍රම නිශ්චිතවම කවරේද?
- එය කරන්නේ කවදාද? ආරම්භ කරන දිනයත් අවසන් කරන දිනයත් හා සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කරන කාලයත් සකස් කරන්න.

- එය කරන්නේ කවුරුන්ද? මේ සැලැස්ම ක්‍රියාත්මක වීමට එක් එක් කෙනා කරන සුවිශේෂි කාර්යයන් කවරේද? මෙය ඵලදායිව කිරීමට ආත්මික දීමනා ඇත්තේ කාටද? මේ සඳහා සහභාගි වන අය එක්සත්ව වැඩෙහි යෙදෙන්නේ කෙසේද?

- මෙහි වියදම කොපමණද? අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යන වියදම තක්සේරු කරන්න. ඔබ මෙය කරන විට අය වැය ලේඛණයක්, එනම් සැලැස්ම සම්පූර්ණ කිරීමට යන වියදම් තක්සේරුවක් සකස් වේ.

ඔබ අරමුණු පදනම් කරගෙන සේවා අරමුදල්වල අය වැය ලේඛණයක් සකස් කරන්නේ නම්, හා ඔබේ අරමුණු ඔබේ පරමාර්ථ සමඟ සුසංගත වේ නම්, එවිට ඔබ සෑම වේලෙහිම සේවා අරමුදල් ඔබගේ පරමාර්ථය සාක්ෂාත් කිරීම සඳහා යොදවනු ඇත. එසේ නොමැති වුවහොත් ඔබ අරමුදල් ප්‍රඥාවන්තව භාවිත කරන්නේ නැත.

"*බයිබලීය කළමණාකරන මූලධර්ම*" නමැති භාවස්ටයිම් අන්තර්ජාතික ආයතන පාඨ මාලාව, සේවා අරමුදල් නියමාකාරව භාවිත කිරීම සඳහා ඔබට උපකාරී වන මූල්‍යමය ශුද්ධලියවිලි මූලධර්ම හඳුන්වා දෙයි (මෙම අත්පොතේ ඇමුණුමේ අය-වැය ලේඛණයක නිදසුනක් දී ඇත).

**අරමුණු මැණිය හැකි විය යුතුය.**

මින් අදහස් වන්නේ, සැලැස්ම සාක්ෂාත් කර ගත්තද නොගත්තද ඒවා ඇගයීමට හැකි වන සේ ලිවිය යුතු බවය. ඔබ හයවන පරිච්ජේදයෙන් ඇගයීම පිළිබඳව තව දුරටත් ඉගෙන ගන්නවා ඇත.

ඔබ කරන දෙයෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිශ්චිතවම සිදුවේයයි බලාපොරොත්තු වන දේ අරමුණකින් සඳහන් විය යුතුය. ඉන් ඔබගේ අරමුණු ඉටුවී ඇත්දැයි, ඇගයීම් කර තීරණය කිරීම පහසු වේ. විනිශ්චය කිරීම සඳහා පූර්ව ප්‍රමිතියක් නොමැතිව සේවයේ ප්‍රතිඵල මැණිය නොහැකිය.

**ප්‍රමුඛතාවය අනුව අරමුණු පෙළගැස්විය යුතුය.**

සේවය සඳහා ඔබට අරමුණු කිහිපයක් තිබිය හැකිය. එබැවින් ඔබ ඒවා ප්‍රමුඛතාවය අනුව සංවිධානය කළ යුතුය. ඔබ පළමුව අවසන් කරන්නේ කුමන සැලසුම් ද? අනෙකුත් සම්බන්ධිත සැලසුම් සම්පූර්ණ කිරීමට පෙර කුමන අරමුණු ඉටු කිරීම අවශ්‍යද? නිදසුනක් වශයෙන් හැරුනු අයට සභාවක් පිහිටුවිය යුත්තේ ඒ ගම එවැන්ජලිස්ත කළ පසුවය.

**දිගු-කාලීන හා කෙටි-කාලීන අරමුණු දෙවර්ගයම ඇතුළත් කරන්න.**

සැලසුම් කිරීම කාලයක් ගතවන ක්‍රියාවලියකි. මේ නිසා හැකි තරම් කලින් ඔබ සැලසුම් කළ යුතුය. සැලසුම් කිරීම අනාගතයට සම්බන්ධය. අනාගත වර්ග දෙකක් තිබේ.

**සමීප අනාගතය:** ඊළඟ දින, සති හා මාස කීපය සමීප අනාගතය වේ. ඔබ මේ කාලය සඳහා "කෙටි-කාලීන" සැලසුම් සකස් කළ යුතුය. මේවා ඔබ දැන්මම ක්‍රියාත්මක කරන සැලසුම් වේ.

**ඈත අනාගතය:** ඈත අනාගතය යනු ලබන අවුරුද්ද හා ඊළඟ අවුරුදු වේ. ඔබ ඈත අනාගතය සඳහා "දිගු-කාලීන" සැලසුම් පිහිටුවිය යුතුය. මේවා ඔබට දැන් යාච්ඤා කළ හැකි හා සූදානම් කිරීම ආරම්භ කළ හැකි අනාගත සැලසුම් වේ. ඔබ සැබවින්ම ඒ පිළිබඳව ක්‍රියා කරන්නේ පසුව වේ.

ඵලදායි සේවයක් සඳහා ඔබ කෙටි-කාලීන මෙන්ම දිගුකාලීන සැලසුම් ද සකස් කළ යුතුය. ඔබ එසේ කළ විට දැන් කළ යුත්තේ කුමක්ද හා අනාගතයේදී කළ යුත්තේ කුමක්ද යන්න ඔබ දැනගනු ඇත. "උන්වහන්සේ එනතුරු රැඳී සිටිය යුතු" බව බයිබලය අපට උගන්වයි. මින් අදහස් වන්නේ දෙවියන්වහන්සේගේ රාජ්‍යය සඳහා දැන්ද මතුවටද, යේසුස්වහන්සේ පැමිණ අපව ස්වර්ගයට ගෙන යන තෙක් අප සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කළ යුතු බවය.

**සැලසුම් කිරීම ක්‍රියාවලියකි**

සැලසුම් සුනම්‍ය විය යුතු අතර වෙනස්වීම්වලට විවෘත විය යුතුය. සැලසුම් කිරීම ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මඟපෙන්වනු ලබන ක්‍රියාවලියකි. ප්‍රේරිතවූ පාවුල් එක්තරා කාලයක ආසියාවට යෑමට සැලසුම් කළේය. එහෙත් එය සුදුසු කාලය නොවන බව ශුද්ධාත්මයාණන්වහන්සේ එළිදරව් කළ සේක. එවිට පාවුලුතුමා සැලසුම වෙනස් කර පසු කලෙක එහි ගියේය (ක්‍රියා 16:6).

ඔබ සැලසුමක් සකස් කළ පසු, පරිසරයේ හෝ ඔබගේ සේවයේ හෝ වෙනස්වීම් සිදුවිය හැකිය. නැතහොත් වඩා හොඳ සැලැස්මක් එළිදරව් විය හැකිය. යම් ගැටලු නිසා මුල් සැලැස්ම වෙනස් කිරීමේ අවශ්‍යතාව මතුවිය හැකිය. සැලසුම සුනම්‍ය විය යුත්තේ එබැවිනි. අවශ්‍යතාව අනුවත්, දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම අනුවත් සැලසුම් වෙනස් කිරීමට ඔබ විවෘත විය යුතුය. අරමුණු සංශෝධනය කිරීමටත් අලුත් අරමුණු නිර්මාණය කිරීමටත් පහත දැක්වෙන කරුණු හේතු විය හැකිය.

- ඔබ සේවය කරන පරිසරය වෙනස්වීම නිසා ඔබගේ සැලසුම් වෙනස් කිරීමට සිදුවේ. නිදසුනක් වශයෙන්, අනාථයන් විශාල සංඛ්‍යාවක් ඔබ සේවය කරන පෙදෙසට පැමිණිය හොත් ඔබගේ සේවයට ඒ අයද ඇතුළත් කිරීමට ඔබගේ සැලසුම් වෙනස් කිරීමට සිදුවේ.

- ඔබ සැලසුම් සම්පූර්ණ කළ නිසා අලුත් ඒවා අවශ්‍ය විය හැකිය. නිදසුනක් වශයෙන් එක්තරා ගමක, ඔබගේ අරමුණව පැවති අලුත් සභාවක් පිහිටුවීම ඔබ ඉටු කර අවසානය. දැන් ඔබ කරන්නේ කුමක්ද?

- සැලසුම වෙනස් කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ මඟපෙන්විය හැකිය.

- ඔබ සකස් කළ සැලසුම්, ඔබ ජීවිතයේ හා සේවයේ දෙවියන්වහන්සේගේ පරමාර්ථ ඉටු නොකරන බවක් ඔබට පෙනෙනු ඇත. එවිට ඒවා සංශෝධනය කිරීමට ඔබට සිදුවේ.

### ආදර්ශ අරමුණු

මෙම පාඩමේ "තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා" යන කොටසේ ඔබට අධ්‍යයනය කිරීම පිණිස ආදර්ශ අරමුණු ඇත. නිරවද්‍ය හා සාවද්‍ය නිදර්ශන එහි ඇත. මෙම පාඩම තව දුරටත් අධ්‍යයනය කිරීමට පෙර එම නිදර්ශන අධ්‍යයනය කරන්න. ඔබ මේ දක්වා අධ්‍යයනය කළ දේ අවබෝධ කර ගැනීමට එම නිදර්ශන උපකාරී වේ.

### ඔබගේ පෞද්ගලික අරමුණු ලිවීම

1. තෙවන පරිච්ඡේදයට පෙරලන්න. ඔබගේ පෞද්ගලික සේවය සඳහා ඔබ ලියූ පරමාර්ථ ප්‍රකාශය නැවත බලන්න.

2. ඔබගේම පෞද්ගලික සේවය සඳහා අවම වශයෙන් කෙටි-කාලීන අරමුණු තුනක්වත් ලියන්න.

3. ඔබගේම පෞද්ගලික සේවය සඳහා අවම වශයෙන් දිගු-කාලීන අරමුණු තුනක්වත් ලියන්න.

## සේවා අරමුණු ලිවීම

1. තෙවන පරිච්ඡේදයට පෙරලන්න. ඔබගේ සභාවට, සහභාගිත්වයට හා සංවිධානයට ඔබ ලියූ පරමාර්ථ ප්‍රකාශය නැවත බලන්න.

2. ඔබ සම්බන්ධ සාමුහික සේවය සඳහා අවම වශයෙන් කෙටි-කාලීන සේවා අරමුණු තුනක්වත් ලියන්න. මෙම කණ්ඩායම් අරමුණු සකස් කිරීම සඳහා ඔබගේ සහභාගිත්වයේ අනෙකුත් නායකයන් මුණ ගැසීමට ඇතැම් විට ඔබට අවශ්‍ය විය හැකිය.

3. ඔබ සම්බන්ධ සාමුහික සේවය සඳහා අවම වශයෙන් දිගු-කාලීන සේවා අරමුණු තුනක්වත් ලියන්න. මෙම කණ්ඩායම් අරමුණු සකස් කිරීම සඳහා ඔබගේ සහභාගිත්වයේ අනෙකුත් නායකයන් මුණ ගැසීමට ඇතැම් විට ඔබට අවශ්‍ය විය හැකිය. ඔබගේ සැලසුම් ලිවීම සඳහා, මෙම පාඩමේ "තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා" යන කොටසෙහි සපයා ඇති අරමුණු සැකසීමේ කාර්ය පත්‍රිකාව භාවිත කරන්න.

## අරමුණු ඇගයීම

පහත දැක්වෙන සැසඳුම්-ලයිස්තුව භාවිත කරමින් ඔබ ලියූ අරමුණු අගයන්න.

1. ඔබගේ අරමුණු පැහැදිලිද, කෙටිද, පහසුවෙන් තේරුම්ගත හැකිද?
2. සෑම අරමුණකින්ම එක් ඉලක්කයක් පමණක් සඳහන් කරයිද?
3. සෑම අරමුණක්ම නිශ්චිත සැලසුමක් දක්වයිද?
    - කළ යුතු දේ කුමක්ද?
    - කරන්නේ කෙසේද? (ක්‍රියාකාරී පියවර හා ක්‍රමයන්)
    - කරන්නේ කවදාද? (ආරම්භය, සම්පූර්ණ කිරීම, හා ප්‍රගති දින)
    - කවුරුන් විසින්ද?
    - වියදම කොපමණද?
4. සෑම අරමුණක්ම මැනිය හැකිද? ඔබ සැබවින්ම සැලැස්ම සාක්ෂාත් කර ඇත්දැයි බැලීමට ඇගයීමක් කළ හැකිද?
5. ඔබ කෙටි-කාලීන මෙන්ම දිගු-කාලීන සැලසුම් සකස් කර තිබේද?
6. ඔබගේ අරමුණු සේවා-පරමාර්ථවලට සම්බන්ධද?
7. ඔබගේ පෞද්ගලික අරමුණු, ඔබ සම්බන්ධ සාමුහික සේවයේ අරමුණු හා සුසංගත වේද? (එනම් ඔබගේ සභා සහභාගිත්වය, නිකාය, සංවිධානය ආදිය)
8. මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මුදලින්, කාලයෙන් ආදියෙන් කැපවීමට ඔබ කැමතිද?
9. මෙම අරමුණ වෙත ළඟාවීමට ඔබට දෙවියන්වහන්සේගේ උපකාරය ඉල්ලිය හැකිද? එය උන්වහන්සේගේ සැලැස්මේ, උන්වහන්සේගේ පොදු පරමාර්ථ හා ඔබගේ සුවිශේෂී පරමාර්ථය සමඟ සුසංගත වන්නේ නම් ඔබට එය කළ හැකිය.

**ස්වයං පරීක්ෂණය**

1. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

2. "අරමුණ" යන වචනය අර්ථවිග්‍රහ කරන්න.

3. පරමාර්ථය හා අරමුණ අතර වෙනස කුමක්ද?

4. මූලික අරමුණු වර්ග දෙකක් හඳුන්වන්න.

5. අරමුණු වැදගත් වන්නේ මන්ද?

6. දිගු-කාලීන හා කෙටි-කාලීන අරමුණු අතර වෙනස පැහැදිලි කරන්න.

7. ඔබ අරමුණු තෝරාගන්නේ කෙසේද?

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දී ඇත.)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. අධ්‍යයනය කිරීම සඳහා ආදර්ශක අරමුණු

නිදසුනක් ලෙස ඇමරිකා එක්සත් ජනපදයේ, කැලිෆෝනියාව වේ, ලොස්ඇන්ජලිස් නුවර සභාවක සැලසුමක් ගැන අපි සලකා බලමු. මෙම සභාව විශ්වාස කරන්නේ එහි පරමාර්ථය ලොස්ඇන්ජලිස් නුවර ශුභාරංචිය පැතිරවීම බවය.

පහත දැක්වෙන්නේ ඔවුන් ලියන ලද සාවද්‍ය අරමුණකි.

*"අපි ලොස්ඇන්ජලිස් නුවර කිතු දහම පතුරවමු"*

මෙම අරමුණ මැණිය නොහැකිය. ඔවුන් සැලසුම සාක්ෂාත් කරගන්නට ඇත්දැයි ඔවුන් දන්නේ කෙසේද? එය කරන්නේ කවුද? කෙසේද? කවදාද? ඊට යන වියදම කොපමණද? එය ආරම්භ කරන්නේ කෙසේද? එම අරමුණු බොහෝ සේ පොදු එකක් වේ. එය පැහැදිලිව ලියා නැත. එමෙන්ම කළ යුත්තේ කුමක්දැයි නිසැකවම දක්වා නැත.

මෙහි දැක්වෙන්නේ නිවැරදි අරමුණකට නිදසුනකි.

*"අපි අප දේවස්ථානය වටා සැතපුම් පහක් ඇතුළත පෙදෙසක සිටින ස්පාඤ්ඤ භාෂාව කතා කරන ජනතාව කිතු දහමට හරවන්නෙමු"*

*අපි මේ අරමුණ ගැන ක්‍රියා කිරීමට 2000 ජනවාරි 1 දින ආරම්භ කරමු. අපි මේ වැඩය 2000 දෙසැම්බර් 31 දින අවසන් කරමු. සෑම මසකම පළමු බදාද දින ප්‍රගතිය ඇගයීම සඳහා රැස් වන්නෙමු.*

*මේ අරමුණ සාක්ෂාත් කර ඇති බව අප දැනගන්නේ:*

- *සැතපුම් පහක් ඇතුළත සිටින, ස්පාඤ්ඤ භාෂාව කතා කරන සෑම කෙනෙකුගේම නිවෙසට ශුභාරංචි සාක්ෂිකරුවෙකු සමඟ ගිය විට වේ.*
- *මේ සාක්ෂිකරු නිසා අලුතින් හැරුනු අවම වශයෙන් ස්පාඤ්ඤ භාෂාව කතා කරන ඇදහිලිවතුන් 100ක් වත් සිටින සභාවක් පිහිටවූ විට වේ.*
- *මේ හැරුනු අයව එම ප්‍රදේශයේ කිතු දහම පැතිරවීමට පුහුණු කළ විට වේ.*

*මේ අරමුණ වෙනුවෙන් වගකිවයුතු පුද්ගලයන් මෙසේය.*

*අපගේ පාලකතුමාගේ මඟපෙන්වීම යටතේ මෙම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂක හා සමායෝජක ලෙස ජෝ ස්මිත් ක්‍රියා කරනු ඇත. අපි මෙම සැතපුම් පහේ පෙදෙස කොටස්වලට බෙදන්නෙමු. මේ සෑම කොටසක් සඳහාම වගකීම ඒ ඒ කොටසේ සභාපතිට පවරමු. කොටස් වෙන් කෙරෙන්නේ එම පෙදෙසේ භූගෝලීය සාධක අනුව වේ.*

*ඒ ඒ කොටසේ සභාපතිවරුන් තම තමන්ට අයත් කොටසේ සෑම නිවසකටම ගොස් ශුභාරංචිය දේශනා කරනු ඇත. ඔවුන් අලුතින් හැරුනු අයගේ නම් හා ලිපිනයන් ලියා ගනු ඇත. තමා යන සෑම නිවසකම ශුභාරංචි පණිවුඩයක් සහිත පත්‍රිකාවක් තබා යනු ඇත. අලුතින් හැරුනු සෑම කෙනෙකුටම යොහන්ගේ ශුභාරංචිය බැගින් ප්‍රදානය කරනු ඇත. අලුතින් හැරුනු සෑම කෙනෙකු ගැනම ඔවුන් සොයා බලා අලුත් සභාවේ කොටස් කරුවෙකු වීමට සෑම කෙනෙකුවම පොළඹවනු ඇත. ජෝ ස්මිත්, මේ හැරුනු අයව පුහුණු කර නව සභාවට නායකයන් තෝරනු ඇත. මෙසේ නායකයින් පුහුණු කර තහවුරු කළ පසු, ලොස්ඇන්ජලිස්හි තවත් පෙදෙසක් සඳහා අපි මෙවැනිම අරමුණු පිහිටුවන්නෙමු. අවසානයේ මුළු නගරයෙහිම කිතුනු සභාව පතුරුවන්නෙමු.*

*මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට යන වියදම පහත දැක්වේ :*

**අය-වැය ලේඛණය**

$ ______________ ශුභාරංචි පත්‍රිකා සඳහා
$ ______________ යොහන්ගේ ශුබාරංචිය සඳහා
$ ______________ කොටස් ලකුණු කිරීමේ සිතියමට
$ ______________ අලුතින් ගැළවීමට පැමිණි අයගේ නම් වාර්තා කිරීම සඳහා නම් හා ලිපිනයන් සහිත කාඩ්පත් සඳහා
$ ______________ අලුත් දේවස්ථානය විවෘත කිරීම පිළිබඳව ප්‍රචාරය කිරීමේ පුවත්පත් දැන්වීමට
$ ______________ පළමු දේව මෙහෙයට සහභාගි වන ලෙස අලුතින් හැරුනු අයට ඇරයුම් කරමින් යැවෙන පෞද්ගලික ආරාධනා පත්‍ර තැපැල් කිරීම සඳහා (රැස්වීම් ස්ථානයකට යන වියදම කපා හැරීම සඳහා දේව මෙහෙය නිවෙසක පවත්වනු ඇත)
$ ______________ අලුතින් ගැළවීමට පැමිණි අය පුහුණු කිරීමේ ද්‍රව්‍ය සඳහා

ශුභාරංචිය ලොස්ඇන්ජලිස්හි පැතිරවීමේ දෙවියන්වහන්සේගේ සැලැස්මේ අපගේ සුවිශේෂී පරමාර්ථය සම්පූර්ණ කිරීමට මෙය උපකාරී වනු ඇත. අප සභාව වටා සැතපුම් පහක් ඇතුළත පෙදෙසක වෙසෙන ස්පාඤ්ඤ භාෂාව කතා කරන අය වෙත ළඟා වීමෙන්, අප සභාව වෙනුවෙන් ඇති උන්වහන්සේගේ පරමාර්ථයෙන් කොටසක් අපි සම්පූර්ණ කරන්නෙමු.

මෙය මුළු නගරයම කිතුනුවන් කරන තුරු ලොස්ඇන්ජලිස් නගරයේ අනෙකුත් පෙදෙස්වලද නැවත නැවත ක්‍රියාත්මක කළ හැකි සැලසුමකි.

2. හිතෝපදේශ 1:2-6 කියවන්න. මෙම කොටසින් හිතෝපදේශ පොතේ පරමාර්ථය ප්‍රකාශ වේ. එය ලියා ඇත්තේ මන්දැයි ඉන් පැහැදිලි කෙරේ. පොතේ ඉතිරි කොටස, මෙම පරමාර්ථය සාක්ෂාත් කිරීමට අවශ්‍ය අරමුණුවලින් පිරී පවතී.

3. ඉශ්‍රායෙල්වරුන් මිසරයේ බන්ධනයේ සිටින විට දෙවියන්වහන්සේ ඔවුන් වෙනුවෙන් පිහිටවූ අරමුණු සමහරක් මෙසේය: නික්මයාම 6:2-8 හි උන්වහන්සේ මෙසේ පවසයි.

   - මිසරවරුන් තබන බරවලින් මම නුඹලා පිටතට ගෙනෙන්නෙමි.
   - ඔවුන්ගේ වහල් කමෙන් නුඹලා නිදහස් කරන්නෙමි.
   - දිගුකල බාහුවකින් ද මහත් විනිශ්චයවලින් ද නුඹලා මුදන්නෙමි.
   - නුඹලා මාගේ සෙනඟ කොට පිළිගන්නෙමි.
   - මම නුඹලාට දෙවි කෙනෙක් වන්නෙමි.
   - මාගේ අත ඔසවා දිවුරූ දේශයට නුඹලා ගෙනෙන්නෙමි (අත එසවීම දිවුරුමක් සඳහා ලකුණකි).
   - නුඹලාට එය උරුමකොට දෙන්නෙමි.

කෙතරම් පුදුමාකාර සැලැස්මක්ද! මොසෙස් දෙවියන්වහන්සේගේ සැලැස්ම පැහැදිලිව සෙනඟට සන්නිවේදනය කලේය. එහෙත් ඔවුහු එය ප්‍රතික්ෂේප කළහ (නික්මයාම 6:9). ඇතැම් විට ඔබට දෙවියන්වහන්සේ දුන් විශිෂ්ට සැලැස්මක් තිබෙන්නට පුළුවන. එහෙත් සෙනඟ ඊට එරෙහි වීමට ඉඩ තිබේ. මෙය මතක තබා ගන්න. දෙවියන්වහන්සේගේ සැලසුම් හා පරමාර්ථ කිසිදිනක අසාර්ථක නොවනු ඇත. අලුත් පරම්පරාවක් බිහි කිරීමට සිදු වුවද දෙවියන්වහන්සේ ඉශ්‍රාලය වෙත තැබූ උන්වහන්සේගේ පරමාර්ථය ඉෂ්ඨ කළ සේක.

4. ඔබ දන්නා කිතුනු සංවිධානයක් තෝරා ගන්න. ඔවුන්ගේ ක්‍රියාවෙන්, ඔවුන්ගේ පරමාර්ථය කවරක්දැයි ඔබ සිතන්නෙහිද? එහි අරමුණු සමහරක් කවරක් විය හැකිද?

5. ඔබ අසාර්ථක නොවන බව දන්නෙහි නම්, ඔබ පිහිටුවන සේවා අරමුණු තුනක් කවරේද? ඔබ මේවා ලයිස්තු ගත කළ පසු ඒ වෙනුවෙන් යාච්ඤා කරන්න. අසාර්ථක වේ යයි බිය නොවන්න. මේ සැලසුම් සාක්ෂාත් කිරීමට ඔබ උත්සාහ කිරීම දෙවියන්වහන්සේට අවශ්‍යද?

6. ලූක් 12:16-20 ඇති පොහොසත් මිනිසා පිළිබඳ උපමාවෙන් ප්‍රමුඛතාවල වැදගත්කම පෙන්වයි. පොහොසත් මිනිසා,

   - තමා ගැන මිස අනෙක් අය ගැන නොසිතුවේය. ඔහුගේ ප්‍රමුඛතාව දේව රාජ්‍යය කේන්ද්‍රීය රාජ්‍යයක් පිළිබඳව නොව ආත්ම-කේන්ද්‍රීය ජීවිතයක් විය.

   - තම ශරීරය වෙනුවෙන් මිස ආත්මය වෙනුවෙන් කිසිවක් කළේ නැත. ඔහුගේ ප්‍රමුඛතාව ආත්මීය නොව මාංශමය විය.

   - සදාතනය ගැන නොව මෙම ජීවිතය ගැන සිතුවේය. ඔබගේ ප්‍රමුඛතාවන් සදාතනය හා බැඳෙන්නේ කෙසේද? ඔහුට ප්‍රමුඛතාවන් පිළිබඳව වැරදීමට හේතුව කුමක්ද? ඔහු 'තමාගේ සිත තුළ' කල්පනා කළේය (ලූක් 12:17). ඔහු දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා ප්‍රමුඛතා සමඟ සැලසුම් කළේ නැත. අනිසි ස්ථානයේ තැබූ ප්‍රමුඛතාවලට දඬුවම් ලැබේ (20 පදය).

7. ඔබගේ සේවය සඳහා අරමුණු පිහිටුවීමට පහත දැක්වෙන කාර්ය පත්‍රිකාව භාවිත කරන්න.

**අරමුණු පිහිටුවීමේ කාර්ය පත්‍රිකාව**

ඔබ කරන දෙය ලියන්න මම (හෝ අපි)

______________________________________________________________________

______________________________________________________________

මා (අප) මෙම අරමුණ පිළිබඳව ක්‍රියා කිරීම ආරම්භ කරන්නේ... දිනය:- ________________
මා (අප) මෙම අරමුණ අවසන් කරන්නේ... දිනය:-________________
මම (අප) අපගේ ප්‍රගතිය පහත දැක්වෙන දිනවල සොයා බලන්නෙමි (මු) :

දිනය: ________________
දිනය: ________________
දිනය: ________________

මෙම අරමුණු මා (අප) සාක්ෂාත් කර ඇති බව මා දන්නේ:

__________________________________________________________________

මෙම අරමුණු වෙනුවෙන් වගකිව යුතු අය මෙසේය:

______________________________________________________________________

______________________________________________________________

එක් එක්කෙනා කරන කාර්යයන් මෙසේය:

______________________________________________________________________

______________________________________________________________

දෙවියන්වහන්සේගේ සැලැස්මේ අපගේ සුවිශේෂි පරමාර්ථය සම්පූර්ණ කිරීමට මෙම අරමුණ අප උපකාරී වී ඇත්තේ
__________________________________________________________ නිසා වේ.
මෙම සැලැස්ම සාක්ෂාත් කිරීමට යන වියදම මෙසේය: ඔබගේ වියදම් ලයිස්තුව වෙන කොළයක සකස් කරන්න. වියදම් ලයිස්තුවකට නිදර්ශනයක් මෙම අත්පොතේ ඇමුණුමේ ඇත.

# පස්වන පරිච්ඡේදය

## සෙනඟ සහ ක්‍රියා පිළිවෙළ: සැලැස්ම ක්‍රියාත්මක කිරීම

**අරමුණු**

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට

- "ක්‍රියා පිළිවෙළ" අර්ථ විග්‍රහ කිරීමට

- සැලසුම ක්‍රියාත්මක කිරීමේ පහත දැක්වෙන පියවර ගැන සාකච්ඡා කිරීමට
- ❖ තෝරා ගැනීම
- ❖ සන්නිවේදනය කිරීම
- ❖ පැවරීම
- ❖ පුහුණු කිරීම
- ❖ සංවිධානය කිරීම
- ❖ දින නියම කිරීම
- ❖ අයවැය සැකසීම
- ❖ තිරණ ගැනීම
- ❖ ආපසු බැලීම
- ❖ ඇගයීම
- ❖ මිදි යුෂ හා වස්ත්‍ර පිළිබඳ උපමා පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

**ඉතින් කැමති වීමට සූදානම්ව සිටියාක් මෙන්ම නුඹලාත් පුළුවන්කමේ හැටියට එහි තින්දුවක් පැමිණෙන පිණිස දැන් කිරීමත් තින්දු කරපල්ලා.** (2 කොරින්ති 8:11)

### හැඳින්වීම

මීට පෙර පාඩම්වලින් ඔබ, ඔබගේ සේවයේ පරමාර්ථය හැඳිනගත් අතර, සැලසුම් සකස් කිරීමටද උගත්තෙහිය. එහෙත් සැලසුම් සකස් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. ක්‍රියා නොමැති ඇදහිල්ල මිය ගොස් ඇත්තා සේම ක්‍රියාවන් රහිත සැලසුම් කිරීම් වලින්ද පලක් නොවේ.

ඔබගේ සැලසුම් ක්‍රියාත්මක කරන ආකාරය ඔබ මෙම පාඩමෙන් ඉගෙන ගන්නවා ඇත. සැලසුමක් ක්‍රියාත්මක කිරීම යනු එය ක්‍රියාවට නැංවීම වේ. ඔබ මෙය කරනුයේ නිසියාකාර ක්‍රියා පිළිවෙළක් හා විශ්වාසවන්ත මිනිසුන් ඇසුරෙනි.

### සෙනඟ හා ක්‍රියා පිළිවෙළ

ක්‍රියා පිළිවෙළ යනු සැලසුමක් ක්‍රියාත්මක කිරීමට ගන්නා පියවර වේ. එමෙන්ම සැලසුම සාක්ෂාත් කරගැනීමට නායකයින් විසින් කරනු ලබන ව්‍යාපෘති, කාර්යයන් හෝ ක්‍රමවේදයන්ද ක්‍රියා පිළිවෙළට අයත්ය. ලොව පුරා කෙරෙන සේවයන් සඳහා දෙවියන්වහන්සේ භාවිත කරන ආයුධය සෙනඟ වේ. සැලසුමක් සාර්ථක වීමට උචිත ක්‍රියා පිළිවෙළක් හා විශ්වාසවන්ත සෙනඟක් යන දෙකම අවශ්‍යය.

### සැලසුමක් ක්‍රියාත්මක කිරීම

යම් සැලසුමක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නම් ඔබට ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. හතරවන පරිච්ඡේදයෙන් සාකච්ඡා කළ අන්දමට ඔබ සැලසුම් ලිවිය යුත්තේ එබැවිනි. සැලැස්මක පහත දැක්වෙන දේ අන්තර්ගත විය යුතු බව මතක තබා ගන්න.

- කළ යුතු දේ නිශ්චිතව දැක්වෙන ප්‍රකාශයක්

- ඔබ එය කරන්නට යන අන්දම පිළිබඳ විස්තරයක් [ක්‍රියා පිළිවෙළ, ක්‍රියාකාරී පියවර]
- එය කරන්නේ කවරෙකු විසින්ද [ඊට සහභාගි වන අය]
- එය කරන්නේ කවදාද? [ආරම්භ කරන හා අවසන් කරන දිනයයන්, ප්‍රගති සමාලෝචන දින]
- අයවැය ලේඛණයක් [ඊට කෙතරම් මුදලක් වැය වේද?]

සැලසුමක් ක්‍රියාත්මක කිරීමටණී නායකයෙකු සතු මූලික වගකීම් තිබේ. පහත දැක්වෙන ඒවා ඊට අයත් වේ:

**තෝරාගැනීම් :**

යේසුස්වහන්සේ, තමන්වහන්සේගේ මෙලොව සේවය සඳහා තමාට උපකාර කිරීමට ශ්‍රාවකයින් තෝරාගත් සේක. සේවයේ වැඩකටයුතු සඳහා සෙනඟ තෝරා ගැනීමේ මාර්ග නිර්දේශ කිහිපයක් පහත දැක්වේ.

01. විශ්වාසවන්ත පුරුෂයන් හා ස්ත්‍රීන්:
විශ්වාසවන්ත පුරුෂයන් හා ස්ත්‍රීන් තෝරාගන්න. විශ්වාසවන්ත අය යනු, ශුභාරංචිය පිළිගත් හා සැබෑ පශ්චාත්තාපය හා වෙනස්වීම් සහිත ජීවිත ඇති අය වේ. ඔබගේ සුවිශේෂී සේවයේ විශේෂිත පරමාර්ථය සඳහා කැඳවනු ලැබූ අය තෝරාගන්න. ඔබ යෙදී සිටින සුවිශේෂී සේවය සඳහා බරක් යම් කෙනෙකුට නොමැති නම්, ඉක්මනින්ම ඔවුන්ගේ උද්යෝගය හා උපකාරී වීමට ඇති කැපවීම අඩු වී යනු ඇත.

සෑම පුද්ගලයෙකු වෙනුවෙන්ම සුවිශේෂී සැලැස්මක් දෙවියන්වහන්සේට ඇති අතර ඔවුන් දෙවියන්වහන්සේට අවශ්‍ය ස්ථානයේ සේවය නොකරන්නේ නම් එය ඵලදායි නොවනු ඇත. සේවයේ පරමාර්ථය ඔවුන්ගේ පෞද්ගලික පරමාර්ථය විය යුතුය.

ශුද්ධාත්මයාණන්ගෙන් සපිරි කීර්තිමත් අය තෝරා ගන්න (ක්‍රියා 6:8). නායකත්වය දරන අය, තිතස් 1:5-9 හා 1 තිමෝති 3:1-13 හි සඳහන් ආත්මික නායකයින්ට තිබිය යුතු බයිබලීය සුදුසුකම සපුරාලිය යුතු වේ.

02. ආත්මික දීමනා:
ඔබ පවරන සුවිශේෂී කාරණා ඉටු කිරීමට අවශ්‍ය ආත්මික දීමනාවන්ගෙන් සපිරි අය තෝරා ගන්න. අලුත් ගිවිසුම් යුගයේ විවිධ කාර්යයන් සඳහා පුද්ගලයින් තෝරාගත්තේ මේ ආකාරයට වේ. නිදසුනක් වශයෙන් ඉගැන්වීමේ දීමනාව ඇති කෙනෙකු ඵලදායි එවැන්ජලිස්ත වරයෙකු නොවිය හැකිය. එවැන්ජලිස්ත දීමනාව ඇති කෙනෙකු පූජකවරයෙකු ලෙස අසාර්ථක විය හැකිය.

03. හැකියාවන් හා දක්ෂතාවයන්:
ආත්මික දීමනා වලට අමතරව මනුෂ්‍යයින්ට දෙවියන්වහන්සේ විසින් දෙන ලද හෝ අධ්‍යාපනයෙන් හා පුහුණුවෙන් තමාම වැඩිදියුණු කරගත් හෝ විශේෂ දීමනා තිබේ. සපුරාලීමට ඇති කාර්යය කවරක්දැයි බලන්න. ඒ විශේෂ සේවයට හෝ කාර්යයට හෝ උචිත හැකියාවන් හා දක්ෂතාවන් ඇති අය ඒ සඳහා තෝරා ගන්න.

නිදසුනක් වශයෙන්, කූඩාරම් තැනීම සඳහා මෝසෙස්ට දෙවියන්වහන්සේගෙන් සැලසුම් ලැබුණු විට, ඒ කාර්යය කිරීමට දක්ෂතාවන් ඇති අය ඔහු තෝරා ගත්තේය (නික්මයාම 35:30-34 බලන්න).

සැමවිටම ලෞකික මනුෂ්‍යයෙකුගේ විශ්වාසවන්තකම දියුණු කිරීමට වඩා ආත්මික මනුෂ්‍යයෙකුගේ හැකියාවන් අවශ්‍යතාව අනුව පුහුණු කිරීම පහසු බව මතක තබා ගන්න.

04. සේවයේ අත්දැකීම්:
පසුගිය ආත්මික අත්දැකීම් අගයන්න. යම් කෙනෙක් ඒ හා සමාන ස්ථානයක සාර්ථකව සේවය කර ඇත්නම්, ඒ සඳහා ඔහුගේ සේවය හා ආලේපය සනාථ වී ඇත.

05. ශක්තීන් හා දුර්වලතා:
යම් පුද්ගලයෙකුගේ ආත්මික ශක්තීන් හා දුර්වලතා අගයන්න. ඒ ස්ථානය පිරවීම සඳහා ඉල්ලුම් කරුවෙකු වීමට ඔහුට ඇති ශක්තීන් මොනවාද? ගැටළු ඇති කළ හැකි දුර්වලතා මොනවාද? එවැනි ගැටළුවක් මතු වුවහොත් ඔබ ගන්නා ක්‍රියා මාර්ගය කවරේද?

**සන්නිවේදන කිරීම :**

සැලසුම් පැහැදිලිව සන්නිවේදනය කළ යුතුය. පුද්ගලයින්ට, යම් සැලැස්මක් පිළිබඳ තොරතුරු ලැබූ ප්‍රමාණය අනුව ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම ඔවුන්ට පහසු වේ. බාබෙල් කොත පිළිබඳ බයිබලීය වාර්තාවේ සන්නිවේදනයේ වැදගත්කම පැහැදිලිව පෙන්වා ඇත. උත්පත්ති 11:1-9 හි ඇති කතාව කියවන්න.

මිනිසුන් මේ දේවල් දැනගත යුතුය:

**පොදු සැලැස්ම**

පොදු සැලැස්මද එය දෙවියන්වහන්සේගේ පරමාර්ථයට ගැළපෙන ආකාරයද සංවිධානයේ සුවිශේෂී පරමාර්ථයද ඔවුන් අවබෝධ කරගත යුතුය.

**සැලැස්මේ විස්තර**

මෙම විස්තරවලට මීට සහභාගි වන අනෙකුත් අය, වැයවන මුදල, කාල සටහන, ක්‍රියාත්මක කෙරෙන පියවර හා එය සාක්ෂාත් වී ඇත්දැයි බැලීමට සැලැස්ම අගයන ආකාරය ආදිය ඇතුළත් විය යුතුය.

**සැලැස්ම තුළ ඔවුන්ගේ සුවිශේෂී වගකීම**

තමා පෞද්ගලිකව වගකිව යුත්තේ කුමන කාර්යයටද? කවදා වන විටද? සහ ඔවුන්ට ලබාගත හැකි මුදල්, උපකරණ හා පුද්ගලයන් පිළිබඳව මිනිසුන් දැනගත යුතුය. සන්නිවේදනය මගින් සේවයේ කාර්යයන් සඳහා මිනිසුන් පෙළඹවිය යුතුය. ඔබ මිනිසුන් පෙළඹවූ විට එම කාර්යය කිරීම සඳහා ඔවුන්ට අභියෝග හා ආභාෂයන් ඔබ සන්නිවේදනය කරනු ඇත.

සේවයේ කාර්යයන් කිරීම සඳහා ඔබ ඔවුන් තුළ නිවැරදි පෙළඹවීම් හා හේතු වර්ධනය කරනු ඇත. මෙය මතක තබාගන්න.

**... විශ්වාස තානාපතියා සුව උපදවයි (හිතෝපදේශ 13:17)**

**පැවරීම :**

ඔබ සැලසුම සන්නිවේදනය කළ පසු කළ යුතු වැඩයේ වගකීම් පැවරිය යුතුය. "පැවරීම" යනු සේවය සඳහා කළ යුතු කාර්යයන්හි වගකීම් හා අධිකාරී බලය අන් අයට දීම වේ. ඔබ යමක් පැවරූ විට ඔබ කරනුයේ එහි වගකීමත්, එය සාක්ෂාත් කිරීමට අධිකාරී බලයත්, එය නිවැරදිව කිරීම සඳහා ගබඩාකාරත්වය තවත් කෙනෙකුට දීම වේ.

කාර්යයක් පැවරීම පිළිබඳව බයිබලයේ සඳහන් ශ්‍රේෂ්ඨතම නිදසුනක් වන්නේ ජෙත්‍රෝ සකස් කළ සැලසුම මෝසෙස් ක්‍රියාත්මක කිරීම වේ. ඒ පිළිබඳව නික්මයාම 18:13-27 කියවන්න. සියලු වැඩ තමාම කිරීමෙන් මෝසෙස් මහත් සේ වෙහෙසට පත්විය. සේවයේ කාර්යයන් ඉටු කිරීම සඳහා එහි වගකීම හා අධිකාරී බලය අන් අයට පවරන අයුරු ජෙත්‍රෝ ඔහුට ඉගැන්විය. මෝසෙස් වගකීම පැවරූ අය ඒ වැඩය වෙනුවෙන් මෝසෙස්ට ගණන් දිය යුතු වේ.

නායකයෙකු සැලකිලිමත් විය යුත්තේ ප්‍රධාන තීරණ, සැලැස්මේ ඉතාම වැදගත් අංශ හා ඒ පිළිබඳව කටයුතු කරන අයව අධීක්ෂණය කිරීම ගැන පමණකි. සැලසුම සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය දෛනික කටයුතු හා විස්තර අන් අයට පැවරිය යුතුය. යම් කෙනෙකුට වගකීමක් දුන්විට ඒ කාර්යය කිරීමේ අධිකාරී බලයද ඔහුට පැවරිය යුතුය. මින් අදහස්

වන්නේ, ඔහුට අවශ්‍ය බලය හෙවත් පාලනය ඔහුට ලබා දීමය. ඔහුට අවශ්‍ය සම්පත්ද ඔබ ඔහුට ලබා දිය යුතුය.

වගකීම හා අධිකාරී බලය තහවුරු කිරීම සඳහා ඔබ යම් කෙනෙකුට පවරන සුවිශේෂී කාර්යයන් ලිවීම සුදුසුය. මෙය ඇතැම්විට "කාර්ය විස්තරය" හෝ "සේවයේ විස්තරය" ලෙස හැඳින්වේ (සේවා විස්තරයන්හි නිදර්ශක සඳහා මෙම අත්පොතේ ඇමුණුම බලන්න).

ඔබ යම් කෙනෙකුගේ වගකීම සුවිශේෂීව අර්ථ විග්‍රහ කළවිට, ඔහු ඔබට අනිවාර්යයෙන්ම ගණන් දිය යුතුය. ඉන් අදහස් වන්නේ, ඔහු කළ යුතු වැඩ කොටස ඔහු දන්නා බවකි. ඔහු ඔබගේ කාර්යය අවසන් කළ බවටත් නිවැරදිව කල බවටත් ඔබ සොයා බලන බව ඔහු දනී.

මෙය සාරාංශ කර මෙසේ දැක්විය හැකිය: කාර්යයක් පැවරූ විට, අන් අයට දිය යුත්තේ

- වගකීම : සේවයේ කාර්යයන් ඉටු කිරීම
- අධිකාරී බලය : කාර්යය සම්පූර්ණ කරවා ගැනීම
- ගණන් දීම : කාර්යය නියමාකාරයෙන් කිරීමට බැඳී සිටීම

පැවරීමක් වැදගත් වන්නේ:

- මීට වඩා වැදගත් වැඩ සඳහා නායකයා නිදහස් වීම (නික්මයාම 18:13-27 හා ක්‍රියා 6:3-4 බලන්න).
- සේවයේ අත්දැකීම් හා පුහුණුව අන් අයටද ලබා දීම
- සභාවේ "සාමූහික සේවය" සඳහා වූ දෙවියන්වහන්සේගේ රටාව අනුගමනය කිරීම. එහිදී සෑම පුද්ගලයෙක්ම තමාට ලැබී ඇති ආත්මික දීමනා සේවයේ කාර්යයන් වෙනුවෙන් යොදවයි.
- නව නායකයන් නැගිටුවීම ආදිය සඳහාය.

**පුහුණුව :**

ඔබ කාර්යයන් පවරා ඇති සමහර දෙනෙක් දැනටමත්, එම කාර්යය කිරීම සඳහා අවශ්‍ය දක්ෂතාවන්ගෙන් සපිරි අය විය හැකිය. අනෙක් අය පුහුණු කිරීම අවශ්‍යය. පුහුණු කළ යුතු ආකාරය, කළ යුතු කාර්යය අනුවත් පුහුණුව ලැබිය යුතු අයගේ දක්ෂතාවන් අනුවත් වෙනස් වේ. ඇතැම් අයට, ඔවුන්ගේ සීමිත අධ්‍යාපනය හා අත්දැකීම් නිසා අන් අයට වඩා පුහුණු කිරීම අවශ්‍ය විය හැකිය. ඇතැම් කාර්යයන් අසීරුය. එබැවින් ඒවාට වැඩි උපදෙස් අවශ්‍ය වේ.

සේවයේ කාර්යයන් සඳහා දෙනු ලබන පුහුණුව අඛණ්ඩ ක්‍රියාවලියක් විය යුතුය. ඔබ නිරන්තරයෙන්ම ඔබ සමඟ සේවය කරන අයගේ දැනුම, දක්ෂතා හා ආත්මික පරිණතිය වර්ධනය කළ යුතුය.

**සංවිධානය :**

ඔබ පුහුණු කළ අය, ඔබ සමඟ එක්ව සේවයේ යෙදීම සඳහා සංවිධානය කළ යුතුය.

සංවිධානය යනු, හවුල් පරමාර්ථයක දැකිය හැකි බාහිර සාක්ෂිය වේ. පොදු පරමාර්ථයක් වෙනුවෙන් ක්‍රියා කිරීමට දෙදෙනෙකු එකඟ වන සෑම අවස්ථාවකම සංවිධානයක් පවතී. සංවිධානය යනු, සේවයේ කාර්යයන් ඉටු කිරීම සඳහා සෙනඟ කණ්ඩායමක් ගොඩ නැගීමේ ක්‍රියාවලිය වේ. "කවරක් කරන්නට කවරෙකු වගකිව යුතුද?" යන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම, සංවිධානය වේ.

සංවිධානයක් නොමැති තැන ව්‍යාකූලත්වය ඇත. එහි ප්‍රතිඵලය වනුයේ අසතුට, මිමිනීම හා වැදගත් කාර්යයන් නොකර සිටීම වේ. මීට නිදසුනක් සඳහා ක්‍රියා 6:1-7 හි ඇති යෙරුසලම් සභාව පිළිබඳ ගැටළුව හා එය විසඳීමට ගෝලයන් සංවිධානය වූ අයුරු කියවන්න.

අන් අයගේ සංවිධාන රටාවන් අනුගමනය නොකරන්න. අවශ්‍යතාවන් හා ඔබගේ පුද්ගලික සැලැස්ම හා පරමාර්ථයට අනුකූලව සංවිධානය වර්ධනය වීමට ඉඩ හරින්න. මුල් සභාවේ

සංවිධානය වර්ධනය වූයේ සභාවේ අවශ්‍යතාවන් අනුවය. ක්‍රියා 6:1-7 හි ඇති කතාව මෙය පැහැදිලි කරයි.

පියවූ දෙවියන්වහන්සේත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණනවහන්සේත් අතර සංවිධානයක් ඇත. සෑම කෙනෙකුටම සුවිශේෂී වූ වගකීම් හා සේවාවන් ඇති අතර ඒවා බයිබලයේ විස්තර කර තිබේ.

ස්වාභාවික ශ්‍රේෂ්ඨ නිදර්ශනයක් වන්නේ මනුෂ්‍ය ශරීරයයි. සභාවේ ආත්මික සංවිධානය විස්තර කිරීමට දෙවියන්වහන්සේ මේ ස්වාභාවික නිදර්ශනය භාවිත කර ඇත.
සභාව "ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය" වේ. එහි ප්‍රධානියා යේසුස්වහන්සේය. "සභාවේ ප්‍රධානියා වීම" යේසුස්වහන්සේගේ සේවා වගකීමකි.

යේසුස්වහන්සේ ඔබගේ ප්‍රධානියා ලෙස ඔබ සංවිධානය කළ විට, ආත්මික සැලසුම් හා පරමාර්ථ ඉටු කිරීමට ඇදහිලිවතුන්ගේ ශරීරයක් ලෙස ඔබ එක්ව ක්‍රියා කරනු ඇත.

ඇතැම්විට ඔබ පිහිටුවන්නාවූ සංවිධානාත්මක ව්‍යුහය පැහැදිලි කිරීමට රූප සටහනක් ඇඳීම උපකාරී වේ. එවැනි රූප සටහනක් "සංවිධානාත්මක සටහනක්" ලෙස හැඳින්වේ. මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා" යන කොටසෙහි නිදර්ශක සටහන් කිපයක් ඇත.

සැලැස්මට අයත් අය අතර සාමූහික ආත්මයක් ගොඩ නැගීමද සංවිධානයට අයත් වේ. එමෙන්ම සේවයේ කාර්යයන් සඳහා ඔවුන් යෙදවීමත් ඔවුනොවුන් අතර යහපත් සම්බන්ධතාවයක් ගොඩනැගීමත් ඊට අයත්ය.

ශුද්ධ ලියවිල්ල හා සම්බන්ධ ඕනෑම සංවිධානයක, එක් අයෙකුට වඩා තවත් කෙනෙක් ශ්‍රේෂ්ඨ නොවන බව මතක තබා ගන්න. අපි සියලු දෙනාම දෙවියන්වහන්සේගේ පරමාර්ථයන් ඉටු කිරීම සඳහා ක්‍රිස්තුස්වහන්සේගේ එකම ශරීරයේ එකට ක්‍රියා කරන සාමාජිකයෝ වෙමු (එපීස 1:22-23; 4:15-16; කොලොස්සි 1:18; 1 කොරින්ති 12 බලන්න).

**කාලයන් නියම කිරීම :**

ඔබ සැලැස්ම සකස් කළ මුල් අවස්ථාවේම එය ආරම්භ කරන, නැවත බලන හා අවසන් කරන දින නියම කර ගත්තෙහිය. දැන් ඔබ සැලසුමේම කොටසක් වන අනෙක් දිනයන් නියම කරගත යුතුය.

නිදසුනක් වශයෙන්, පසුගිය පරිච්ඡේදයේ සභාව වටා සැතපුම් පහක් ඇතුළත සිටින ස්පාඤ්ඤ භාෂාව කථා කරන අය වෙත ශුභාරංචිය ගෙන යෑමේ දිනයන් පිළිබඳ නිදසුනක් සඳහන් විය. එහි එම ව්‍යාපෘතිය ආරම්භ කෙරෙන, නැවත සිතා බලන හා අවසන් කරන දිනයන් තීරණය කර තිබිණි.

ඔබ සැබවින්ම මෙම සැලසුම මත ක්‍රියා කරන්නෙහි නම්, ගෙයින් ගෙට ගොස් ශුභාරංචිය බෙදා ගැනීම සඳහා දිනයයන් හා වේලාවන් තීරණය කිරීම දැන් ඔබට අවශ්‍ය වනු ඇත. එමෙන්ම පළමු දේවමෙහෙය පැවැත්වීම පිළිබඳව ප්‍රචාරය කිරීමට හා එය පැවැත්වීමට දිනද තීරණය කළ යුතුය.

එවැනි කාලසටහනක් සකස් කිරීමෙන් ඔබට කාලය ඥානාන්විතව භාවිත කළ හැකිය. ඔබ කාලය ප්‍රඥාවන්තව භාවිත කළ යුතුය, මක්නිසාද දේවරාජ්‍යයේ කාර්යයන් ඉටු කිරීම සඳහා ඇති කාලය සීමිත බැවිනි.

> **දහවල්ව තිබියදී මා එවූ තැනැන්වහන්සේගේ වැඩ අප විසින් කටයුතුය. රාත්‍රිය පැමිණෙයි. එවිට කිසිවෙකුට වැඩ කරන්ට නුපුළුවන. (යොහාන් 9:4)**
>
> **ඒ නිසා නුඹලා ඥානය නැත්තන් මෙන් නොව ඥානවන්තයන් මෙන් ප්‍රවේසමෙන් හැසිරෙන්ට බලාගෙන දවස් නපුරු බැවින් ප්‍රස්තාව අල්ලා ගනිල්ලා. (එපීස 5:15-16)**

ඔබ ඔබගේ කාලය ප්‍රඥාවන්තව භාවිත කරන විට ඔබ ප්‍රමුඛතාවන් පිහිටුවනු ඇත. මින් අදහස් වන්නේ ඔබ ඇතැම් දේ කරන්නටත් ඇතැම් දේ නොකරන්නටත් තෝරා ගන්නෙහිය,

යන්න වේ. සාර්ථක නායකයින් තම අරමුණු හා පරමාර්ථ සමඟ එකඟ නොවන දෙයට “නැත” යි කීමට ඉගෙන ගන්නා ඇත.

දෙවියන්වහන්සේ ඔබ කැඳවා ඇති සුවිශේෂ පරමාර්ථ පදනම් කරගෙන ඔබ කළ සෑම දෙයක්ම අගයන්න. ඒ කැඳවීම ප්‍රමුඛතාවක් කරගන්න. අනෙක් දේවල් නිසා මාර්ගය වෙනස් නොකරන්න. ඒවා කෙතරම් හොඳ වුවද අවශ්‍ය වුවද මග වෙනස් නොකළ යුතුය.

තලෙන්ත දෙන ලද දාසයන් පිළිබඳ උපමාවෙහි මෙන්, දෙවියන් වහන්සේ ඔබට දී ඇති සුවිශේෂී සේවය ගැන ඔබ වගකිව යුතුය. ඔබට දෙවියන්වහන්සේ වෙනුවෙන් බොහෝ යහපත් හා අවශ්‍ය දේ කළ හැකිය, එහෙත් ඔබ සේවයේ ඔසවනු ලැබූ සුවිශේෂී පරමාර්ථය මඟ හැරීමට ඉඩ තිබේ.

කාල සැලැස්ම නිසියාකාරව සකස් කරගැනීමට ඔබ දින දර්ශනයක් අවශ්‍ය වනු ඇත. එම කාල සැලැස්මේ සති මෙන්ම දෛනික සැලසුම්ද තිබිය යුතුය.

01. සති සැලසුම:

සෑම සතියකම ආරම්භයේ සැලසුමක් සකස් කරන්න. ඉදිරියට පැමිණෙන සතිය ගැන යාච්ඤා කර සෑම දිනකටම සුවිශේෂී ව්‍යාපෘතියක් ඇතුළත් කිරීමට හැකි වන සේ සැලසුම් කිරීමට අවශ්‍ය මඟපෙන්වීම දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න:

- එම සතියේ කළ යුතුම දේ කුමක්ද? මෙය කළ යුතු දේ අත්‍යවශ්‍ය දේ පිළිබඳ ලයිස්තුවකි. එම සතිය තුළ මේ දේ නොකළහොත් මහත් ගැටළු හෝ ප්‍රමාද වීම් හෝ ඇතිවිය හැකිය.
- කළ යුතු දේ කුමක්ද? මේ ඊළඟට වැදගත් කමක් ඇති දේවල ලයිස්තුවකි. කළ යුතුම අත්‍යවශ්‍ය දේ කළ පසු මේ දේවල් කළ හැකිය.
- ඔබට ප්‍රමාණවත් කාලයක් තිබේ නම් කළ හැකිදේ කුමක්ද? කිසිදු ගැටළුවක් ඇති නොකර සතියක කළ හැකි දේ මෙහි ඇතුළත්ය.

දැන් මේ ලයිස්තු දෙස නැවත සිත් යොමු කොට වෙනත් අයෙකුට පැවරිය හැකි අංග තීරණ කරන්න. ඒවා පවරන්න. එවිට ඔබට පමණක් කළ හැකි දේ කිරීමට ඔබට ප්‍රමාණවත් තරම් කාලයක් ලැබෙනු ඇත.

02. දෛනික සැලසුම්:

- සෑම දිනක් ආරම්භයේදීම, එදින ඔබ කළ යුතු දෙය එළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. එම සතිය සඳහා ඔබ සැලසුම් කළ කාර්යයන් නැවත බලන්න. එදින කළ යුත්තේ කුමන කාර්යදැයි දෙවියන්වහන්සේගෙන් අසන්න. ඒවා ලියාගෙන ප්‍රමුඛතාව අනුව පිළියෙල කරන්න.

සති සැලසුමේ ඇසූ ප්‍රශ්නවලට ම පිළිතුරු සපයන්න. එදින කළ යුත්තේ කුමක්ද? මේ හදිසි කාර්යයන් අවසන් කළහොත් ඊට පසු ඔබ කළ යුත්තේ කුමක්ද? ඔබ කාලය ඉතිරිව තිබේනම් කළ හැක්කේ කුමක්ද? අන් අයට පැවරිය හැකි කාර්යයන් කවරේද?

සෑම දිනකම ස්වාමින්වහන්සේ සමඟ පෞද්ගලිකව සිටීම සඳහා යාච්ඤාවට හා බයිබල් අධ්‍යයනයට කාලය වෙන් කරන්න. මෙය වැදගත්ය: මක්නිසාද

**ස්වාමින්වහන්සේ කෙරෙහි භය වීමෙන් දවස් වැඩිවෙයි. (හිතෝපදේශ 10:27)**

**නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේ සලකාපන්න. එවිට උන්වහන්සේ නුඹේ මාවත් සමතලා කරනවා ඇත. (හිතෝපදේශ 3:6)**

සැලසුම් කිරීමේදී පාවුලුතුමා මෙන් ශුද්ධාත්මයාණන් විසින් කරනු ලබන වෙනස් කිරීම් වලට විවෘත වන්න. එමෙන්ම සේවය ඇත්තේ මිනිසුන් නිසා බව මතක තබා ගන්න. සැලැස්මක් නිසා හෝ ඔබ කළ යුතු කාර්යයන් නිසා හෝ මිනිසුන් නොසලකා නොහරින්න.

ඒ අතරම, ඔබගේ කාලය හා ශ්‍රමය වැය වන බොහෝ දේ නිසා ඔබගේ කාර්යයෙන් අන් අතකට යොමු නොවීමට පරෙස්සම් වන්න. යහපත් කාර්යයක් සඳහා වුවද වෙනත් මඟකට හැරවීම, ඔබ දෙවියන්වහන්සේගේ සැලසුම සාක්ෂාත් කිරීමෙන් වළක්වා ලීමට සතුරා විසින් භාවිත කරන උපක්‍රමයකි.

නෙහෙමියා 6:10-12 කියවන්න. "දෙවියන්වහන්සේගේ දිවැසිවරයෙක්" දෙවියන්වහන්සේගේ නිවසෙහි රැස්වීමක් කැඳවීම මගින් නෙහෙමියාව තමා කරන කටයුතු වලින් අන් මගකට යොමු කිරීමට උත්සාහ කළේය. මෙහි ආත්මික බවක් හැඟෙනවා නොවේද? තවද, දෙවියන්වහන්සේගේ නිවෙස තුළ සිටීම නෙහෙමියා වඩාත් ආරක්ෂා සහිත බවත් ඔහු එහි නොපැමිණියහොත් ඔහුව මරා දැමීමට ඉඩ ඇති බවත් ඒත්තු ගැන්වීමට මෙම දිවැසිවරයා උත්සාහ කළේය.

එහෙත් මෙම දිවැසිවරයා එවන ලද්දේ දෙවියන්වහන්සේ විසින් නොවන බව නෙහෙමියාට වැටහිණි. ඔහු එම රැස්වීමට ගියේ නැත. පවුර සෑදීමට දෙවියන්වහන්සේ ඔහුට පැවසූ බැවින් ඔහු කළේ ඒ දෙය වේ.

03. අනෙක් කාල ඒකක:
අනෙකුත් කාල ඒකක අනුව ක්‍රියාකිරීම යෝග්‍ය බව ඔබට හැඟෙන්නට ඉඩ තිබේ. නිදසුනක් ලෙස කිතුනු පාසලක ගුරුවරියකට කාර්තු අනුව හෝ පාසල් වාර අනුව හෝ සැලසුම් සකස් කිරීමට අවශ්‍ය විය හැකිය.

වාර්ෂික සේවා සැලැස්මක් සකස් කිරීමද ඥානාන්විතය. දෙවියන්වහන්සේගේ පරමාර්ථයන් හා සුසංගත වන පරිදි වාර්ෂික ඉලක්කයන් පිහිටුවීම සඳහා උන්වහන්සේගෙන් උපකාර ඉල්ලන්න. වාර්ෂික ඉලක්ක හඳුනාගැනීම මගින් වර්ෂයේ සෑම සතියකටම සුවිශේෂී සැලසුම් පිහිටුවීමට ඔබට ඉඩ ලැබෙනු ඇත.

සැලසුමක් සඳහා මිනිසුන් කිහිප දෙනෙකු එක්ව කටයුතු කරන විට, සෑම කෙනෙකුටම දින වකවානු පිළිබඳ සැලසුමේ විස්තර ඇතුළත් දින දර්ශනයක් අවශ්‍ය වේ. කවර දිනෙක කවර කාර්යයක් කළ යුතුද යන්න මතක තබා ගැනීමට මෙය උපකාරී වේ.

**අය-වැය සකස් කිරීම**

සැලසුම් කරන අවධියේ ඔබ වියදම් කිරීමට බලාපොරොත්තු වන මුදල සඳහන් කරමින් ඔබ අය-වැය ලේඛණයක් සකස් කෙළෙහිය.

ඔබ සැලසුම ක්‍රියාත්මක කරන විට මුදල් වැය කිරීම සඳහා මඟපෙන්වීමට මෙම අය-වැය ලේඛණය භාවිත කරන්න. ඔබ වියදම් කරන මුදල් පිළිබඳව දැනුවත්ව සිටීමට පහසුවීම සඳහා මුදල් වියදම් කළ යුතු කරුණත් ඒ සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණයත් සැබවින්ම වියදම් කළ මුදලත් ඉතිරියත් සඳහන් ලේඛණයක් සකස් කළ හැකිය. මේ සඳහා නිදර්ශනයක් පහත දැක්වේ.

**සැලැස්ම:** අප සභාවේ සෑම නව ඇදහිලිවන්තයෙකුටම බයිබලයක් ලබා දීම

**මූල්‍ය වාර්තාව**

| කාරණය | ඒ සඳහා වෙන්කර ඇති මුදල | අද දින තෙක් වියදම් කර ඇති මුදල | ඒ සඳහා ඉතිරිව ඇති මුදල |
|---|---|---|---|
| බයිබල් | / 300.00 | / 200.00 | / 100.00 |

ඔබට මුල් වැය සැලැස්ම වෙනස් කිරීමට සිදුවිය හැකිය. ඇතැම් ඒවාට ඔබ සිතුවාට වඩා වියදම් වන අතර ඇතැම් ඒවාට යන වියදම අඩුවිය හැකිය.

**තීරණ ගැනීම:**

ඕනෑම සැලැස්මක් ක්‍රියාත්මක කිරීමේදී ඒ හා සම්බන්ධ තීරණ රාශියක් නායකයා විසින් ගත යුතු වේ. තීරණ ගැනීමේ ශුද්ධ ලියවිලි ක්‍රියාවලිය, භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ, “*බයිබලීය කළමණාකරන මූලධර්ම*” හා “*දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම*” යන පාඨමාලාවල විස්තර කර ඇත. යහපත් තීරණ ගැනීම සඳහා උපකාර ලබා ගැනීමට මේවා බලන්න.

**නැවත බැලීම**

ඔබ සැලැස්ම ක්‍රියාත්මක කළ පසු, එහි ප්‍රගතිය පිළිබඳව නැවත බැලිය යුතුය. සැලැස්ම පිළිබඳව ක්‍රියා කරන අය මුණගැසී පහත දැක්වෙන දේ ගැන බලන්න.

- තමාට පවරා ඇති වගකීම් ඒ අය ඉටු කරන බවට සහතික වන්න.
- ඔවුන්ගේ වැඩ කිරීම සඳහා අවශ්‍ය මුදල්, උපකරණ හා සැපයුම් ඇති බවට සහතික වන්න.
- සැලැස්ම නියමිත කාල සීමාවන් තුළ ක්‍රියාත්මක වන්නේදැයි බලන්න.
- අය-වැය ලේඛණයට අනුකූලදැයි බලන්න.
- අවශ්‍ය විටෙක සැලැස්ම සංශෝධනය කරන්න.
- සැලැස්මේ කොටස් හා ඒවා ක්‍රියාත්මක කරන අය අතර සමායෝජනයක් ඇති කරන්න.
- සැලැස්මේ ගැටළු හෝ සැලැස්ම හා සම්බන්ධ පුද්ගලයන්ගේ ගැටළු විසඳන්න.

**ඇගයීම :**

ඇගයීම යනු සේවයේ පරමාර්ථය සාක්ෂාත් කිරීම සඳහා සැලැස්මක්, පරෙස්සමින් පරීක්ෂා කර බලා එහි අගය තීරණය කිරීමට ගන්නා ක්‍රියාවලියකි. ඊළඟ පාඩමේදී ඔබ සැලසුම් ඇගයීමට ඉගෙන ගන්නවා ඇත.

## අලුත් මුද්‍රික පානය හා පැරණි සම්භාජන

යේසුස්වහන්සේ, උන් වහන්සේගේ සේවය ආරම්භයේදී බොහෝ විරෝධතාවලට මුහුණු දුන් සේක. ඇතැමුන් ඒ ඉගැන්වීම් පැරණි ගිවිසුමේ සත්‍යයන් මත පදනම් වී තිබුණද පිළිගත්තේ නැත. අනෙක් අය උන්වහන්සේ කළ හාස්කම් පිළිගත්තේ නැත. ශ්‍රාවකයන් වීම සඳහා ඇතැම් අය කැඳවූ විට ඔවුහු එය ප්‍රතික්ෂේප කළහ. බොහෝ ආගමික නායකයෝ සම්ප්‍රදායෙන් බැඳී සිටි බැවින් වෙනස්වීම් ඔවුහු ප්‍රතික්ෂේප කළහ.

සාතන් සෑම විටම දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම්වලට විරුද්ධ වෙයි. දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සුසංගත වන ලෙස ඔබ සේවා සැලැස්මක් ක්‍රියාත්මක කරන සෑම අවස්ථාවකම ඔබට විරෝධතාවලට මුහුණ දීමට සිදුවේ. මේ පිළිබඳව යේසුස්වහන්සේ නිදර්ශන දෙකක් දුන්සේක. උන්වහන්සේ මෙසේ පැවසූසේක:

> **කිසිවෙක් තාන් රෙදි කැල්ලක් පරණ වස්ත්‍රයකට මහන්නේ නැතත මක්නිසාද එසේ කළොත් අණ්ඩයට ගත් රෙදි කැබැල්ල වස්ත්‍රයෙන් ඇදී, වඩා ලොකු ඉරුමක් වේ.**
>
> **අලුත් මුද්‍රික පානය පරණ සම්භාජනවල වත් නොකරති. වත්කළොත් භාජන පැළී, මුද්‍රික පානය වැගිරී ගොස් භාජනත් නාස්ති වන්නේය. නුමුත් අලුත් මුද්‍රික පානය අලුත් සම්භාජනවල වත් කරතිත එවිට දෙවගේම ආරක්ෂා වේ යයි කීසේක. (මතෙව් 9:16, 17)**

මෙම නිදසුන් මගින් යේසුස්වහන්සේ පෙන්වූයේ අලුත් සැලසුම් හා එළිදරව්වීම් පිළිගැනීමට ඇතැම්විට දැනට පවතින මිනිසුන්ගේ සම්ප්‍රදායික ආගමික ව්‍යුහයන්ට නොහැකි බවය. මෙය සත්‍යයක් බව ප්‍රේරිත වූ පාවුලු තුමා මෙන්ම යේසුස්වහන්සේද තම සේවයෙන් සොයා ගත් සේක. මෙය සත්‍යයක් බව ඔබද සොයා ගනු ඇත. එමෙන්ම දැනට පවතින ආගමික සංවිධාන ඇතුළතින්ද පිටතින්ද දක්වන විරෝධතාද ඔබ අත්දකිනු ඇත.

ඔබ එවැනි විරෝධතාවලට මුහුණ දෙන විට යේසුස්වහන්ස් හා පාවුලුතුමා කළ දේ අනුගමනය කරන්න. ඔවුහු දෙදෙනාමස හැකි පමණ පවතින ආගමික ව්‍යුහය තුළ ක්‍රියා කළහ. ඔවුහු නිරන්තරයෙන්ම සිනගෝග වල පැවති දේව මෙහෙයන්ට සහභාගි වූ අතර අවස්ථාව ලද විටෙක සේවය කළහ. ඔවුන් පැරණ ආගමික ව්‍යුහයන් විනාශ කළේ නැත. ඒවා එසේම පවතින්නට ඉඩ

හැරියහ. එහෙත් දෙවියන්වහන්සේ කරන අලුත් දේවලට බාධා පැමිණවීමට සාම්ප්‍රදායන්ට හා ආගමික නායකයන්ගේ විරෝධතාවලට වුවද ඉඩ දුන්නේ නැත.

සම්ප්‍රදායානුකූල ව්‍යුහයන් මගින් තමන් ප්‍රතික්ෂේප කළ විට, යේසුස්වහන්සේ හා පාවුලුතුමා තම සේවය ධර්මශාලාවෙන් පිටතට ගෙන ගියහ. ඔවුහු “අලුත් සම්භාජන” ඇති කළහ. මේ අලුත් ඇදහිලිවන්තයෝ අලුත් එළිදරව්වීම් හා අලුත් සංවිධාන ව්‍යුහයන් (පළමු සභාව) පිළිගැනීමට ආශාවෙන් සිටියහ. “අලුත් මුද්‍රික පානය” දරා ගැනීමට ඔවුහු සමත් වූහ. මෙය තවත් ආකාරයකින් ආත්මිකව ප්‍රකාශ කළහොත් “මළවුන් නැගුටුවීම” කළ හැකි දෙයකි. දෙවියන්වහන්සේ ඇතැම් අවස්ථාවල එසේ කරන සේක. එහෙත් අලුත් දරුවෙකු මෙලොවට ගෙන ඒම ඊට වඩා බොහෝ පහසු වේ.

## ස්වයං-පරීක්ෂණය

01. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

02. ක්‍රියා පිළිවෙළක් යනු කුමක්ද?

03. දෙවියන්වහන්සේගේ සැලසුම් හා පරමාර්ථවලට දක්වන විරෝධතාවන් පිළිබඳව කටයුතු කිරීමට අලුත් සම්භාජන හා අලුත් වස්ත්‍ර පිළිබඳ උපමාවන්ගෙන් එළිදරව් වන්නේ කවරක්ද?

04. සැලසුමක් ක්‍රියාත්මක කිරීමේදී පහත දැක්වෙන එක් එක් වගකීම් පිළිබඳව කෙටි විස්තරයක් වෙනම කොළයක ලියන්න.

- තෝරාගැනීම
- සන්නිවේදනය
- පැවරීම
- පුහුණු කිරීම
- සංවිධානය කිරීම
- කාල සැලැස්ම සැකසීම
- අය-වැය සැකසීම
- තීරණ ගැනීම
- නැවත බැලීම
- ඇගයීම

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

01. මෙහි දැක්වෙන්නේ සංවිධාන සටහනක සාම්පලයකි. මෙය සකස් කර ඇත්තේ හතරවන පරිච්ඡේදයේ විස්තර කර ඇති සැලැස්මට හා සුවිශේෂී සභාවක් අසල වෙසෙන ස්පාඤ්ඤ භාෂාව කථා කරන අය වෙත ශුභාරංචිය ගෙන යෑම සඳහාය. තවත් සංවිධානාත්මක සටහන් සාම්පල මෙම අත්පොතේ ඇමුණුමේ සපයා ඇත.

ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

|

පාලක තුමා

|

අධ්‍යක්ෂක
ජෝ ස්මිත්

| | | | | |
|---|---|---|---|---|
| කොටසක සභාපති | කොටසක සභාපති | කොටසක සභාපති | කොටසක සභාපති | කොටසක සභාපති |

සැලසුමේ අධ්‍යක්ෂක ජෝ ස්මිත්, සභාවේ පාලක තුමාගේ නායකත්වය යටතේ මෙම පදවියේ කටයුතු කරයි.
සභාපතිවරුන් පස්දෙනෙකු පත් කර ඇත. සෑම කෙනෙක්ම දේවස්ථානය වටා සැතපුමක් ඇතුළත කොටසක වගකීමක් සහිතව වේ.
සැලසුම සම්පූර්ණ කිරීම සඳහා ජෝ ස්මිත් සභාපතිවරුන්ට මඟ පෙන්වයි. ගෙයින් ගෙට ගොස් ශුභාරංචිය බෙදාගැනීම, සෑම නිවෙසකම ශුභාරංචි පත්‍රිකාවක් තැබීම සහ අලුතින් හැරුනු සෑම කෙනෙකුටම යොහන්ගේ ශුභාරංචිය දීම මෙම සැලසුමට අයත්ය.

02. ඕනෑම සංවිධානයක එක්කෙනෙක් තවත් කෙනෙකුට "වඩා ශ්‍රේෂ්ඨ" නොමැති බව මතක තබා ගන්න. අපි සියලු දෙනාම දෙවියන්වහන්සේගේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා එකට වැඩ කරන ක්‍රිස්තුස්වහන්සේගේ එකම ශරීරයේ සාමාජිකයෝ වෙමු. (එපීස 1:22-23; 4:15-16; කොලොස්සි 1:18; හා 1 කොරින්ති 12 බලන්න)

03. කිතුනු නිවසක කළමණාකරනය සඳහා සංවිධානාත්මක ව්‍යුහයක් බයිබලයේ දී ඇති බව ඔබ දන්නෙහිද? මෙම සංවිධාන සටහනක පෙනෙන අයුරු පහත දැක්වේ.

දෙවියන්වහන්සේ

|

ස්වාමිපුරුෂයා

|

භාර්යාව

|

දරුවෝ

ස්වාමිපුරුෂයා නිවසේ ප්‍රධානියා වේ. භාර්යාව උපකාර කරන සහකාරියය. දරුවන් පියාටද මවටද යටත්ව ජීවත් විය යුතුය.

04. නික්මයාම 18:13-27 හි සඳහන් මෝසෙස්ගේ සැලැස්ම සඳහා සංවිධානාත්මක සටහනක් පහත දැක්වේ.

දෙවියන්වහන්සේ
|
මෝසෙස්
|
දහසකට පාලකයෝ
|
සියයකට පාලකයෝ
|
පනහකට පාලකයෝ
|
දහයකට පාලකයෝ
|

"දහසකට පාලකයෝ" සියයකට වඩා සිටියහ. මේ සෑම සිය දෙනෙක්ම, දස දෙනෙකුගේ කුඩා කණ්ඩායම් මෙහෙය වූ පණස් දෙනෙකුට මඟ පෙන්වූහ. "දහයකට පාලකයන්" වූ මේ නායකයෝ පණස් දෙනා තම ගැටළු "පණහකට පාලකයන්" වෙත ගෙන ගියහ. "පණහකට පාලකයින්" "සියයකට පාලකයින්ට" වාර්තා කළ අතර, මෙම "සියයකට පාලකයෝ" වැදගත් තීරණ "දහසකට පාලකයින්" වෙත ගෙන ගියහ. වැදගත් දේ පමණක් තීරණ ගැනීම සඳහා "දහසකට පාලකයන්" මෝසෙස් වෙත ගෙන ගියේය.

05. මෝසෙස් ඉශ්රායලයේ නායකත්වය භාරගත් විට දෙවියන්වහන්සේ ඔහුට ප්‍රධාන වගකීම් හතරක පැවරූ සේක. (නික්මයාම 18:19-21)

පළමුවැන්න, සෙනඟගේ ප්‍රශ්න දෙවියන්වහන්සේ වෙත ගෙන ඒම.

දෙවැන්න, ඔවුන් ගමන් කළ යුතු ආකාරය ඉගැන්වීම. [ආත්මිකව මඟපෙන්වීම ලබා දීම]

තෙවැන්න, ඔවුන් කරන කාර්යයන් සඳහා පුහුණු කිරීම.

සිවුවැන්න, නායකත්වයේ බර දරා ගැනීමට තමාට උපකාර කිරීමට දක්ෂ නායකයින් තෝරා ගැනීම. [වගකීම් අන් අයට පැවරීම]

06. දැන් ඔබ සංවිධානාත්මක සටහන්වල සාම්පල දැක ඇති බැවින් ඔබ සේවයේ ක්‍රියාත්මක කළ සැලැස්මක් සඳහා සටහනක් සකස් කරන්න.

07. සන්නිවේදනය සඳහා බාධක කීපයක් පහත දැක්වේ. ඔබගේ සැලැස්මක් තවත් කෙනෙකුට හරිලෙස සන්නිවේදනය කිරීම සඳහා මින් සමහරක් ජය ගැනීමට සිදුවිය යුතුවේ.

- විවිධ භාෂාව
- අසීරු වචන
- අවශ්‍ය තොරතුරු මඟ පෙන්වීම
- බිය
- ප්‍රාග් විනිශ්චය
- අවධානය නොමැතිවීම
- අපැහැදිලි පණිවුඩ
- නොදැනුවත්කම
- සම්ප්‍රදාය

- දුර්වල අධ්‍යාපනය
- මුරණ්ඩුකම

08. සැලැස්මක් සම්පූර්ණ කිරීමේ වැදගත්කම දැක්වෙන බයිබලයෙන් කොටසක් පහත දැක්වේ. පාවුලුතුමා මෙම පණිවුඩය යවන ලද්දේ කොරින්තියේ ඇදහිලිවන්තයින් වෙතය.

**මේ කාරණය ගැන මාගේ කල්පනාව කියමි. මක්නිසාද අවුරුද්දකට ප්‍රථම සිට ඒක කරන්ට පමණක් නොව ඊට කැමති වෙන්ටත් පටන්ගත් නුඹලාට ඒක ප්‍රයෝජනවත්ය. ඉතින් කැමතිවීමට සූදානම්ව සිටියාක් මෙන්ම නුඹලාගේ පුළුවන් කමේ හැටියට එහි තීන්දුවත් පැමිණෙන පිණිස දැන් කිරීමත් තීන්දු කරපල්ලා. (2 කොරින්ති 8:10-11)**

09. බයිබල් යුගයේදී විස්තරාත්මකව සැලසුම් කළ හා ක්‍රියාත්මක කළ දෙයක් නම් මණ්ඩපය ගොඩනැගීමේ සැලැස්ම වේ. පහත දැක්වෙන යොමු කිරීම් ඔබ අධ්‍යයනය කරන විට, බයිබලයේ සඳහන් අරමුණු මගින් කළමණාකරනය පිළිබඳව ඔබ උගත් දේ ගැන සිතන්න.

- පරමාර්ථය තහවුරු කිරීම : නික්මයාම 25:8
- සැලැස්ම සකස් කිරීම : නික්මයාම 25 -31

- සැලැස්ම ක්‍රියාත්මක කිරීම :
  - තෝරාගැනීම : නික්මයාම 35:30-35; 36:2
  - සන්නිවේදනය : නික්මයාම 35
  - පැවරීම : නික්මයාම 36:1-3
  - පුහුණු කිරීම : නික්මයාම 35:34
  - සංවිධානය : නික්මයාම 36-40
  - කාලය වෙන්කිරීම : නික්මයාම 36-40
  - අය-වැය ලේඛණය : නික්මයාම 35; 36:5-7
  - තීරණ ගැනීම : නික්මයාම 36:6-7
  - නැවත බැලීම : නික්මයාම 39:43
  - සැලැස්ම ඇගයීම් : නික්මයාම 39:43; 40:33-35

# හයවන පරිච්ඡේදය

## පරිපූර්ණ කිරීම: සැලැස්ම ඇගයීම

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට

- "ඇගයීම" යන්න අර්ථ විග්‍රහ කිරීමට
- ඇගයීම වැදගත් වන්නේ මන්දැයි සාකච්ඡා කිරීමට
- ඇගයීමේ ක්‍රියාවලියක් තහවුරු කිරීමට
- ඔබ ක්‍රියාත්මක කළ සැලසුම් ඇගයීමට
- සැලසුම් අසාර්ථක වීමට හේතු හඳුනාගැනීමට
- ඔබගේ ඇගයීම් ප්‍රතිඵල භාවිතයෙන් දැනට පවතින සැලසුම් වැඩිදියුණු කිරීමට හා අලුත් සැලසුම් සකස් කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය:**

**නුඹලා එකිනෙකා සුදුසු තරමට වඩා තම තමා ගැන උතුම්කොට නොසිතා, දෙවියන්වහන්සේ එකිනෙකාට බෙදා දුන් ඇදහිල්ලේ ප්‍රමාණය ලෙස පමණ දැන සිතන හැටියට මට දෙන ලද අනුග්‍රහයෙන් නුඹලා අතරෙහි එකිනෙකාට කියමි. (රෝම 12:3)**

### හැඳින්වීම

ඔබ හතරවන පරිච්ඡේදයෙන් අරමුණු සකස් කිරීමටත් දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් අනුව සැලසුම් කිරීමටත් උගත්තෙහිය. සැලසුම් ක්‍රියාත්මක කරන අයුරු ඔබ පස්වන පරිච්ඡේදයෙන් උගත්තෙහිය. මෙම පාඩමෙන් පැහැදිලි කෙරෙන්නේ ඔබගේ අරමුණු සාක්ෂාත් කරගෙන ඇත්දැයි බැලීමට සැලසුම් අගයන ආකාරය වේ.

### ඇගයීම

ඔබ යමක් ඇගයීමට ලක් කරන විට ඔබ එය පරෙස්සමෙන් පරීක්ෂා කර බලා, එහි අගය ගැන සැලකිලිමත් වේ. ඇගයීම යනු ඔබගේ සේවයේ පරමාර්ථය සාක්ෂාත් කරන විට එහි සැලසුම් පරීක්ෂා කර බලා ඒවායේ අගය තීරණය කිරීමේ ක්‍රියාවලිය වේ.

ඔබ කිරීමට සැලසුම් කරන දෙය අරමුණුවලින් සඳහන් කරයි. එම අරමුණු ඉටු වී ඇත්දැයි ඇගයීම මගින් නිර්ණය කරයි. දෙවියන්වහන්සේ වුවද උන්වහන්සේගේ කාර්යයන් ඇගයීමට ලක් කළ සේක. උත්පත්ති 1 වන පරිච්ඡේදයේ උන්වහන්සේ මවන ලද සියල්ල දෙස බලා "එය යහපත්ය"යි පැවසූ සේක.

### ඇගයීමේ වැදගත්කම

ඇගයීම මගින් ඔබ දෙවියන්වහන්සේටද ඔබ සේවය කරන අයට හා ඔබ සමඟ සේවයේ යෙදෙන අයටද එමෙන්ම ඔබටමද ගණන් දීමකට ඉඩ සැලසේ.

ආරම්භයේ සිටම දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සැලසුම් සම්පූර්ණ කිරීම පිළිබඳව ගණන් දීම මිනිසාට පැවරූ සේක. ආදම්ට හා ඒවට ඒදන් උයනේ වගකීම් පවරා තිබිණි. ඒ සඳහා ඔවුන් දෙවියන්වහන්සේට ගණන් දිය යුතු විය.

ඔබ, ඔබගේ ජීවිතය හා සේවය ඇගයීම සඳහා "සිහි බුද්ධියෙන් යුතුව කල්පනා කරන්න" යි බයිබලයේ සඳහන් වේ.

**නුඹලා එකිනෙකා සුදුසු තරමට වඩා තම තමා ගැන උතුම්කොට නොසිතා, දෙවියන්වහන්සේ එකිනෙකාට බෙදා දුන් ඇදහිල්ලේ ප්‍රමාණය ලෙස පමණ දැන සිතන හැටියට මට දෙන ලද අනුග්‍රහයෙන් නුඹලා අතරෙහි එකිනෙකාට කියමි. (රෝම 12:3)**

ප්‍රේරිත වූ පාවුලුතුමා මෙසේ පැවසීය:

**උතුම් වූ දේවල් ඒත්තු ගන්ට නුඹලාට පුළුවන් වෙන්ටත් ක්‍රිස්තුස්වහන්සේගේ දවස දක්වා අවංකව නිදොස්ව සිටින්ටත්... යාච්ඤා කරමි (පිලිප්පි 1:10).**

ඔබගේ සේවය වෙනුවෙන් ඔබ දෙවියන්වහන්සේට වගකිව යුතු බව මතෙව් 25:14-30 හි දැක්වෙන තලෙන්ත පිළිබඳ උපමාවෙන් පැහැදිලි කර ඇත. එමෙන්ම ඔබ සේවය කරන අය වෙනුවෙන් ඔබට වගකීමක් ඇති බව බයිබලය ඔබට උගන්වයි.

**නුඹලා අතරෙහි සිටින දෙවියන්වහන්සේගේ රැළ බලාගනිමින්, බලාත්කාරය නිසා නොව දේව කැමැත්ත ලෙස සතුටු සිතින්ද නින්දිත ලාභය නිසා නොව මනාප සිතකින්ද නුඹලාගේ භාරයට දෙන ලද්දවුන් කෙරෙහි අධිපතිකම් කරන්නාක් මෙන් නොව නුඹලාම රැළට ආදර්ශව සිටිමින්ද එය රැකබලා ගනිල්ලා (1 පේත්‍රුස් 5:2-3).**

ඔබ සමඟ සේවයේ යෙදෙන අයටද නුඹ ගණන් දිය යුතු බව බයිබලය උගන්වයි. ඔබ මනුෂ්‍ය ශරීරය මෙන් එකට වැඩ කරන්නෙනිය.

**නුඹ මට ඕනෑ නැතැයි අතට කියන්ට ඇසටවත් නුඹලා මට ඕනෑ නැතැයි පාදවලට කියන්ට හිසටවත් නුපුළුවන (1 කොරින්ති 12:21).**

ඔබ විනිශ්චය දවසේ දෙවියන්වහන්සේ ඉදිරිපිට සිටින විට ඔබගේ වැඩවල අගය නිර්ණය කිරීම සඳහා ඇගයීමට ලක් කෙරෙනු ඇත.

**නුමුත් අත්තිවාරම පිට යමෙක් රන්, රිදී, අනර්ඝ ගල්, ලී, තෘණ, පිදුරු ගොඩ ගසන්නේ නම්, එක් එක්කෙනාගේ කර්මාන්තය ප්‍රකාශ වන්නේය. මක්නිසාද එය ගින්නෙන් එළිදරව් වන නිසා ඒ දවස තෙමේ එය ප්‍රකාශ කරන්නේය. එක් එක්කෙනාගේ කර්මාන්තය කොයි ආකාරදැයි ගින්නෙන්ම ඔප්පු වන්නේය (1 කොරින්ති 3:12-13).**

දෙවියන්වහන්සේට පරිසමාප්ත සැලසුම් ඇත. එහෙත් උන්වහන්සේ අපරිපූර්ණ මිනිසුන් තුළින් උන්වහන්සේගේ කාර්යයන් ඉටු කරගැනීමට ක්‍රියා කරනු ඇත. ඔබ අපරිපූර්ණ බැවින් ඔබ නිරන්තරයෙන්ම ඔබගේ සේවය ඇගයිය යුතුය. ඔබ දෙවියන්වහන්සේගේ සැලසුම් හා පරමාර්ථ නිසියාකාරව සම්පූර්ණ කරන්නෙහිදැයි නිර්ණය කිරීමට ඇගයීම උපකාර වන බැවින් එය වැදගත් වේ. ඇගයීම, ඔබගේ සාර්ථකවීම් හා අසාර්ථකවීම් මගින් ඉගෙනීමටද දැනට ඇති සැලසුම් සංශෝධනය කිරීමටද අලුත් සැලසුම් සකස් කිරීමටද ඔබට ඉඩ සලසයි. ඔබ සැබවින්ම දෙවියන්වහන්සේගේ කාර්යයන්හි නියැලෙන්නෙහි නම්, එය උත්කෘෂ්ටව කිරීම වැදගත් වේ.

## ඇගයීමේ ක්‍රියාවලිය

ඔබ අරමුණු ලිවීමට ඉගෙන ගත්තේ ඒවා සාක්ෂාත් කරගෙන ඇත්දැයි මැනීමෙන් හෝ ඇගයීමෙන් හෝ බැලීමට හැකිවන පරිද්දෙනි. එමෙන්ම සැලැස්මේ ප්‍රගතිය පිරික්සීමට දින වකවානුද ඇතුළත් කළෙහිය. ඇගයීම් ක්‍රියාවලියක් යනු ඔබගේ සැලසුම් අගයන ක්‍රමයක් වේ.

ඇගයීම් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර කීපයක් පහත දැක්වේ.

01. මැනිය හැකි අරමුණු ලියන්න. එවිට ඒවා ඉටු කර ඇත්දැයි ඔබට බැලිය හැකිය.

02. සැලසුමේ ප්‍රගතිය පිරික්සීම සඳහා දින නියම කරගන්න.

03. ඇගයීම ආරම්භ කිරීමට පෙර යාච්ඤා කරන්න. ඔබ නිවැරදි කරගත යුතු දුර්වලතා පෙන්නුම් කරන ලෙසත් ඔබ සකස් කළ යුතු අතිරේක සැලසුම් සඳහා මඟපෙන්වන ලෙසත් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

04. සැලසුම නියමිත කාලය අනුව ක්‍රියාත්මක වන්නේද හා අපේක්ෂිත ඉලක්කය සාක්ෂාත් වන්නේදැයි බැලීමට ඇගයීමෙහි නිරත වන්න.

එය සිදුවන්නේ නම්, ඔබ සැලසුම් කළ පරිදි ඉදිරියට යන්න.

එසේ නොවේ නම් ඔබට...

- අරමුණු සංශෝධනය කිරීමට සිදුවිය හැකිය. එහි ඇතැම් කොටස් නැවත ලියන්න, නැතහොත් අලුත්ම සැලැස්මක් සාදන්න. ඔබ දෙවියන්වහන්සේගේ පූර්ණ අනාගත සැලැස්ම නොදන්නා බැවින් වෙනස්වීම් වලට ඔබ විවෘත විය යුතුය. සංශෝධනය කිරීම ඇදහිල්ල වර්ධනය වීමේ ක්‍රියාවලියේ කොටසකි.

- මෙම අරමුණ සඳහා ක්‍රියා කරන සෙනඟ වෙනස් කරන්න. ඔබට මීට වඩා වැඩි හෝ අඩු හෝ සෙනඟක් අවශ්‍ය විය හැකිය. නැතහොත් උනන්දුව අඩු අය ඉවත් කර අලුත් අය පත් කිරීමට සිදුවිය හැකිය.

- අවසන් කරන දිනය වෙනස් කරන්න: ඔබ මුලින් සිතුවාට වඩා වැඩි කාලයක් මේ සඳහා අවශ්‍ය විය හැකිය. එමෙන්ම ප්‍රගතිය පිරික්සීම සඳහා වැඩිදුර ඇගයීම් දින අවශ්‍ය විය හැකිය.

- ක්‍රමවේදයන් වෙනස් කරන්න: අරමුණ යහපත් විය හැකිය, එහෙත් එය ඉටු කිරීමට යොදන ක්‍රමවේදයන් නුසුදුසු විය හැකිය.

- අයවැය ලේඛණය වෙනස් කරන්න. මුලින් සැලසුම් කළාට වඩා වියදම් වෙනස් නම් අයවැය ලේඛණය වෙනස් කිරීමට සිදුවේ.

05. ඔබ සැලසුමක් සම්පූර්ණ කළ විට මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට එය අගයන්න.

- ඔබ ඉලක්කය කරා ළඟා වුනෙහිද? ඔබ ආරම්භ කළ දෙය අවසන් කළෙහිද? සතුරා ඔබගේ මඟ වෙනස් කළෙහිද? සිදුකළ ක්‍රියාකාරකම් පදනම් කරගෙන ඇගයීමෙහි නොයෙදෙන්න. ප්‍රතිඵල පදනම් කරගෙන ඇගයීම කරන්න. සැලසුමේ කොටසක් වූ ක්‍රියාකාරකම් බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලබා දුන්නේද?

- එය සැබවින්ම ඔබගේ පරමාර්ථය සම්පූර්ණ කිරීමට ඔබ බලාපොරොත්තු වූ පරිදි දායක වූයේද?

- ඔබ අසාර්ථක වූයේ කොතැනදීද? එසේ වූයේ මන්ද? කෙසේද? අසාර්ථක වීමට හේතු මොනවාද? ඔබගේ දුර්වලතාවන් නිසා අධෛර්ය නොවන්න. ඒවා දෙවියන්වහන්සේගේ බලය එළිදරව් කෙරෙන අවස්ථාවන් ලෙස සලකන්න.

- ඔබ සාර්ථක වූයේ කොතැනදීද? එසේ වූයේ මන්ද? කෙසේද? සාර්ථක වීමට හේතු කවරේද?

- ඔබට මීට වඩා වෙනස්ව කළ හැකිව තිබුණේ කවරක්ද? වෙනස් ක්‍රමවේද? වෙනස් මිනිසුන්? වෙනස් සැලසුම්?

- සහභාගි වූ සෙනඟ සේවය සඳහා ඵලදායිව යොදා ගත්තේද? ඔවුන්ගේ කාර්යයන් ඔවුන්ගේ ආත්මික දීමනා වලට උචිත වූයේද? ඔවුන් පරමාර්ථය වටහා ගත්තේද? ඔවුන් සැලසුම සම්පූර්ණ කිරීමට පෙළඹුනිද?

- මෙම සැලසුම නැවත භාවිත කළ හැකිද? මෙම තීරණය ගැනීමට ඔබට මඟපෙන්වන ලෙස ස්වාමින්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඇතැම් සැලසුම් නැවත භාවිත කළ හැකිය. එහෙත් ඇතැම්විට දෙවියන්වහන්සේට අලුත් සැලසුම් ඇත.

- අලුත් සැලසුම් සෑදීමට උපකාරී වීමට ඔබට මෙයින් උගත හැක්කේ කවරක්ද?

## සැලසුම් අසාර්ථක වන්නේ මන්ද?

දෙවියන්වහන්සේගේ සැලසුම් සෑමවිටම පරිපූර්ණය. එහෙත් උන්වහන්සේ අපරිපූර්ණ උපකරණ පිමිනිසුන්] ඇසුරෙන් ක්‍රියා කරන බැවින් ඇතැම්විට සැලසුම් අසාර්ථක වේ.

නිදසුනක් වශයෙන්:

- ජීදන් උයන මිනිසා වෙනුවෙන් දෙවියන්වහන්සේගේ සැලැස්ම විය. එහෙත් මිනිසා අසාර්ථක විය.

- ඉශ්රායලය සඳහා දෙවියන්වහන්සේගේ සැලසුම වූයේ මිථ්‍යා දෘෂ්ටි ජාතීන් වෙත සාක්ෂි දැරීමය. එහෙත් ඔවුහු අසමත් වූහ.

- සාවුල් රජ, සැම්සන් හා අනෙකුත් අය වෙනුවෙන් වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම අසාර්ථක වූයේ ඔවුන් අපරිපූර්ණ මනුෂ්‍යයන් වූ බැවිනි.

සෑමවිටම අසාර්ථකවීම් සිදුවන්නේ දෙවියන්වහන්සේ සමඟ සුසංගතව ක්‍රියා කිරීමට මිනිසාගේ ඇති අකමැත්ත නිසාවේ.

සැලසුම් අසාර්ථක වීමේ පොදු හේතු සමහරක් පහත දැක්වේ:

01. දර්ශනයේ ඌණතාවන්: සැලැස්මේ කොටසක් වූ පරමාර්ථය නැතහොත් දර්ශනය සෙනඟ අවබෝධ කරගත්තේ නැත.

02. පුහුණුවේ ඌණතාවන්: සැලැස්මේ කොටසක් ලෙස ඔවුන්ට නියමිත කාර්යයන් සඳහා සෙනඟ පුහුණු කළේ නැත. දෙවියන්වහන්සේ සෑමවිටම සෙනඟ සූදානම් කරන්නේ ඔවුන් කළ යුතු කාර්යයන් සඳහා වේ. නායකයින් මේ ආකාරයෙන් කටයුතු කළ යුතු වේ.

03. ආත්මික දීමනා අනිසි ලෙස භාවිත කිරීම: සැලසුම තුළ සෙනඟ අස්ථානගත වූහ. නිදසුනක් ලෙස එවැන්ජලිස්ත දීමනා සහිත කෙනෙක් පාලක වරයෙකු ලෙස කටයුතු කිරීම.

04. මිල ගෙවීමට අකමැති වීම. සෙනඟ හා / හෝ නායකත්වය සැලසුම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය යාච්ඤාව, කාලය, ශ්‍රමය හෝ මුදල් කැප නොකිරීම.

05. යාච්ඤාවේ ඌණතාව: සැලැස්ම සකස් කළේ ස්වාමින්වහන්සේගේ මඟපෙන්වීම නොමැතිව වේ.

06. අපැහැදිලි සැලසුම: අරමුණු නිසියාකාරව සඳහන් කර නොතිබිණි.

07. සන්නිවේදනයේ ඌණතාව: සැලසුම, ඊට සම්බන්ධ අයට පැහැදිලිව සන්නිවේදනය නොකෙරුණි.

08. ඇගයීමේ ඌණතාව: දේවල් සිදුවන ආකාරය කිසිවෙක් පරීක්ෂා කළේ නැත. එබැවින් අසීරුතා පැමිණි විට සැලසුම සුනු විසුනු විය. අවසන් කළ යුතු දිනය පැමිණියේය. එහෙත් කිසිවෙක් සූදානම්ව නොසිටියහ. ඇගයීමක් නොකළ නිසා ගැටළු සමඟ කටයුතු කිරීමට අසමත් විය.

09. බිය: විවේචනයට, අසාර්ථක වීමට හෝ මනුෂ්‍යයාට බිය වීම.

10. අවිශ්වාසය: ඔබ තුළින් ක්‍රියා කිරීමට දෙවියන්වහන්සේට හැකියාවක් ඇති බව අවිශ්වාස කිරීම.

11. අතපසු කිරීම: මින් අදහස් වන්නේ කළ යුතු දේවල් පසුවට කල් දැමීම, යහපත් කාලයක් එනතුරු බලා සිටීම, වඩා හොඳ අවස්ථාවක් එනතුරු බලා සිටීම, ප්‍රමාද කිරීම ආදිය.

12. නිදහසට කරුණු කීම: නිවැරදි කරගන්නවා වෙනුවට අසාර්ථකවීම් සාධාරණීකරණය කිරීම.

13. අලසකම: කම්මැලිවීම, හැඟීමක් නොමැති වීම, අලසව කටයුතු කිරීම.

14. ආත්මාර්ථකාමීත්වය: ඉලක්කයන් සපුරා ගැනීමට තමකම නැති කරගත යුතුය. ඔබට ගිජුකම හෝ ආත්මාර්ථකාමී වීම හෝ තිබිය නොහැකිය. ඔබට නිර්ලෝභී ආත්මයක් තිබිය යුතුය.

15. එක්සත් කමේ ඌණතාව: මිනිස්සු දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් සඳහා එක්ව ක්‍රියා නොකර "තමාගේම දේ" කළහ.

16. අකීකරුකම: මිනිසුන් බලධාරීන්ට අවනත වූයේ නැත.

17. සැලසුම් සංශෝධනය කිරීමට අසමත් වීම: සැලසුම නැවත සකස් කළේ නැත. සෙනඟ අවශ්‍ය ආකාරයට වෙනස් වූයේද නැත. යම්කිසි දෙයක් අතීතයේදී යම් ආකාරයකට කළ නිසාම වර්තමානයේද දෙවියන්වහන්සේ සැලැස්මට එය ඵලදායී වේ යයි සිතිය නොහැකිය.

18. අත්දැකීම් තුළින් ඉගෙනීමට අසමත් වීම: ඔබ ඇගයීමක් නොකර අත්දැකීම් වලින් ඉගෙන නොගෙන සිටි විට වරදවල් නැවත නැවත සිදුවේ.

19. විස්තරවලට අවධානය යොමු නොකිරීම: සැලැස්මකට බොහෝ විට විස්තර ඇතුළත්ය. මේ සියල්ල නිසියාකාරව සමායෝජනය නුවුවහොත් සැලැස්ම අසාර්ථක විය හැකිය.

20. නිහතමානී සේවයක් සැපයීම ප්‍රතික්ෂේප කිරීම: ඔබ කැඳවා ඇත්තේ අන් අයට සේවය කිරීමටය. ඔබට මෙය අමතක වී ඔබ අහංකාර වූ විට සැලසුම් අසාර්ථක වේ.

21. සැලසුම් කිරීම සඳහා සිදුවන ආකල්ප ගැටළු: පහත දක්වෙන කියමන් වලින් මෙය පැහැදිලිව පෙනේ:

- "අප එය සැමවිට කළේ ඒ ආකාරයෙනි"
- "අපි සැලසුම් කිරීමට කැමති නොවෙමු"
- "සැලසුම් කිරීම ශුද්ධ ලියවිල්ලට අදාළ නැත"
- "පසුගිය වර්ෂ 40 ට මෙය සාර්ථක විය"
- සැලසුම් කිරීම ආත්මික නොවේ"
- "අපි ඇදහිල්ලෙන් ඉදිරියට යමු. අපට සැලැස්මක් අවශ්‍ය නැත"
- "සැලසුම් කිරීමට තරම් කාලයක් අපට නැත"
- "මෙතරම් කලකට පසු අප වෙනස් විය යුත්තේ මන්දැයි මට නම් නොපෙනේ"

22. නිවැරදි නායකත්වයේ ඌණතාව: සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා.

23. මුදල් නොලැබීම.

24. සේවකයන්ගේ ඌණතාව: සැලසුම සම්පූර්ණ කිරීම සඳහා.

25. ඇගයීමේදී අවංක වීමට නොහැකි වීම.

26. සතුරාගේ ආත්මික ප්‍රහාරය: ඔබගේ පරමාර්ථය අසාර්ථක කිරීමට සාතන් උත්සාහ කරනු ඇත (එස්රා 4:1-5 බලන්න).

27. කෙඳිරීම: ඔබ සැලැස්මක් හෝ දෙවියන්වහන්සේගේ වැඩක් ආරම්භ කරන ඕනෑම අවස්ථාවක, එය පියවර කිපයක් හරහා ගමන් ගනු ඇත.

නිදසුනක් වශයෙන්, මුල් සභාවේ

- ක්‍රියා 1 : දෙවියන්වහන්සේ ඇතැම් මිනිසුන් තෝරා ගත්සේක.
- ක්‍රියා 2 : උන්වහන්සේ ඔවුන්ට එක්තරා සේවයක් දුන්සේක.
- ක්‍රියා 3 : මෙහිදී වැඩිවීමක් සිදුවිය.
- ක්‍රියා 4 : සභාව නමැති ව්‍යාපාරය බිහිවිය.
- ක්‍රියා 5 : මිනිසුන් අතර කෙඳිරීමක් පැණ නැගිනි.

නෙහෙමියා පොතේද මේ රටාවම දැකගත හැකිය.

- නෙහෙමියා 1 : දෙවියන්වහන්සේ මිනිසෙකු තෝරා ගත්සේක.
- නෙහෙමියා 1-2 : උන්වහන්සේ මේ මිනිසාට සේවයක් දුන්සේක.
- නෙහෙමියා 2-3 : වැඩ කරන සෙනඟ වැඩි විය.
- නෙහෙමියා 2-4 : සැලසුම පිහිටුවන ලදි.
- නෙහෙමියා 5 : මිනිසුන් අතර කෙඳිරීමක් පැණ නැගිනි.

සේවාවන් හා සැලසුම් කෙඳිරීමේ තත්වයට පත් වූ විට, එම ගැටළුව ගැන කටයුතු කළ යුතුය. නැතහොත් සැලසුමට මහත් බලපෑම් ඇතිවිය හැකිය. නෙහෙමියා මෙම කෙඳිරීම ගැන කටයුතු කළේ යාච්ඤාවෙන් හා වඩා යහපත් සංවිධානයක් මගිනි. (නෙහෙමියා 5)

ප්‍රේරිතවරුද කෙඳිරීම ගැන කටයුතු කළේ යාච්ඤාවෙන් හා වඩා යහපත් සංවිධානය මගින් වේ. (ක්‍රියා 6)

ඉශ්‍රායෙල්වරුන්ගේ කෙඳිරීම සම්පූර්ණයෙන්ම විසඳුනේ නැත. මේ නිසා අලුත් පරම්පරාවක් පැමිණෙන තුරු දෙවියන්වහන්සේගේ සැලැස්ම ප්‍රමාද විය.

## ඇගයීමේ ප්‍රතිඵල භාවිත කිරීම

ඔබ උගත් දේ ඔබ භාවිත කරන්නේ විවිධාකාර ඇගයීම් මගිනි.

01. ඇගයීම මගින් අරමුණුවල දුර්වලතා පෙන්නුම් කරයි. මේ දුර්වලතා මඟහරවා ගැනීමට ඔබ දැනට පවතින සැලසුම් සංශෝධනය කරන්නෙහිය.

02. පැරණි සැලසුම් සම්පූර්ණ වන විට ඔබ අලුත් සැලසුම් සාදන්නෙහිය.

03. ඔබගේ සාර්ථක වීම් මගින් ඔබ ඉගෙන ගන්නෙහිය. සාර්ථක වූ සැලැස්මක් නැවත භාවිත කරන ලෙස දෙවියන්වහන්සේ ඔබට මඟපෙන්විය හැකිය.

04. ඔබ වැරදීම්වලින් ඉගෙන ගන්නෙහිය. ඔබ අසාර්ථක වීමට හේතුව සොයා ගන්නා අතර එම වරද නැවතත් ඇති නොවන ලෙසට කටයුතු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරනු ඇත.

**අඛණ්ඩ චක්‍රයක්**

සැලසුම් කිරීම යනු අඛණ්ඩ චක්‍රයකි. ඔබ සැලසුම් සාදයි, ඒවා ක්‍රියාත්මක කරයි, ඒවා අගයයි හා ඉන්පසු තවත් සැලසුම් සකස් කරනු ලබයි.

ඔබ සේවයේ සාර්ථකත්වයක් ලැබීමට නම්, මෙම චක්‍රය ඔබගේ පරමාර්ථය සම්පූර්ණ වී ජීවිත කාර්යයන් සම්පූර්ණ කරන තුරු අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

## ස්වයං-පරීක්ෂණය

01. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

02. "ඇගයීම" අර්ථ දක්වන්න.

03. ඇගයීම වැදගත් වන්නේ මන්ද?

04. ඇගයීම් ක්‍රියාවලියක් තහවුරු කෙරෙන පියවර සාකච්ඡා කරන්න.

05. සැලසුම් අසාර්ථක වන පොදු හේතු අවම වශයෙන් පහක්වත් ලියන්න.

06. ඇගයුම් ප්‍රතිඵල භාවිත කළ හැකි මාර්ග හතරක් හඳුනාගන්න.

07. ඔබ ක්‍රියාත්මක කළ සැලසුම් සමහරක් අගයන්න. ඔබ ඇගයුම් මගින් ලද ප්‍රතිඵල දැනට පවතින සැලසුම් වැඩි දියුණු කරන්නටත් අලුත් සැලසුම් සකස් කරන්නටත් භාවිත කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

01. යොහාන් 17 අධ්‍යයනය කරන්න. මෙම යාච්ඤාවෙන් යේසුස්වහන්සේ තමන්වහන්සේගේ මුල් සේවය ඇගයීමට ලක් කරන සේක.

02. පැරණි ගිවිසුමේ නෙහෙමියා නම් මනුෂ්‍යයෙකුට දෙවියන්වහන්සේ විසින් දෙන ලද පරමාර්ථයක් තිබිණි. ඒ ජෙරුසලමේ පවුර නැවත ගොඩනැගීමය. ඔහු පරිසරය විශ්ලේෂණය කර, අරමුණු පිහිටුවා සැලසුම ක්‍රියාත්මක කළේය. ඔහු මෙය කරගෙන යන අතරතුර ප්‍රගතිය අගයා, එක්සත් බවේ හිඟය, ශක්තිය හා දර්ශනය හීන වීම හා සතුරාගෙන් එන්නාවූ පහර ආදී ගැටළු පිළිබඳව කටයුතු කළේය. ආත්මික නායකත්වයේ සැබෑ පරීක්ෂණය නම්, ඉන් අරමුණු සාක්ෂාත් වන්නේද නැද්ද යන්න බැලීමය. නෙහෙමියා පිළිබඳව වාර්තා වන්නේ "පවුර සාදා අවසන් විය" කියා වේ. (නෙහෙමියා 6:15)

03. හෙසකියා රජු පිළිබඳ අධ්‍යයනයකින් අරමුණු මගින් කළමනාකරණය කළ අයුරු පැහැදිලි වේ. එහි පරිසර විශ්ලේෂණය, සැලසුම් කිරීම, සැලසුම ක්‍රියාත්මක කිරීම, හා ඇගයීම අන්තර්ගතය. පළමුව හෙසකියා රජු පිළිබඳ කතාව 2 රාජාවලිය 16-20 හා 2 ලේකම් 28-32 හි කියවන්න.

**පරිසරය:**

හෙසකියා පැවතෙන්නේත් නපුරු රජෙකු වූ ආහාස්ගෙනි. යුදා හා ඉශ්‍රායෙල් රාජ්‍යයන් බෙදී එකිනෙකට විරුද්ධව සිටියහ. ගෝත්‍ර දොළහ අතුරින් කුඩාම ගෝත්‍රය යුදා වුවද එය අනකුත් දොළහටම ආත්මික නායකත්වය දුනි. අනෙකුත් ගෝත්‍ර එකොළහ ඔවුන් වටා සිටි ජාතීන්ගේ මිථ්‍යා දෘෂ්ටි ආගම් පිළිගත්තෝය. යුදාහි රජ වූයේ හෙසකියා වේ. යුදාහි ප්‍රධාන සතුරා වූ අසිරියාව, එකල ලෝකයේ බලවත්ම රාජ්‍යය වූ අතර ඔවුහු යක්ෂයින් නමස්කාර කළ මිථ්‍යා දෘෂ්ටියෝ වූහ.

**හෙසකියාගේ ශක්තීන්:**

01. දෙවියන්වහන්සේ හා මනුෂ්‍යයන් ඉදිරියේ නිර්භයව අවංකව සිටියේය.

02. අධිකාරිත්වය යටතේ අධිකාරිත්වය ඇතිව සිටි මනුෂ්‍යයෙකි.

03. දයානුකම්පාවෙන් පිරි අයෙකි.

04. විශ්වාස කළ අතර යාච්ඤා කිරීමට දැන සිටියේය.

05. ඔහු ප්‍රකාශ කළ දේ ඉටු කළේය.

06. පෞද්ගලික ශුද්ධවන්තකම පිළිබඳව මහත් අගයක් තිබිණි.

**හෙසකියාගේ දුර්වලතා:**

01. සතුරා ඔහු වටකරගෙන සිටි අතර සතුරාගේ සංඛ්‍යාව වැඩිවිය.

02. අහංකාර කෙනෙකි.

03. දේශපාලන වශයෙන් උන්නතිකාමයෙක් විය.

**හෙසකියාගේ පරමාර්ථය:** ඉශ්‍රායලය, එක් සැබෑ දෙවි කෙනකු යටතේ එක ජාතියක් ලෙස එක්සත් කිරීම.

**ඔහුගේ අරමුණු:**

01. දේවමාළිගාව ප්‍රතිසංස්කරණය කිරීම.
02. දිව්‍යමය පාලනයක් නැවත පිහිටුවීම.
03. ස්වාමින්වහන්සේගේ ගෘහයේ සේවය නැවත පිහිටුවීම.
04. පාස්කු මංගල්‍යය නැවත පැවැත්වීම.
05. යෙරුසලම් නගරයට ජල පද්ධතියක් ගොඩ නැගීම.
06. සාතන්ගේ බලගතු ප්‍රදේශ ජයගෙන දෙවියන්වහන්සේ විසින් ඉශ්රායෙල් ජාතියට දෙන ලද භූමිය නැවත ලබා ගැනීම.

**ඔහුගේ සැලැස්ම:**

අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඔහු ක්‍රියාත්මක කළ සැලැස්ම මෙසේය:

01. දේවමාළිගාව ප්‍රතිසංස්කරණය කිරීමටත් පිරිසිදු කිරීමටත් ඔහු පූජකවරුන් හා ලෙවීවරුන් සංවිධානය කළේය.
02. දාවිත් රජතුමා කලින් කළ දේ අනුගමනය කරමින් ඔහු පාලකයින්ට දිව්‍යමය ආදර්ශකයක් විය.
03. දේවමාළිගාව නැවත ගොඩනගමින් සිටි සේවකයන් හා ලෙවීවරුන් ඔහු දිරිමත් කළේය.
04. ඔහු වසර 260 ට පසු පළමු වරට පාස්කු මංගල්‍යයට කැඳවීය.
05. ඔහු ඉශ්රායලය පුරා සිටි විශ්වාසවන්තයින්ට පාස්කු මංගල්‍යයට සහභාගි වන ලෙස කැඳවීය.
06. සියලුම ද්‍රව්‍ය ඔහුගේම මේසෙන් සපයන ලදි.
07. ඔහු දෙවියන්වහන්සේගේ සෙනඟ සඳහා සමාව අයැදිය.
08. ඔහු ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් හා දේවවචනය දේශනා කිරීමෙන් යුද හමුදාවට අවවාද අනුශාසනා කළේය.
09. ඔහු යෙරුසලමේ ජල පද්ධතිය සැකසීමට අවශ්‍ය මුදල් රාජ්‍ය ගබඩාවේ ධනයෙන් ලබා දෙන ලදි.

**ඇගයීම:**

හෙසකියා ඔහුගේ අරමුණු සාක්ෂාත් කරගත්තේය. ස්වාමින්වහන්සේ ඉදිරියේ නිහතමානී වීමටත් ඔහුගේ අහංකාරය හා දේශපාලන උන්නතිකාමය ගැන පසුතැවිලි වීමටත් තරම් ඔහු ප්‍රඥාවන්ත විය. දෙවියන්වහන්සේගේ සතුරන් සමඟ පැවති රහස් සම්බන්ධය ගැන ඔහු පසුතැවිලි විය. එහෙත් ඔහුගේ පාපතර ක්‍රියා නිසා අනාගත පරම්පරාවන් මත ශාපයක් ඇති විය (2 රාජාවලිය 20:16-18). කෙසේ වුවද ඉශ්රායලයේ ශ්‍රේෂ්ඨතම රජවරු තිදෙනා අතුරින් එක්කෙනෙකු වීමේ කීර්තිය ඔහුට අයත්විය.

# ඇමුණුම්

## හැඳින්වීම

"*අරමුණු මගින් කළමනාකරණය*" සේවය සඳහා භාවිත කිරීමට ඔබට මෙම ඇමුණුමේ ඇති අතිරේක ද්‍රව්‍ය උපකාරී වනු ඇත.

ඔබ මෙම පාඨමාලාවෙන් උගත් පරිදි, සංවිධානය පිළිබඳ ශ්‍රේෂ්ඨතම නිදසුන මනුෂ්‍ය ශරීරය වේ. දෙවියන්වහන්සේ එය, උන්වහන්සේගේ භූමික ශරීරය - සභාව, යේසුස්වහන්සේ එහි ප්‍රධානියා ලෙස - විස්තර කිරීමට භාවිත කළ සේක. ස්වාභාවික ශරීරයේ සෛල වර්ධනයට ආධාර දීමට ඇට සැකිල්ලක් තිබිය යුතුය. ආත්මික ලෝකයේද මෙය සැබෑවකි. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වර්ධනය වන විට ඊට ආධාර වීම සඳහා ව්‍යුහයක් ගොඩ නැගීම වැදගත් වේ.

මෙලොව දේවරාජ්‍යය පැතිරවීම සඳහා දෙවියන්වහන්සේ භාවිත කරන උපකරණය සභාව බැවින්, මෙම ඇමුණුමේ ඇති ද්‍රව්‍ය වැඩි අවධානයක් යොමු කරන්නේ සභාවේ සංවිධානය මත වේ. වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ආත්මික සම්පත් සංවිධානය කිරීමට උපකාරී වන මූලික ව්‍යුහයක් මෙය ඉදිරිපත් කරයි.

මෙම ඇමුණුමේ ඇති සියල්ල භාවිත කිරීම අවශ්‍ය නැත. ඔබගේ සභාවේ ප්‍රමාණය හා එය පිහිටි ස්ථානය අනුව මෙහි ඇති ද්‍රව්‍ය ඔබට යොදා ගත හැකිය. කුඩා සභාවන්ට විශාල සභාවකට තරම් සංවිධානයක් අවශ්‍ය නැත. එමෙන්ම ඈත ගමක පිහිටි සභාවකට විශාල නගරයක පිහිටි සභාවකට තරම් සංවිධානයක් අවශ්‍ය නැත.

මෙම පාඨමාලාවෙන් ඔබ උගත් දේ මතක තබා ගන්න. අවශ්‍යතාව අනුව සංවිධානයක් බිහි වීමට ඉඩ හරින්න. එයට සේවය සීමා කිරීමට හෝ පාලනය කිරීමට හෝ ඉඩ නොදෙන්න. එමෙන්ම එය අනෙක් ඒවායේ ව්‍යුහය අනුව සකස් නොකරන්න. යහපත් සංවිධානයක් මගින් අවශ්‍යයෙන්ම ඔබ සාර්ථක නොකරනු ඇත. එය සිදුවන්නේ දෙවියන්වහන්සේගේ ආශිර්වාදයෙන් හා ආලේපයෙනි. එහෙත් දේවරාජ්‍යයට උපකාරීවන, දෙවියන්වහන්සේ දෙන සම්පත් භාවිත කිරීමට සංවිධානයක් සහාය වනු ඇත.

ඔබ ප්‍රදේශයේ සභාව සඳහා ඔබට සහාය වන හාවෙස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් පිරිනැමෙන පහත දැක්වෙන පාඨමාලා ඔබට අවශ්‍ය විය හැකිය.

- දෘශ්‍යකරණ මොඩියුලය : මෙම මොඩියුලයේ "*ආත්මික අස්වැන්න නෙළා ගැනීම සඳහා උපක්‍රමික*" යන පාඨමාලාව අන්තර්ගත වේ. එය, ඔබ සහ සමූහයේ ආත්මික දැක්ම වර්ධනය කිරීමට ඔබට උපකාරී වනු ඇත.

- නියෝජනය කිරීමේ මොඩියුලය : අලුතින් හැරුනු අය පුහුණු කිරීමට ඔබට උපකාරී වන පාඨමාලා හතක් මෙම මොඩියුලයෙහි අන්තර්ගත වේ. ඒ පාඨමාලා අතර, *"ඇදහිල්ලේ අත්තිවාරම", "දේවරාජ්‍යයේ ජීවත්වීම", "ආත්මික උපක්‍රමික: ආත්මික යුද සංග්‍රාමය සඳහා අත්පොත" "ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙවර", "දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම" "නිර්මාණාත්මක බයිබල් අධ්‍යයන ක්‍රම"* හා *"මූලික බයිබල් සමීක්ෂණය"* වෙයි.

- වර්ධක මොඩියුලය : මෙම මොඩියුලයේ ඇති පාඨමාලා තුනෙන් ඔබට බයිබලිය ලෝක දැක්මක් ගොඩ නැගීමෙන්, ඉගැන්වීමෙන්, දේශනා කිරීමෙන් හා ශුද්ධ ලියවිල්ලේ බලයේ මූලධර්ම භාවිත කිරීමෙන් වර්ධනය කිරීමට උපකාරී වනු ඇත. එමෙන්ම සභා වර්ධන මූලධර්මද නව සභා පිහිටුවීමට පැතිරෙන ආකාරයද ඔබ ඉගෙන ගන්නවා ඇත. මෙම මොඩියුලයේ ඇති පාඨමාලා හතර නම්, *"බයිබලිය ලෝක දැක්ම" "ඉගැන්වීමේ උපක්‍රම" "වර්ධනය කෙරෙන ක්‍රමවේද"* හා *"බල මූලධර්ම"* වේ.

- සංවිධාන මොඩියුලය : *"අරමුණු මගින් කළමනාකරණය"* යන මෙම පාඨමාලාවද කොටසක් වන මෙම මොඩියුලය ඔබ වර්ධනය කළාවූ ආත්මික බලය සංවිධානය කිරීමට ඔබට උපකාරී වනු ඇත. එමෙන්ම මෙම මොඩියුලය ඔබට මහපෙන්වීමට, නායකයන් තෝරා පුහුණු කිරීමට, පරිසරය විශ්ලේෂණය කිරීමට, සැලසුම් කිරීමට, සැලසුම් ක්‍රියාත්මක

කිරීමට හා සේවයේ කාර්යයන් ඇගයීමට උගන්වනු ඇත. මෙම මොඩියුලයේ තවත් පාඨමාලාවන් දෙකක් නම්, *“බයිබල් කළමනාකරණ මූලධර්ම”* හා *“පරිසර විශ්ලේෂණය”* වේ.

- සූදානම් කිරීමේ මොඩියුලය : මෙම මොඩියුලයේ *“සූදානම් කිරීමේ ක්‍රමවේද”* නමැති පාඨමාලාව අන්තර්ගත වේ. එය සේවය සඳහා සම්පූර්ණ සාමාජිකයන් සංඛ්‍යාවම සූදානම් කිරීමට ඔබට උපකාරී වනු ඇත.

- එවැන්ජලිස්ත කිරීමේ මොඩියුලය : මෙහි ඇත්තේ එක පාඨමාලාවකි. එය *“මුහුන් වැනි එවැන්ජලිස්තකරණය”* නමින් හැඳින්වේ. කිතුදහම පැතිරවීම සඳහා ඵලදායී මාර්ග එහි සඳහන්ව ඇත. එමෙන්ම, එය එවැන්ජලිස්තකරණයේදී සුව කිරීම හා ගැළවීම යන භූමිකාවන් ගැන අවධාරණය යොමු කරන අතර සහා පිහිටුවීම එවැන්ජලිස්තකරණයේ ස්වාභාවික ප්‍රතිඵලයක් බව පෙන්වා ඇත.

# ඇමුණුම එක

## දේවධාර්මික ප්‍රකාශය

දේවධාර්මික ප්‍රකාශයක්, පරමාර්ථ ප්‍රකාශයක් නොවන බව ඔබ මෙම පාඨමාලාවේදී අධ්‍යයනය කෙළෙහිය. පරමාර්ථ ප්‍රකාශයකින් දැක්වෙන්නේ යම් සුවිශේෂී සේවයක් පැවතීමට හේතුවය. එහෙත් දේවධාර්මික ප්‍රකාශයක් යනු සභාව විශ්වාස කරන දෙය පැහැදිලි කෙරෙන ඇදහිල්ලේ ප්‍රකාශයකි. එය ඔබගේ දේවධාර්මික තත්වය අන් අයට පැහැදිලි කරන අතර ඔබගේ ඉගැන්වීමේ, දේශනා කිරීමේ හා සේවයේ අන්තර්ගතය ඇගයීම සඳහා ඇදහිල්ලේ ප්‍රමිතිය සපයයි. ඔබට අනුගමනය කළ හැකි නිදර්ශනයක් පහත දැක්වේ.

### හාවස්ටයිම් අන්තර්ජාතික ජාලය

#### දේවධාර්මික ප්‍රකාශය

හාවස්ටයිම් අන්තර්ජාතික ජාලයේ පරමාර්ථය හා අරමුණ දේවවචනයෙන් එළිදරව් වන අස්වැන්න කපා ගැනීමේ ආත්මික මූලධර්ම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම සංවිධානයේ දේවධාර්මික තත්වයද මෙම ශ්‍රේෂ්ඨ දැක්ම වටා කේන්ද්‍රගත වේ.

**දේවවචනය**

බීජය

*බීජ නම්, දෙවියන්වහන්සේගේ වචනයය. (ලූක් 8:11)*

පැරණි හා නව ගිවිසුමේ ශුද්ධ ලියවිලි, දෙවියන්වහන්සේගේ සැබෑ වචනය සහ කිතුනු ඇදහිල්ලේ අත්තිවාරමද අවබෝධයද ජීවිතය හා සේවයද වේ. ශුද්ධ ලියවිල්ලේ වැරදි නොමැති අතර සම්ප්‍රදායානුකූලව හෝ එළිදරව්වීමක් නිසා හෝ ඊට එක්කිරීම් හෝ ඉන් ඉවත් කිරීම් හෝ කිසියම් ආකාරයක වෙනස් කිරීම් හෝ නොකළ යුතුය.

> *ස්වාමිනි, සදාකාලේටම ඔබගේ වචනය ස්වර්ගයෙහි පිහිටා තිබේ. (ගීතාවලිය 119:89)*

**ත්‍රිත්වයේ දෙවියන්වහන්සේ**

ගොයමේ ස්වාමියා

*ගොයමේ ස්වාමියාට යාච්ඤා කරපල්ලා... (මතෙව් 9:38)*

දේවත්වය පිය වූ දෙවියන්වහන්සේගෙන්ද යේසුස් ක්‍රිස්තුස් නම් පුත්‍ර වූ දෙවියන්වහන්සේගෙන්ද සහ ශුද්ධාත්මයාණන් වූ දෙවියන්වහන්සේගෙන්ද සමන්විත වේ.

> *සාක්ෂි දරන තුන්දෙනෙක් සිටිති. ආත්මයාණන්වහන්සේ ය, වතුර ය, ලේ ය. මේ තුන්දෙනාම එකඟ වෙති. (1 යොහාන් 5:8)*

**පිය වූ දෙවියන්වහන්සේ :**

ඇත්තේ අසීමිත, සදාතන හා පරිපූර්ණ ස්වර්ගයත් පෘථිවියත් මැවුවාවූ එකම දෙවි කෙනෙක් පමණි.

> *මක්නිසාද ස්වර්ගයත් මැවුවාවූ පොළොව මවා සාදා එය පිහිටෙවුවාවූ එය හිස්කමට නොමවා වාසය පිණිස එය සෑදුවාවූ දෙවියන්වහන්සේ වන ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක. මම ස්වාමින්වහන්සේය. වෙන කෙනෙක් නැත. (යෙසායා 45:18)*

**පුත්‍ර වූ දෙවියන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ :**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අධිස්වාභාවික ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිළිසිඳ කන්‍යාවූ මරියා තුමියගෙන් උපත ලැබූ සේක. උන්වහන්සේ, උන්වහන්සේගේ මරණයෙන් හා රුධිරය වැගිරවීම තුළින් සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය උදෙසා පරිපූර්ණ පූජාව වූ සේක.

උන්වහන්සේ, උන්වහන්සේගේම මහිමාන්විත වූ ශරීරය ඇතිව මරණයෙන් උත්ථාන වී, බොහෝ දෙනෙකුට දර්ශනය වී, ස්වර්ගයට නැඟුනු අතර සියලු බලයෙන් හා මහිමයෙන් යුතුව නැවත එන සේක. උන්වහන්සේ දැන්, උන්වහන්සේගේ ශරීරය වූ සභාවේ ප්‍රධානියා වන අතර සියලු අඳුරු බලවේග ජයග්‍රහණය කොට ඇත. තවද උන්වහන්සේ, දෙවියන්වහන්සේගේ දකුණු පස ඇදහිලිවතුන් වෙනුවෙන් මැදහත්කාරකම් කරමින් වැඩ වසන සේක.

*එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස් කොට, සියලු නාම වලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමින්වහන්සේ බව පියවූ දෙවියන්වහන්ස්ගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තු ගන්නා පිණිසත්ය. (පිලිප්පි 2:9-11)*

ශුද්ධාත්මයාණන්වහන්සේ වූ, දෙවියන්වහන්සේ :

ශුද්ධාත්මයාණන්වහන්සේ දේවවචනයට ආභාෂය ලබා දී, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ සේවය සඳහා ආලේප කර, සභාව පෙන්තකොස්ත බලයෙන් පූර්ණ කළ අතර උත්ථාන වීමේ මහිමයේදී ඇදහිලිවතුන්ගේ මානුෂික ශරීර සම්පූර්ණයෙන් වෙනස් කරන සේක.

ශුද්ධාත්මයාණන්වහන්සේ පාපී ලෝකය වරදට පමුණුවන අතර මිනිසා ඇදහිල්ල තුල යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා සමඟ එක්සත් කර අලුත් උත්පත්තියක් ගෙනැවිත් ඇදහිලිවතුන් තුළ වාසය කරන සේක.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහන සියලු දෙනාට ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය ලබාගත හැකිය. එය, උත්ථාන වූ අපගේ ස්වාමින්වහන්සේගේ බලගතු සාක්ෂිකරුවන් වීමේ හැකියාවෙන්ද ක්‍රියා 2:4 හි ඇති සහතික වීමේ ලකුණු වලින්ද පෙන්නුම් කෙරේ.

*ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල, නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)*

ආත්මයාණන්වහන්සේගේ දීමනාව, ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය තුලින් ඇදහිලිවන්තයාට ලබාගත හැකිය. උන්වහන්සේගේ කැමැත්ත පරිදි උන්වහන්සේ එය සෑම මිනිසෙකුටම ප්‍රදානය කරනු ඇත:

*ඒ එකම වූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදා දෙමින් මේ සියල්ල කරවන සේක. (1 කොරින්ති 12:11)*

ඇදහිලිවතුන්ට ශුද්ධවන්තකමේ වර්ධනය වීමට ඉඩ දෙමින්, ශුද්ධාත්මයාණන්වහන්සේ ආත්මයේ ඵල ලබා ගැනීමට ඉඩ දෙන සේක.

*ආත්මයාණන්වහන්සේගේ ඵල නම්- ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම යන මේවාය. (ගලාති 5:22-23)*

**මනුෂ්‍යයා**

වපුරන්නා

*අසාපල්ලා - වපුරන්නා වපුරන්ට ගියේය. (මාක් 4:3)*

දෙවියන්වහන්සේ මිනිසා මවන ලද්දේ උන්වහන්සේගේ ස්වරූපයෙන් හා සමානත්වයෙනි. ආදම් හා ඒවගේ මුල් පාපයෙන් සියලුම මනුෂ්‍යයන් ස්වභාවයෙන්ම පාපී වූහ. මිනිසාට තමාගේම ශක්තියෙන් දෙවියන්වහන්සේ වෙතට ඒමට කෙසේවත් නොහැකිය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගැළවීම නොමැතිව මිනිසාට වෙනත් කිසිදු බලාපොරොත්තුවක් නැත:

*පළමුවෙනි මනුෂ්‍යයා වූ ආදම් ජීවමාන ප්‍රාණයක් වුනේ යයි ලියා තිබේ. අන්තිම ආදම් ජීවනදායක ආත්මයක් විය. එසේ වී නුමුත් ප්‍රථම වන්නේ ආත්මික එක නොව ස්වාභාවික එකය. පසුව ආත්මික එක විය. පළමුවෙනි මනුෂ්‍යයා භූමියෙන්ය, භූමිකය. දෙවෙනි මනුෂ්‍යයා ස්වර්ගයෙන්ය. (1 කොරින්ති 15:45-47)*

## ගැළවීම

### අස්වැන්න

*සරු බිමෙහි වපුරන ලද්දේ නම්, වචනය අසා තේරුම් ගෙන ඵලද දරන තැනැත්තාය.*
*(මතෙව් 13:23)*

ගැළවීම යනු, අනුග්‍රහය හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ල නිසා දෙවියන්වහන්සේගෙන් ලැබෙන ත්‍යාගයකි. මනුෂය වර්ගයා ගැළවීම ලබන එකම නාමය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මිස අන්කිසි නමක් නොවේ.

පාපය වෙතින් හැරී, පශ්චාත්තාප වීමේ ඵල නෙළාගෙන, ක්‍රිස්තුස්වහන්සේද සියල්ලන්ගේ පාපය උදෙසා උන්වහන්සේගේ මරණය කෙරෙහිද විශ්වාසය තැබීමෙන් මිනිසා ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් සදාතන ජීවිතයට නැවත ඉපදේ.

මෙම ගැළවීමේ ක්‍රියාව මගින් පාපයට කමාවද ලෝකයේ බන්ධන වලින් මිදීමද දෙවියන්වහන්සේගේ ආත්මය තුළින් නිදහසද ලැබේ.

> *ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් (දෙවියන්වහන්සේගේ අසීමිත කරුණාව) නුඹලා ගැළවී සිටින්නහුය. එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටු කර නොගන්න පිණිස ඒක ක්‍රියා වලින් නොවේ. (ව්‍යවස්ථාවෙන් කෙරෙන ඉල්ලීම් ඉටු කිරීමක් නොවේ) (එපිස 2:8-9)*

## සභාව

### ගොවියෝ

*ගොයම් කැපීමට ගොවියන් එවන ලෙස ගොයමේ ස්වාමියාට යාච්ඤාකරපල්ලා. (මතෙව් 9:38)*

සභාව ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය හා මනාලිය වේ. සභාවේ මූලික මෙහෙය වන්නේ සියලු ජාතීන්ට ඉගැන්වීම හා ගෝලයන් බිහි කිරීමද සහතික කිරීමේ ලකුණු ඇතිව දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය සියලු මිනිසුන්ට හා ජාතීන්ට ගෙන යෑමද වේ:

> *උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. අදහන්නාවූ, බව්තිස්මය ලබන්නාවූ තැනැත්තේ ගළවනු ලබන්නේය (සදාතන මරණ ඥඩුවමෙන්). නමුත් අදහා නොගන්නා තැනැත්තේ වරදට පත්කරනු ලබන්නේය. අදහන්නන්ට ඇත්තාවූ ලකුණ නම්: ඔවුහු මාගේ නාමයෙන් යක්ෂයන් දුරු කරන්නෝය: අන් භාෂාවලින් කථාකරන්නෝය: සර්පයන් අල්ලා ගන්නෝය: යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය.: ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔවුහු සුවය ලබන්නෝයයි කී සේක. (මාක් 16:15-18)*

**සමාප්තිය**

**අවසාන අස්වැන්න**

*ඔබවහන්සේගේ දෑකැත්ත යොමා කැපුව මැනව. මක්නිසාද පොළොවේ ගොයම් පැසී තිබේ...*
*(එළිදරව් 14:15)*

සියල්ලේ සමාප්තිය (අවසානය) ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමාන්විත පැමිණීම, මළවුන්ගේ උත්ථානය සහ ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්ව සිටින්නවුන්ගේ සාධාරණ, අසාධාරණ බවේ විනිශ්චය ඇතුළත් වේ. සාතන් ඔහුගේ සියලු සේනාවද සමඟ ක්‍රිස්තුස්වහන්සේට අයත් නොවන සියලු දෙනාද දෙවියන්වහන්සේගේ අභිමුඛයෙන් ඉවත් කර සදාතන දඬුවම් විඳීමට පත් කෙරෙන අතර ගැළවීම ලද්දෝ සදාතනය උදෙසා දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සිටින්නෝය.

*තවද සහෝදරයිනි, බලාපොරොත්තුවක් නැත්තාවූ අන් තැනැත්තන් මෙන් නුඹලා සෝක නොවන පිණිස සැතපෙන්නන් ගැන නුඹලා නොදැන සිටිනවාට අපි නොකැමැත්තෙමුව. මක්නිසාද යේසුස්වහන්සේ මැරී නැවත නැගිටුණුසේකැයි අපි අදහමු නම්, එසේම දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ කරණකොටගෙන සැතපී, සිටින්නන් උන්වහන්සේ සමඟ ගෙනෙන සේක. මක්නිසාද ස්වාමින්වහන්සේගේ ඒම දක්වා ජීවත්ව ඉතුරුවන අපි සැතපුණු තැනැත්තන්ට කිසිසේත් ඉස්සර නොවන්නෙමු යයි ස්වාමින්වහන්සේගේ වචනයෙන් අපි නුඹලාට කියමුව. මක්නිසාද ස්වාමින්වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නා සේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ අය පළමුකොට නැගිටින්නෝය. එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමඟ ස්වාමින්වහන්සේ සම්මුඛ වන පිණිස වළාකුල්වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. (1 තෙසලෝනික 4:13-17)*

*මළාවූ ලොකු අයද කුඩා අයද සිංහාසනය ඉදිරියෙහි සිටිනවා දුටිමි: පොත්ද දිගහරිනු ලැබුවේය. ජීවන පොත වන තවත් පොතක් දිග හරිනු ලැබීය. මළාහු තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියන ලද දේවලින් විනිශ්චය කරනු ලැබුවෝය. (එළිදරව් 20:12)*

# ඇමුණුම දෙක

## පරමාර්ථ ප්‍රකාශය

මෙම පාඨමාලාවෙහිදී පරමාර්ථ ප්‍රකාශයක් ලියන ආකාරය ඔබ උගත්තෙහිය. නිදසුනක් ලෙස හාවෙස්ටයිම් අන්තර්ජාලයේ පරමාර්ථ ප්‍රකාශය තෙවන පරිච්ඡේදයේ ඉදිරිපත් කෙරිනි. නැවත සිතා බැලීම සඳහා තවත් නිදසුන් කීපයක් පහත දැක්වේ. විවිධ සභාවන් මගින් ලියන ලද මෙම ප්‍රකාශයන්, දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ ඔවුන්ගේ සුවිශේෂී පරමාර්ථය පැහැදිලි කරයි.

**සැන් ප්‍රැන්සිස්කෝ කිතුනු මධ්‍යස්ථානය : පරමාර්ථ ප්‍රකාශය**

සැන් ප්‍රැන්සිස්කෝ කිතුනු මධ්‍යස්ථානයේ පරමාර්ථය වන්නේ දෙවියන්වහන්සේ මහිමයට පත්කිරීම හා....

01. ප්‍රසිද්ධ ප්‍රකාශයක් මගින් දිව්‍යමය සත්‍යතාව සන්නිවේදනය කිරීමට.

02. ශුද්ධ ලියවිල්ල අවබෝධ කරගත හැකි ක්‍රිස්තුස්වහන්සේගේ චරිත ලක්ෂණ හා ජීවිතය මගින් තම ආත්මික පරිණතභාවය පෙන්වන හා කිතු දහම පැතිරවීමට කැපවූ ඇදහිලිවතුන් සමූහයක් ගෝලයන් කිරීමට.

03. ගවේෂණයට, සංවර්ධනයට හා තම දීමනාවන් දේවරාජ්‍යයේ සේවය උදෙසා භාවිත කරන පුරුෂයන් හා ස්ත්‍රීන් පෙළඹවීමට හා දිරිගැන්වීමට.

04. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ දැනගැනීම මගින් ගැළවීම නොලැබූ අය හට කිතුදහම ප්‍රදානය කිරීමට (ප්‍රදේශයේ හා විදේශ රටවල).

05. භෞතික, සමාජීය හා මානසික අවශ්‍යතා සැපයීම මගින් මනුෂ්‍ය වර්ගයාට සේවය කිරීමට වේ.

**ප්‍රදේශීය කිතුනු සහභාගිත්වය : පරමාර්ථ ප්‍රකාශය**

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ (සභාවේ) ප්‍රකාශනයක් වීම ප්‍රාදේශීය කිතුනු සහභාගිත්වයේ පරමාර්ථය වේ. සියලු දේවලදී ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට යටත්වීම, නව ගිවිසුමේ සභා ක්‍රියාපිළිවෙළ අනුව හැඩගැසීම හා ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය තුළින් කැපවීම අපට අවශ්‍ය වන්නේ පහත දැක්වෙන දේ සම්පූර්ණ කිරීම සඳහා වේ.

01. ගැළවීම නොලැබූ අය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ගැළවීම ලබන ඇදහිල්ලකට ගෙන ඒමට.

02. සියලු ආකාර සමාජීය හා පෞද්ගලික පාප, රෝග හා ආබාධවලට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුව කිරීමේ ශුභාරංචිය යෙදීම.

03. උත්ථාන වූ ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය හා ගති ලක්ෂණ නැවත ඇති කිරීම.

04. සාමාජිකයන් ගෝලයන් කිරීම හා එමගින් පරිපූර්ණ කිරීම හා පරිණත භාවයට ගෙන ඒම.

05. වර්ධනය විය හැකි හා අන්‍යයන්ගේ අවශ්‍යතාවන් සපුරාලිය හැකි ආත්මික නායකයින් බිහි කිරීම.

06. ප්‍රසිද්ධ හා පෞද්ගලික නමස්කාරය මගින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිදහස තුළ දෙවියන්වහන්සේ මහිමයට පත්කිරීම හා උන්වහන්සේට ප්‍රේම කිරීම.

07. දෙවියන්වහන්සේ හා මිනිසා අතරත් මිනිසා හා මිනිසා අතරත් ප්‍රේමය අත්දැකීම හා ප්‍රකාශ කිරීම.

08. ශරීරය තුළ එක්සත් බව හා සුසංගත බව දියුණු කිරීම.

09. සේවය කිරීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් කැඳවා ඇති අය සොයා ගැනීම, පෝෂණය කිරීම හා බලය පැවරීම.

**පළමු සිව්වතුරශ්‍ර සභාව : පරමාර්ථ ප්‍රකාශය**

පළමු සිව්වතුරශ්‍ර සභාවේ පරමාර්ථ ප්‍රකාශය වන්නේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙයේ නිදර්ශනයක් වීමෙන් දේවරාජ්‍යයේ මහිමය පොළොවේ මුදා හැරීම සඳහා ඇදහිල්ල සහිත සෙනඟක් බිහි කිරීම වේ.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය කෙරෙහි අපි රඳා පවතිමු. එමෙන්ම පහත දැක්වෙන දේට අවධානය යොමු කෙරෙන ක්‍රිස්තු-කේන්ද්‍රිය සේවයක් තුළින් සියලු සම්පත් භාවිත කරමු.

නමස්කාරය

01. ජීවමාන දෙවියන්වහන්සේට නමස්කාර කිරීමට, උන්වහන්සේගේ පුත්‍ර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මහිමයට පත්කිරීමට හා ශුද්ධාත්මයාණන්වහන්සේට ගරු කිරීමට සෙනඟක් ඇති කිරීම.

වචනය

02. දේවවචනය ඵලදායිව ඉගැන්වීමට හා දේශනා කිරීමත් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය අත්දැකිය හැකි වාතාවරණයක් ඇති කිරීම.

සේවය සඳහා පුහුණු කිරීම

03. ක්‍රිස්තුස්වහන්සේ තුළ තමන්ගේ පෞද්ගලික හා සාමූහික කැඳවීම හඳුනාගත හැකි සෙනඟක් පුහුණු කිරීම හා ඔවුන්ගේ සේවය කුමක්ද කියා සොයා ගැනීමටත් එය වර්ධනය කිරීමටත් ඒ සඳහා කැප වීමටත් උපකාරී වීම.

නිරාහාරව සිටීම හා යාච්ඤා කිරීම

04. දේවවචනයට අනුකූල වන විනයක්, පෞද්ගලික හා සාමූහික ජීවිතයේ යාච්ඤාවේදී හා නිරාහාරව සිටීමේදී පවත්වාගෙන යෑම. මිනිසාගේ පෞද්ගලික, ප්‍රාදේශිය, ජාතික හෝ අන්තර්ජාතික ඕනෑම කටයුත්තක් කෙරෙහි ආධිපත්‍ය පතුරුවන සියලු නිරයේ බලවේග වලින් නිදහස් කිරීමට මැදිහත්වීම.

ශුභාරංචිය පැතිරවීම හා පිටස්තර තැන්වලට ශුභාරංචිය ගෙනයෑම

05. මනුෂ්‍ය වර්ගයාට ප්‍රේම කිරීමට හා ශ්‍රේෂ්ඨ ආඥාවට කැපවීමට ඇදහිලිවතුන් පෙළඹවීම: දේවවචනයත් තම පෞද්ගලික සාක්ෂිත් ඵලදායිව බෙදා ගැනීමට සෑම වයස් කාණ්ඩයක්ම සන්නද්ධ කිරීම. සමාජයේ මනුෂ්‍ය අවශ්‍යතා සපුරාලීමට තම කාලය, දීමනා හා පහසුකම් යෙදවීම.

ඇදහිලිවතුන්ගේ එක්සත්කම

06. ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ඇදහිලිවතුන්ගේ ගෝලිය සහභාගිත්වය ඇතුළත ක්‍රියා කිරීම.

මුදල්

07. විශ්වාසවන්ත ගබඩාකරුවන් වීමට ඇදහිලිවතුන් දිරිගැන්වීම හා දෙවියන්වහන්සේ දී ඇති සියලු සම්පත් අපගේ පරමාර්ථය උදෙසා භාවිත කිරීම.

# ඇමුණුම තුන

## පොදු සංවිධානය

පොදු සභා සංවිධානය පිළිබඳ තොරතුරු මෙම කොටසේ ඇතුලත් වේ.

**නීතිමය ලියවිලි**

සභාව ව්‍යාපාරයක් නොවේ. එය සේවයකි. එහෙත් රාජ්‍ය ව්‍යවස්ථාවන් නිසා සභාව ව්‍යාපාරයක් මෙන් කටයුතු කළ යුතුය.

ඔබ අලුත් සභාවක් ආරම්භ කරන විට, ඔබගේ ප්‍රදේශයේ රජයට අවශ්‍ය නීතිමය අවශ්‍යතාවන් සොයා බලන්න. මෙය රටකින් රටකට වෙනස් විය හැකි අතර එකම රටේ වුවද පළාත අනුව හෝ නගරය අනුව හෝ ග්‍රාමය අනුව හෝ වෙනස් විය හැකිය. ඇතැම් දේශයන්ට අවශ්‍යතා නැත. ඇතැම් දේශයන්හි තද රෙගුලාසි තිබේ.

1. සභාව රජයේ ලියා පදිංචි කිරීම අවශ්‍යද?
2. සභාවක් ලෙස කටයුතු කිරීමට රජයේ බලපත්‍රයක් හෝ අනුමැතියක් හෝ අවශ්‍යද?
3. සභා රැස්වීම් පැවැත්වීම සීමා කෙරෙන ව්‍යවස්ථාවන් තිබේද?
4. දේපල සඳහා බදු නොගෙවීමට සභාව අයදුම් පතක් භාර දිය යුතුද?
5. රජයට වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කිරීම අවශ්‍යද?
6. සභාව සඳහා ලිඛිත ව්‍යවස්ථාවක් අවශ්‍යද? (එසේ නම්, එහි ඇතුළත් විය යුතු දේ රජය හෝ ඔබගේ නිකාය හෝ පවසනු ඇත)

හැකි සෑම අවස්ථාවකම රජයේ අවශ්‍යතාවන් සපුරා ලන්න. එහෙත් කිතු දහම පැතිරවීම හෝ දේවස්ථාන පිහිටුවීම හෝ රජය තහනම් කරන්නේ නම් ඊට ඔබව නතර කළ නොහැකිය. ඔබට අනුමැතියක් නොමැතිව "සැඟවී" කටයුතු කිරීමට සිදුවනු ඇත. (ක්‍රියා 4:16-20; 5:29 බලන්න)

**සාමාජිකයෙකු වීමේ අවශ්‍යතාවන්**

පුද්ගලයෙක් සැබවින්ම නැවත උත්පාදනය ලැබූ විට, ඔහු සභාවේ එනම් ලොව පුරා ඇති ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ කොටසක් බවට පත් වේ.

එහෙත් ඇතැම් ඇදහිලිවතුන්ගේ කණ්ඩායම්, එම ප්‍රදේශයේ සභාවේ නිල සාමාජික අවශ්‍යතා තබා ගැනීමට කැමැත්ත පල කරති. මෙම තීරණය ඔබ ගත යුතුය. සභාව

1. සියලු නැවත-ඉපදුනු ඇදහිලිවතුන් ද කොටසක් වන සහභාගිකත්වයකි. සාමාජිකයෙකුවීම සඳහා නිල ඉල්ලුම් පතක් නැත.
   නැතහොත් එය
2. නිල සාමාජිකත්වයක් ඇත. ඇදහිලිවතුන් සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අයදුම් කළ යුතුය.

සාමාජිකත්වය අවශ්‍යතා ඇති සභාවන්හි පහත දැක්වෙන අවශ්‍යතාවන් කිහිපයක් හෝ සියල්ලම හෝ තිබිය හැකිය.

- නැවත උත්පාදන අත්දැකීම
- ජලයෙන් බව්තිස්මය
- ශුද්ධාත්මයාණන්ගේ බව්තිස්මය
- ප්‍රාදේශීය දේව සභාවේ දේවධාර්මික ප්‍රකාශය හා පරමාර්ථ ප්‍රකාශය සමඟ එකඟවීම
- පැමිණීමෙන්, දීමනාවලින්, දහයෙන් කොටස දීමෙන් හා පූජාවන් මගින් සභාය දීමට පොරොන්දු වීම.

**අය-වැය ලේඛණය**

ඔබ සකස් කරන සෑම සැලසුමකටම අය-වැය ලේඛණයක් සකස් කරන ආකාරය ඔබ මෙම පාඩමාලාවෙන් උගත්තෙහිය. එක් එක් සැලැස්මක් සඳහා පිළියෙල කරන අය-වැය ලේඛණයට අමතරව සභාවේ කටයුතු සඳහා පොදු අය-වැය ලේඛණයක් අවශ්‍ය වේ.

ඔබ සභාවක් පළමු වරට ආරම්භ කරන අවස්ථාවේ මුදල් අවශ්‍ය කරුනු අතර පහත දැක්වෙන ඒවාද තිබිය හැකිය.

- පාලකතුමාට ආධාර දීමට
- දේවස්ථාන ගොඩනැගිල්ලට කුලී ගෙවීමට
- පහසුකම් (විදුලි බලය, ජලය ආදිය)
- අධ්‍යාපනික ද්‍රව්‍ය (බයිබල්, පුහුණු ද්‍රව්‍ය, පත්‍රිකා)
- උපකරණ (සංගීත භාණ්ඩ, ආසන, දේශනා කුඩුව)

සභාව වර්ධනය වන විට තවත් අවශ්‍යතාවන් ඇති වේ. (මීට පසුව ඇති මූල්‍යමය වාර්තාවේ ඇති දේ බලන්න)

මුදල් වියදම් කරන අයුරු සභා සාමාජිකයන් දැන ගැනීම යහපත්ය. ඊළඟ පිටුවේ ඇත්තේ, ඔබට මාසික වාර්තාවක් සකස් කිරීමට භාවිත කළ හැකි මූල්‍යමය වාර්තාවක් සඳහා නිදර්ශනයකි.

**සභාවේ හෝ සංවිධානයේ නම**

මූල්‍යමය වාර්තාව

මාසය ______________________ අවුරුද්ද ____________________

වාර්තාව සකස් කරන ලද්දේ ________________________________________
(අත්සන)

ආරම්භ මුදල ________________ (මාසය ආරම්භයේදී අත ඉතිරිව තිබූ මුදල සඳහන් කරන්න)

**ආදායම්**

(මුදල් ඉපැයූ සෑම දෙයක්ම ලියන්න)

1. ____________ පූජාවන්
2. ____________ පොත් හා කැසට් විකිණීමෙන්
3. ____________ මුදල් ආධාර ඉපැයූ දේ
4. ____________ වෙනත්

ලැබූ මුළු මුදල ____________ (1-4 එකතුව)

**වියදම්**

(සෑම කරුණක් වෙනුවෙන්ම වියදම් කළ මුදල් වල එකතුව ලියන්න. මුදල් වියදම් වන දේවල ලයිස්තුවක් මෙහි දැක්වේ)

1. ________________ කාර්යාල කටයුතු සඳහා
2. ________________ ශුද්ධ පවිත්‍ර කිරීමට
3. ________________ විෂයමාලා ද්‍රව්‍ය (පත්‍රිකා, බයිබල්, පුහුණු ද්‍රව්‍ය)
4. ________________ ශ්‍රව්‍ය-දෘශ්‍ය (කැසට් පට, චිත්‍රපට, සංගීත භාණ්ඩ ආදිය)
5. ________________ ධර්ම දූත සේවාවන්
6. ________________ පඩි නඩි
7. ________________ කුලී
8. ________________ ආම්පන්න
9. ________________ තැපැල් ගාස්තු
10. ________________ ණය ගෙවීම්
11. ________________ පිටින් පැමිණෙන දේශකයන් සඳහා දීමනා
12. ________________ ප්‍රචාරය කිරීම්
13. ________________ සභා දේපල වෙනුවෙන් රක්ෂණ ගෙවීම්
14. ________________ මුද්‍රණ කටයුතු
15. ________________ වෙනත්

වියදම් කළ මුළු මුදල (1-15 එකතුව)

ඉතිරි මුදල ----------------

ඉතිරි මුදල ලබා ගන්නා අන්දම

1. ආරම්භ ඉතිරිය ලියන්න.
2. ඊට ලද මුළු මුදල් එකතුව එකතු කරන්න.
3. මේ එකතුවෙන් වියදම් කළ මුළු මුදල අඩු කරන්න.
4. ඉතිරි මුදල ඉන් දැක්වේ.

**රැස්වීම් පැවැත්වීම**

ඵලදායි සේවයක් සඳහා සැලසුම් කිරීමට, සංවිධාන කිරීමට, ගැටලු විසඳීමට හා ඇගයීමට විවධාකාර රැස්වීම් පැවැත්විය යුතුය. ඔබ පවත්වන සෑම රැස්වීම් වර්ගයක් පිළිබඳවම සාකච්ඡා කිරීම කෙසේවත් කළ නොමැතිය. එහෙත් ඕනෑම රැස්වීමකට ගැළපෙන පොදු මාර්ගෝපදේශ කිපයක් පහත දැක්වේ.

1. රැස්වීම සඳහා සුවිශේෂි පරමාර්ථයක් තබා ගන්න. රැස්වීමට අවශ්‍ය හේතුව කුමක්ද? ඔබගේ පරමාර්ථය කුමක්ද? ඔබ සාක්ෂාත් කරගත යුත්තේ කුමක්ද? ව්‍යාපාර රැස්වීම් සඳහා පොදු පරමාර්ථ කීපයක් පහත දැක්වේ.

    - සැලසුම් සකස් කරන්න.
    - ගැටලු විසඳන්න.
    - අවශ්‍ය තීරණ ගන්න.
    - සැලසුම් අගයන්න.
    - සිද්ධීන් පිළිබඳව හෝ දැනගත යුතු දේ පිළිබඳව සෙනඟ දැනුවත් කරන්න.
    - විශේෂ දෙයක් සංවිධානය කරන්න.
    - අය-වැය ලේඛණය සාකච්ඡා කරන්න.
    - එදිනෙදා කාර්යයන්හි නියැලෙන්න.
    - සභා විනය ගැන කටයුතු කරන්න.

2. රැස්වීමට න්‍යාය පත්‍රයක් සකස් කරන්න.

    - වැදගත්කමේ අනුපිළිවෙළ අනුව, ඔබ සාකච්ඡා කිරීමට බලාපොරොත්තුවන සිද්ධීන් ලයිස්තුගත කරන්න.
    - සෑම විටම දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම සෙවීමට යාච්ඤා කාලයක් වෙන් කරන්න.

3. රැස්වීම සඳහා අවශ්‍ය වන සියලු දේවල ලයිස්තුවක් පිළියෙල කරන්න. එහි පැන්සල්, කඩදාසි, වාර්තා, නිදර්ශක ආදිය තිබිය හැකිය. රැස්වීමට පෙර සියලුම දේ රැස් කරන්න.

4. රැස්වීම සඳහා දිනයක්, වේලාවක් හා ස්ථානයක් තෝරා ගන්න.

5. රැස්වීමට ආ යුතු අයට දන්වන්න. ඔවුන්ට රැස්වීමේ දිනය, වේලාව, ස්ථානය හා පරමාර්ථය දන්වන්න. සෑම කෙනෙක්ම ගෙන ආ යුතු යමක් ඇත්නම් ඒ ගැන දැනුවත් කරන්න. නිදර්ශන ඉදිරිපත් කිරීමක්, වාර්තාවක්, ප්‍රගති සමාලෝචනයක් ආදිය

6. රැස්වීම නියමිත වේලාවට ආරම්භ කර නියමිත වේලාවට අවසන් කරන්න.

7. රැස්වීමේ මුලසුන ගැනීමට සභාපතිවරයෙකු පත් කරන්න.

8. කතා කිරීමට ක්‍රමයක් සකස් කර ගන්න. කතා කිරීමට අවශ්‍ය අයට අත් එසවිය හැකිය. ඔවුන්ගෙන් කෙනෙකු නායකයා විසින් කැඳවනු ලැබේ. විවෘත සාකච්ඡාවක් තිබේද?

9. තිරණ ගැනීමට ක්‍රමයක් සකස් කර ගන්න. සියලු දෙනම එකඟ වන තුරු ඔබ යාච්ඤා කරන්නෙහිද? සියලු දෙනාටම සවන් දීමෙන් පසු පාලකතුමා හෝ ආත්මික නායකයා හෝ තිරණය ගන්නෙහිද?

10. න්‍යාය පත්‍රය තදින් අනුගමනය කරන්න. වෙනත් සාකච්ඡා මගින් අන් අතකට යොමු නොවන්න.

11. රැස්වීමේදී ගත් තිරණ පිළිබඳව සටහන් තබා ගන්න. විශේෂයෙන්ම කවුරුන් කවරක් කවර දිනෙක කළ යුතුද යන ඒවා වැදගත්ය. රැස්වීමෙන් පසු මේවා පිළිවෙළකට නැවත ලියා පිටපත්, රැස්වීමට සහභාගි වූ සෑම කෙනෙකුටම දෙන්න. එය, ඔවුන් කළ කාර්යයන් ඔවුන්ට සිහි ගන්වනවා ඇත.

**හැඳින්වීමේ පැකට්ටුව**

ඔබට හැකිනම් හා මුදල් තිබේ නම්, අමුත්තන්ට හා සමාජයේ සාමාජිකයින්ට ඔබගේ සභාව හඳුන්වා දීමේ මුද්‍රිත පත්‍රිකා අඩංගු පැකට්ටුවක් දීමට ඔබට අවශ්‍ය විය හැකිය. මෙහි මෙවැනි ප්‍රකාශයක් ඇතුළත් කරන්න.

"මෙම පැකට්ටුව සැලසුම් කර ඇත්තේ (නම) සභාව ඔබට හඳුන්වා දීම සඳහාය. මෙම සභාව තුළ ඔබගේ සහභාගිකත්වය හා සේවය කවරක්ද යන්න අවබෝධ කර ගැනීමට මේ තොරතුරු ඔබට උපකාරී වනු ඇතැයි අපි විශ්වාස කරමු. මෙම සභාවේ ක්‍රියාකාරී කොටස් කරුවෙකු නොවන ඔබට, දේව රාජ්‍යය වෙනුවෙන් අපගේ සහභාගිකත්වයට එක් වන ලෙස අපි ඔබට ඇරයුම් කරමු."

එම පැකට්ටුවට පරමාර්ථ ප්‍රකාශයක හා දේවධාර්මික ප්‍රකාශයක පිටපත බැගින් දමන්න. එවිට ඔබ විශ්වාස කරන දෙය හා ඔබගේ පැවැත්ම ඔවුන් දැනගනු ඇත. එමෙන්ම සභාවේ සභාපාලක පිළිබඳ තොරතුරු හා විවිධ වැඩ සටහන් විස්තර ඊට ඇතුලත් කිරීමට ඔබට අවශ්‍ය විය හැකිය.

මෙහි ඇතුළත් කිරීමට සුදුසු අලංකාර ප්‍රකාශයක් මෙසේය:

සැනසීම අවශ්‍ය ශෝකවන සියල්ලන්ට ද, විවේකය අවශ්‍ය වෙහෙසට පත් වුවනටද; මිත්‍රත්වය අවශ්‍ය (මිතුරන් නොමැති) අයටද, තනිකම දැනෙන සියල්ලන්ට සුමිතුරුකම ද, ගැළවීම අවශ්‍ය සියලු පව්කරුවන්ට ද හා "කැමති සියලු දෙනාට" මෙම සභාව විවෘතය. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් "ඔබ පිළිගනිමු".

**අමුත්තෝ**

ඔබගේ සභාවේ නමස්කාරයට පැමිණෙන සියලූ අමුත්තන් ගැන සොයා බලන්න. ඔබගේ පරමාර්ථය විය යුත්තේ ඔවුන් ස්වාමීන්වහන්සේ වෙතට දිනා ගැනීම හා ඔවුන් ඔබ සභාවේ ක්‍රියාකාරී සාමාජිකයන් කර ගැනීම වේ. ඉදිරියේ දී ඔවුන් හා සමඟ සම්බන්ධතා පැවැත්වීම සඳහා ඔවුන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට කාඩ් පතක් පුරවා ගන්න. එවැනි කාඩ් පතක ආකෘතියක් පහත දැක්වේ.

**ලියාපදිංචි කර ගන්නා කාඩ් පතක ආකෘතිය**

නම: ____________________________________________

ලිපිනය:____________________________________________

දුරකථන අංකය:____________________

ළමයින්ගේ නම් හා වයස

| නම | වයස |
|---|---|
| ____________ | ____________ |
| ____________ | ____________ |
| ____________ | ____________ |
| ____________ | ____________ |

මම ______________________________ දේව මෙහෙයට සහභාගි වන්නෙමි.
නගරය හා සභාවේ නම

මට වෙනත් දේවස්ථානයක් නැත.

මා වෙනුවෙන් යාච්ඤා කරන්න.

මා හමුවිය හැකි දවස හා වේලාව මෙසේය: දවස ____________වේලාව ____________

ඔබගේ සභාවේ කොටස්කරුවෙකු වීමට මම කැමැත්තෙමි.

# ඇමුණුම හතර

## සේවය සඳහා සෙනඟ සංවිධානය කිරීම

සේවා සැලසුම් සාර්ථකව සම්පූර්ණ කිරීමට නම් සෙනඟ සංවිධානය කර ඔවුන්ට වගකීම් පැවරිය යුතු බව ඔබ මෙම පාඩමාලාවෙන් උගත්තෙහිය. සෙනඟ සංවිධානය කිරීමේ එක් ක්‍රමයක් නම් ඔවුන්ට පැවරී ඇති සේවාවන් හෝ කාර්යයන් හෝ විස්තරාත්මකව ලිඛිතව ඔවුන්ට ලබා දීම වේ. සේවා විස්තරයක මේ දේ තිබිය යුතුය.

1. සේවයේ නම

2. නිලයේ පරමාර්ථය. සේවයේ මෙම නිලය පැවතිමට හේතුව ඇතුලත් පරමාර්ථ ප්‍රකාශයක් ලියන්න.

3. සේවයේ වගකීම්. මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   - මාගේ වගකීම් මොනවාද?
   - මට අයත් බලතල කවරක්ද?
   - මඟපෙන්වීම සඳහා මට උපදෙස් ලබා ගත හැක්කේ කවරෙකුගෙන්ද? (මාව අධීක්ෂණය කරන්නේ කවරෙක්ද?)
   - මාගෙන් උපදෙස් ලබා ගන්නේ කවරෙක්ද? (මා අධීක්ෂණය කරන්නේ කවරෙක්ද?)

4. මෙම නිලයේ ඇති සම්බන්ධතාවන්, ඔහු වගකිව යුත්තේ කවරෙකුටද? ඔහුට උපදෙස් දෙන්නේ කවරෙක්ද? ඔහුගේ කාර්යයන් අගයන්නේ කවරෙක්ද?

5. මෙම සේවා නිලය දරන්නාට අවශ්‍ය සුදුසුකම් මොනවාද?

   සභාවට අවශ්‍ය විය හැකි විවිධ නායකත්ව තත්ත්ව කිපයක නිදර්ශක විස්තර මෙහි ඇතුලත් කර ඇත. මෙහි ලයිස්තුගත කර ඇති කාර්යයන් පොදු ඒවා වේ. සෑම සේවා විස්තරයක්ම, ඔබගේ සභාවට සුවිශේෂී වූ අවශ්‍යතාවන්හි විස්තරාත්මක කරුණු ඇතුලත් කර, සම්පූර්ණ කරන්න. ඔබට ආත්මික, අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ද සෑම තත්වයක් සඳහාම පරමාර්ථ ප්‍රකාශයක් ද ඇතුලත් කිරීමට අවශ්‍ය විය හැකිය. නායකයින් ස්වල්ප දෙනෙක් ඇති කුඩා සභාවක මේ බොහෝ නිලයන් ඒකාබද්ධ කළ හැකිය. නිදසුනක් වශයෙන් වැඩි මහල්ලන්ට උපස්ථායකවරුන්ගේ හා අසුන් පෙන්වා දෙන්නන්ගේ කාර්යයන් ද කළ හැකිය. විශාල සභාවල අලුත් නිලයන් ඇතිවිය හැකිය. නිදසුනක් ලෙස පුද්ගලික උපදේශන දීම අත්‍යවශ්‍ය විය හැකිය. ඒ නිසා "උපදේශන අධ්‍යක්ෂක" නිලය සඳහා සභා පාලකවරයෙකු අවශ්‍ය වේ. පහත දැක්වෙන්නේ සේවා විස්තර කීපයක් සඳහා නිදර්ශක වේ.

## නායකත්ව නිලයන්

#### පාලකතුමා

පාලකතුමා, සභාවට මඟපෙන්වීම සඳහා දෙවියන්වහන්සේ විසින් කැඳවන ලද තෝරාගත් කෙනෙකු විය යුතුය. එම සභාවේ අනෙකුත් සියලුම දෙනා මොහුගේ නායකත්වය යටතේ සේවය කරති. ඔහුට අයත් රාජකාරී කටයුතු අතර පහත දැක්වෙන ඒවාද වේ.

1. ඇදහිලිවතුන් කණ්ඩායමක ශුභ සාධනය සඳහා පෞද්ගලිකව දිගු-කාලීන රැකවරණයක් ලබා දීම.

2. සභාවේ සියලුම කටයුතු අධීක්ෂණය හා සංවිධානය

3. සැලසුම් සකස් කිරීමට, ක්‍රියාත්මක කිරීම හා ඇගයීමට මඟපෙන්වීම.
4. නමස්කාරයට, යාච්ඤාවට, ඉගැන්වීමට, දේශනා කිරීමට, දීමට, එවැන්ජලිස්ත කටයුතුවලට, සහභාගිකමට හා සභාවේ අනෙකුත් ආත්මික කටයුතුවලට ආත්මික නායකත්වයක් ලබා දීම.

5. සේවයේ කාර්යයන් සඳහා සාමාජිකයන් යෙදවීම හා අවශ්‍ය දේ සැපයීම.

6. උපදේශනය, සාමාජිකයක් බලන්ට යෑම, විවාහ මංගල්‍යයන්, අවමඟුල්, ශුද්ධවූ සහභාගිකම ආදිය ඉටුකිරීම හෝ අන් අයට පැවරීම.

7. සභාවේ විනය පවත්වා ගැනීම.

**උප පාලකතුමා**

විශාල සභාවලට උප පාලකතුමෙකු අවශ්‍ය විය හැකිය. ඔහුටද පාලකතුමාට මෙන්ම ආත්මික කැඳවීමක් තිබිය යුතුය.

උපපාලකතුමා, සියලුම කටයුතුවලදී අවශ්‍ය පරිදි හා ඉල්ලීම පරිදි පාලකතුමාට සහාය විය යුතුය. එමෙන්ම පාලකතුමා ඔහුට පැවරූ සුවිශේෂී රාජකාරී කටයුතුද තිබිය හැකිය. නිදසුනක් ලෙස සියලුම උපදේශන කටයුතු හෝ සාමාජිකයන් බැලීමට යෑම ඔහුට පැවරිය හැකිය. සාමාන්‍යයෙන් ඔහුට අයත් කාර්යයන් වන්නේ පාලකතුමාට සහාය වීම වේ.

1. සහභාගීත්වයේ සියලුම සාමාජිකයන් ගැන සැලකිලිමත් වීම.

2. සම්පූර්ණ සභා සේවාව සංවිධානය කිරීම හා අධීක්ෂණය.

3. සැලසුම් කිරීම, සැලසුම් ක්‍රියාත්මක කිරීම හා ඇගයීම.

4. නමස්කාරයේදී, යාච්ඤාවේදී, ඉගැන්වීමේදී, දේශනා කිරීමේදී, දීමේදී, එවැන්ජලිස්ත කටයුතුවලදී, සහභාගිකමේදී හා අනෙකුත් සභා කටයුතුවලදී ආත්මික නායකත්වය සැපයීම.

5. සේවයේ කාර්යයන් සඳහා සාමාජිකයන් යෙදවීම හා අවශ්‍ය දේ සැපයීම.

6. උපදේශනය, සාමාජිකයන් බලන්ට යෑම, විවාහ මංගල්‍යයන්, අවමඟුල් ආදිය ඉටු කිරීම හෝ අන් අයට පැවරීම.

7. සභාවේ විනය පවත්වා ගැනීම.

**ප්‍රේරිතයෝ:**

අර්ථවිග්‍රහය: ප්‍රේරිතවරයෙකු යනු අලුත් සභාවන්, විවිධ ස්ථානවල හා විවිධ සංස්කෘතීන් තුළ පිහිටුවීමට හා සභා කිපයක් අධීක්ෂණය කිරීමට විශේෂ හැකියාව ඇති කෙනෙකි.

ප්‍රේරිතවරයෙකු යන්නෙහි තේරුම "නියෝජිතයෙකි, තවත් කෙනෙකු වෙනුවෙන් කියා කිරීමට පූර්ණ බලතල ඇතිව යැවූවෙකි." ප්‍රේරිතවරයාට, ලෝකය පුරා ශුභාරංචිය පැතිරවීමට හැකියාව හා ආධිපත්‍යය ඇත. එය කරනු ලබන්නේ ඇදහිලිවතුන්ගේ සංවිධානාත්මක මණ්ඩලයක් පිහිටුවීමෙනි.

ප්‍රේරිතවරයෙකු සඳහා භාවිත කරන නවීන නම් වන්නේ මිෂනාරිවරු හෝ සභා පිහිටුවන්නන් ආදියයි.

**දිවැසිවරු:**

අර්ථවිග්‍රහය: දිවැසිවර දීමනා දෙකක් ඇත. එකක් දිවැසිවරයෙකු වීමේ විශේෂ දීමනාවය. අනෙක අනාගතවාක්‍ය කීමේ දීමනාවය.

පොදුවේ ගත් කල දිවැස්වැකි කීම යනු "දෙවියන්වහන්සේගේ විශේෂ ආභාෂය යටතේ කතා කිරීමය. එය දිව්‍යමය ආලේපයක් යටතේ දෙවියන්වහන්සේගේ ක්ෂණික පණිවුඩයක් ලබා ගැනීමේ හා එය උන්වහන්සේගේ සෙනඟට සන්නිවේදනය කිරීමේ විශේෂ හැකියාව වේ."

**ගුරුවරු:**

අර්ථ විග්‍රහය: ගුරුවරුන් යනු දෙවියන්වහන්සේගේ වචනය ඵලදායිව සන්නිවේදනය කිරීමේ විශේෂ හැකියාව ඇති ඇදහිලිවතුන් වේ. එම වචනය උගත් අයට උගත් දේ ව්‍යවහාර කළ හැකි විය යුතුය.

**එවැන්ජලිස්තවරු:**

අර්ථ විග්‍රහය: එවැන්ජලිස්තවරු යනු ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකිව යුතු සාමාජිකයන් බවට පත්වන පරිදි නොඇදහිවතුන් සමඟ ශුභාරංචිය බෙදා ගැනීමේ විශේෂ හැකියාව ඇති අය වේ.

"එවැන්ජලිස්ත" යන වචනයේ තේරුම "ශුභ ආරංචිය ගෙන එන තැනැත්තා" යන්න වේ.


**සේවාවන්**

ප්‍රේරිතවරුන්ට, දිවැසිවරුන්ට, එවැන්ජලිස්තවරුන්ට, පූජකවරුන්ට හා ගුරුවරුන්ට ඔවුන්ගේ සභා සේවාවන්හි දී මෙම නිලයන් දරන අය සේවය කරනු ඇත.

**වැඩිමහල්ලන්**

වැඩිමහල්ලන් යනු පාලකවරුන්ට සභාවේ ආත්මික නායකත්වයේදී සහාය වන නායකයෝ වෙති. වැඩිමහල්ලන් පත් කරනුයේ පාලකතුමා විසිනි. ඇතැම් සභාවන් ඔවුන් හඳුන්වන්නේ "එඩේරුන්" හෝ "සෛල කණ්ඩායම් නායකයින්" හෝ ලෙසය. වැඩිමහල්ලන් පිළිබඳව බයිබලයේ පහත දැක්වෙන ජේදවල ඔබට කියවිය හැකිය. තිතස් 1:6; කොලොස්සි 1:25; 1 තිමෝති 3:1-7; 4:5-6; 5:17; ක්‍රියා 14:23; 20:17,28-32; 1 පේතෘස් 5:1-4; ජාකොබ් 5 :14.

වැඩිමහල්ලන් විශේෂයෙන්ම වැදගත් වන්නේ පාලකතුමාට සෑම සාමාජිකයෙකුටම පෞද්ගලිකවම අවධානය යොමු කළ නොහැකි ප්‍රමාණයකට සභාව වර්ධනය වූ විටය. සෑම වැඩිමහල්ලෙකුටම සභාවේ කුඩා කණ්ඩායමක් වෙනුවෙන් වගකීම භාරගත හැකිය. පහත දැක්වෙන්නේ වැඩිමහල්ලන් සය දෙනෙකු ඇති සභා සංවිධානයක රූප සටහනකි. සෑම වැඩි මහල්ලෙකුටම රැක බලා ගැනීම සඳහා දස දෙනෙකුගෙන් යුත් කුඩා කණ්ඩායමක් ඇත.



වැඩිමහල්ලෙකුගේ රාජකාරී කටයුතු අතර පහත දැක්වෙන ඒවාද ඇත.

1. සාමාජිකයන්ගේ ආත්මික ශුභසාධනයට අදාළ සියලුම කටයුතු

2. සේවයේ කාර්යයන්වලදී පාලකතුමාව දිරිමත් කිරීම

3. සභාව හා පාලකතුමා වෙනුවෙන් නිරන්තරයෙන්ම යාච්ඤා කිරීම

4. සේවයේ දී ඇතිවන අසීරුතා අවස්ථාවලදී පාලකතුමාට උපකාර කිරීම

5. පාලකතුමා පවරා ඇති පරිදි සභාව තුළ කුඩා කණ්ඩායම්වල ආත්මික කටයුතු බලා ගැනීම.
   තම කණ්ඩායම සමඟ නිතරම රැස්වීම, ඔවුන්ගේ ආත්මික වර්ධනයට මඟපෙන්වීම හා ආත්මික දීමනාවන් වර්ධනය කර ගැනීමට උපකාරී වීම.
   පෞද්ගලික උපදේශනය සැපයීම හා ඔවුන්ගේ නිවෙස්වලට යෑම.

6. සාමාජිකයන්ගේ මරණයනිහිදී, අසීරු ගැටලුවලදී හෝ අසනීකම්වලදී පාලකතුමාගේ අවධානය යොමුවිය යුතු අවස්ථාවල ඔහුට උපදෙස් දීම.

7. විවිධ කටයුතුවලදී හා ප්‍රායෝගික අවස්ථාවන්හිදී තීරණ ගැනීමට පාලකතුමාට සහාය වීම.

8. සභා විනයට සහාය වීම.

**උපස්ථායකවරු**

උපස්ථායකවරු යනු සභාවේ ප්‍රායෝගික කටයුතු කරන අය වෙති. (ක්‍රියා 6:1-7 බලන්න) සෙනඟට ඔවුන්ව තේරිය හැකිය. එහෙත් පාලකතුමා අනුමත කළ යුතුය. උපස්ථායකවරුන් පිළිබඳව, බයිබලයේ පහත දැක්වෙන ජේදවල ඔබට කියවිය හැකිය. 1 තිමෝති 3:8-13; පිලිප්පි 1:1; ක්‍රියා 6:1-7.

ඔවුන්ගේ රාජකාරීන් අතරින් මේවාද වේ.
1. සාමාජිකයින්ගේ භෞතික හා ද්‍රව්‍යමය අවශ්‍යතාවන් ගැන සැලකිලිමත්වීම
2. ශුද්ධවූ රාත්‍රී භෝජන පිළියෙල කිරීම හා පිළිගැන්වීම
3. සභාවේ සේවා කටයුතුවලට අදාළ ප්‍රායෝගික කාර්යයන් ඉටු කිරීමට වැඩ කණ්ඩායම් සංවිධානය කිරීම
4. වයස්ගත අයට හා ආබාධිත අයට දේව මෙහෙයට පැමිණීමට හා ආපසු යෑමට ගමන් පහසුකම් සැපයීම
5. හදිසි අවස්ථාවල ආහාර හා නවාතැන් සැපයීම

**යාච්ඤා සභාපතිවරු:**

මේවාද රාජකාරි කටයුතුවලට අයත්විය හැකිය.

1. යාච්ඤාව කෙරෙහි විශේෂ අවධානයක් යොමුවන කාලයන් සංවිධානය කිරීම. නිදසුනක් වශයෙන් යාච්ඤාව පිළිබඳ සම්මන්ත්‍රණ හා සම්මේලන

2. නිරතුරුවම යාච්ඤා රැස්වීම් සංවිධානය කිරීම හා පැවැත්වීම

3. සාමාජිකයන්ගේ විශේෂ යාච්ඤා ඉල්ලීම් ලබා ගැනීම හා ඒවා ස්වාමීන්වහන්සේගේ පාමුල තැබීම

4. සභාවේ සේවාවන් සඳහා මැදහත්කරුවන් බඳවා ගැනීම (සෑම ඇදහිලිවන්තයෙකුම යාච්ඤා කළ යුතුය. එහෙත් මැදහත්කරුවන් යනු සේවයක් ලෙස මැදහත් යාච්ඤාවන් පැවැත්වීමට විශේෂ කැඳවීමක් ලැබුවෝ වෙති.).

**කිතුනු අධ්‍යාපන අධ්‍යක්ෂක:**

මෙම රාජකාරි කටයුතුද ඇතුළත් විය හැකිය.

1. මුළු සභාව සඳහාම කිතුනු අධ්‍යාපන, ශ්‍රාවකභාවය හා පුහුණුවීම් පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කිරීම.

ඉගෙනීම හැකියාවන් වයස් මට්ටම අනුව වෙනස්වන බැවින් මෙම සම්මේලන වයස් මට්ටම් අනුව සංවිධානය කිරීම වඩා යහපත්ය. කණ්ඩායම් බෙදීම මේ ආකාරයෙන් කළ හැකිය.

- කුඩා ළමයින් (දේව මෙහෙය පැවැත්වෙන වේලාව ළදරුවන් බලා ගැනීම)
- ළමයින් (වයස් අනුව හෝ පාසල් ජාතිය අනුව හෝ සංවිධානය කර ඇත)
- තරුණයින්
- විවාහ නොවූ තරුණ වැඩිහිටියන්
- විද්‍යාල වයසේ අය
- මැදි වයසේ අය/ජෝඩු
- වයස්ගතවූවන්
- නිවෙස් කණ්ඩායම් නායකයන්

2. සෑම වයස් කණ්ඩායමකටම නායකයින් බඳවා ගෙන පුහුණු කිරීම (ගුරුවරුන් පුහුනු කිරීම සඳහා හාවස්ටයිම් ජයත්‍යන්තර ආයතනයේ "ඉගැන්වීමේ උපක්‍රම" පාඨමාලාව උපකාරී වනු ඇත)

3. ගුරුවරුන් රාජකාරි කටයුතුවල යෙදී සිටියදී අධීක්ෂණය කිරීම මේ සඳහා පහත දැක්වෙන දේ ඇතුලත් විය හැකිය.

   - සේවා කාර්යයන් සඳහා පන්ති සාමාජිකයන් පුහුණු කිරීම
   - පන්තියේ සිටින සෑම සාමාජිකයෙකු වෙනුවෙන්ම යාච්ඤා කිරීම
   - පන්තියේ සාමාජිකයන් ගැන සැලකිලිමත් වීම (නොපැමිණිවිට බැලීමට යෑම, උපදේශ සැපයීම, භෞතික හා ද්‍රව්‍යමය අවශ්‍යතාවන් සොයා බැලීම)
   - සහභාගිත්වය සඳහා අවස්ථාවන් ලබා දීම.

**එවැන්ජලිස්තකරනයේ හා සේවයේ අධ්‍යක්ෂක**

රාජකාරි කටයුතුවල මේවාද තිබිය හැකිය.

1. ප්‍රදේශයේ පිහිටි සභාවෙන් පිටතැන්වල කෙරෙන එවැන්ජලිස්තකරණ කටයුතු, සංවිධානය කිරීම හා අධීක්ෂණය

2. නගරය වටා, ජාතික හා අන්තර්ජාතික එවැන්ජලිස්ත කටයුතු සංවිධානය හා අධීක්ෂණය.

3. සේවාවන් හා එවැන්ජලිස්ත කටයුතු සඳහා සභා සාමාජිකත්වය පුහුණු කිරීම හා පෙළඹවීම.

4. සේවා සම්මන්ත්‍රණ, සම්මේලන ආදිය පැවැත්වීම.

5. සභාව මගින් උපකාර කරන මිෂනාරිවරුන් සමඟ සම්බන්ධතා පැවැත්වීම

6. දේවස්ථානයේ කතාවන් පැවැත්වීම සඳහා මිෂනාරිවරුන්ට හා එවැන්ජලිස්තවරුන්ට කාලය වෙන් කිරීම.

7. මිෂනාරී හා එවැන්ජලිස්ත කටයුතු සඳහා මුදල් ඉපයීම.

**පුරුෂයින්ගේ සේවා අධ්‍යක්ෂක**

මොහුගේ රාජකාරි කටයුතුවලට සැලසුම් කිරීම, සංවිධානය හා සභාවේ පුරුෂයන් වෙනුවෙන් කෙරෙන විශේෂ සේවාවන් අධ්‍යක්ෂණය ඇතුලත් වේ.

මේවාද ඇතුලත් විය හැකිය.

1. පුරුෂයින් සඳහා යාච්ඤා රැස්වීම්, බයිබල් අධ්‍යයන, පුහුණුවීම් හා සහභාගි කාලයන් නිරතුරුවම පැවැත්වීම.

2. යාච්ඤා කිරීම, අධ්‍යයනය, දීම, සේවය කිරීම හා සාක්ෂිදීම ඇතුළුව සභාවේ විවිධ සේවයන් සඳහා පුරුෂයන් සහභාගි කරවීම.

3. ධර්මවිවේක, සම්මන්ත්‍රණ, සම්මේලන ආදී විශේෂ රැස්වීම් පුරුෂයන් වෙනුවෙන් පැවැත්වීම.

4. අවශ්‍යතා ඇති පුරුෂයිනට උපදේශනය සැපයීම.

**ස්ත්‍රී සේවා අධ්‍යක්ෂක**

මෙම රාජකාරී කටයුතුවලට සැලසුම් කිරීම්, සංවිධානය හා සභාවේ ස්ත්‍රීන් වෙනුවෙන් කෙරෙන විශේෂ සේවා අධ්‍යක්ෂණය ඇතුලත් වේ.

1. ස්ත්‍රීන් සඳහා යාච්ඤා රැස්වීම්, බයිබල් අධ්‍යයන, පුහුණුවීම් හා සහභාගි කාලයන් නිරතුරුවම පැවැත්වීම.

2. යාච්ඤා කිරීම, අධ්‍යයනය, දීම, සේවය කිරීම හා සාක්ෂිදීම ඇතුළුව සභාවේ විවිධ සේවයන් සඳහා ස්ත්‍රීන් සහභාගි කරවීම.

3. ධර්මවිවේක, සම්මන්ත්‍රණ, සම්මේලන ආදී විශේෂ රැස්වීම් ස්ත්‍රීන් වෙනුවෙන් පැවැත්වීම.

4. අවශ්‍යතා ඇති ස්ත්‍රීන්ට උපදේශනය සැපයීම.

**සංගීත අධ්‍යක්ෂකවරයා**

රාජකාරී කටයුතු වල මේවාද තිබිය හැකිය.

1. සියලු දේව මෙහෙයන් සඳහා සංගීතය සැලසුම් කිරීම.

2. ගිතිකා කණ්ඩායම් සංවිධානය කිරීම. මේ සඳහා ළමා වැඩිහිටි හා තරුණ ගිතිකා කණ්ඩායම් ඇතුළත් විය හැකිය. සංගීත අධ්‍යක්ෂකවරයා සෑම කණ්ඩායමක් සඳහාම නායකයෙකු තෝරා පුහුණු කළ යුතුය. නැතිනම් ඔහු විසින්ම මෙහෙය විය යුතුය.

3. විශේෂ සංගීත සැලසුම් කිරීම (ඒකල, යුගල ආදී).

4. වාදකයන් සංවිධානය කිරීම හා අධ්‍යක්ෂණය කිරීම (පියානාව, ඕගන් වාදක, තූර්ය වාදන කණ්ඩායම හෝ වාදක සමූහය).

5. විශේෂ විවිධ ප්‍රසංග හා සංගීත වැඩසටහන් සංවිධානය කිරීම හා අධ්‍යක්ෂණය කිරීම.

6. ගිතිකා මෙහෙය වන්නන් අධීක්ෂණය කිරීම.

7. සභාවේ පැවැත්වීමට නියමිත විවාහයන් සහ අවමංගල්‍යයන් සඳහා සංගීතය සැලසුම් කිරීම සහ අධ්‍යක්ෂණය කිරීම.

8. ගිතිකා කණ්ඩායමේ ඇඳුම්, සංගීත භාණ්ඩ හා සංගීතය ආදිය පිළිබඳව සොයාබැලීම.

**සභා ලේකම්**

රාජකාරී කටයුතුවලට මේවාද තිබිය හැකිය:

1. ලිඛිත ලිපි ගනු දෙනු

2. සියලුම අමුත්තන්ට ලිපි යැවීම

3. සභාවේ කාර්යාලය, දුරකථන, අමුත්තන් ආදිය අධීක්ෂණය

4. සභා වාර්තා පවත්වාගෙන යෑම (පැමිණීම, අමුත්තන්, සාමාජිකත්වය ආදිය)

5. සැපයීම් ඇණවුම් කිරීම

6. සභා කාර්යාල කටයුතුවලට (යතුරු ලියනය, ලිපි සකස් කිරීම, ලිපි ගොනු කිරීම) සහාය වන ස්වේච්ඡා සේවකයින් අධීක්ෂණය කිරීම

7. විශේෂ වාර්තා පිළියෙල කිරීම

8. සියලු රැස්වීම් හා සිද්ධීන් සටහන් කර ඇති සභා දින දර්ශනය පවත්වා ගෙන යාම

9. කාර්යාල උපකරණ හා සැපයීම් නඩත්තු කිරීම

10. රැස්වීම්වල සටහන් ගැනීම

**මුදල් අධ්‍යක්ෂක**

රාජකාරි කටයුතුවල මේවාද ඇතුලත් විය හැකිය.

1. පූජාවන් ගණන් කිරීම, සටහන් කිරීම හා රිසිට්පත් ලිවීම (පූජාවන් ගණන් කරන විට අවම වශයෙන් දෙදෙනෙක්වත් සිටීම සුදුසුය. අවංකබව මින් රැකේ)

2. මූල්‍යමය වාර්තා පවත්වාගෙන යෑම (එනම් ඉතිරි කිරීමේ ගිණුමක්, ගොඩනැගිලි, සේවාවන් ආදිය සඳහා විශේෂ ගිණුමක් ආදිය).

3. බැංකු වාර්තා පවත්වාගෙන යෑම

4. පාලකතුමාගේ මඟපෙන්වීම යටතේ මිලට ගැනීම් හා මුදල් ගෙවීම් කිරීම (පාලකතුමා හැරුණු විට, සභාව වෙනුවෙන් මිලට ගැනීම් සඳහා බලය දිය යුත්තේ වෙනත් කවරෙකුටදැයි ඔබ තීරණය කළ යුතුය).

5. මුදල් ඉපයීමේ විශේෂ ව්‍යාපෘති සැලසුම් කිරීම හා අධීක්ෂණය

6. මාසික හා වාර්ෂික මූල්‍යමය වාර්තා සකස් කිරීම

7. අය-වැය ලේඛණ යෝජනා කිරීම හා අධීක්ෂණය

8. දසයෙන් කොටස දීමට උනන්දු කරවීම

**දේපළ නඩත්තු කිරීමේ අධ්‍යක්ෂක**

රාජකාරී කටයුතුවලට මේවාද අයත් විය හැකිය.

1. සභා ගොඩනැගිලි හා දේපල නිරතුරුවම ශුද්ධ පවිත්‍ර කිරීම හා රැකබලා ගැනීම අධීක්ෂණය කිරීම.

2. ගොඩනැගිලි හා දේපලවල ප්‍රතිසංස්කරණ කටයුතු අධීක්ෂණය.

3. රැස්වීම්වලට පෙර හා පසු පහසුකම් ලබාදීම හා සමාප්ත කිරීම.

4. ජලය, විදුලිය, තාපක, වායු සමනය කිරීම් ආදිය අධීක්ෂණය.

5. ශුද්ධ පවිත්‍ර කිරීමේ සැපයුම් හා අලුත් වැඩියා කිරීමේ ද්‍රව්‍ය ඇණවුම් කිරීම හා ඉන්වෙන්ටරි පොත් පවත්වාගෙන යෑම.

6. රැකබලා ගන්නා නිලධාරීන් අධීක්ෂණය.

7. සභාවේ පහසුකම් ගාස්තු මගින් කෙරෙන ස්වේච්ඡා වැඩ අධීක්ෂණය.

**ශ්‍රව්‍ය-දෘෂ්‍ය අධ්‍යක්ෂක**

ශ්‍රව්‍ය-දෘෂ්‍ය උපකරණ හා ඒ සඳහා මුදල් සභාවකට තිබේ නම්, මේවා භාර නිලධාරියෙකු සිටිය යුතුය. පහත දැක්වෙන සම්පත් අධීක්ෂණය කිරීම ඔහුට කළ හැකිය.

1. සභා පුස්තකාලය

2. ශබ්ද-විකාශන පද්ධතිය, ප්‍රක්ෂේපන, කැසට් යන්ත්‍ර, චිත්‍ර පට ආදි ශ්‍රව්‍ය-දෘෂ්‍ය උපකරණ හා සැපයුම්.

3. ශ්‍රව්‍ය හෝ දෘෂ්‍ය කැසට් පට සේවයක්.

4. ශ්‍රව්‍ය-දෘෂ්‍ය ද්‍රව්‍ය ඇණවුම් කිරීම හා ඒවා සඳහා ඉන්වෙන්ටරියක් පවත්වා ගෙන යෑම.

**අසුන් පෙන්වන්නා**

මේ කටයුතුද අයත් විය හැකිය.

1. දේවමෙහෙයට පැමිණෙන විට සෙනඟ පිළිගැනීම

2. දේවමෙහෙය පැවැත්වෙන අතරතුර අවශ්‍ය ද්‍රව්‍ය රැස් කිරීම හා බෙදා දීම

3. දීමනා එකතු කිරීම හා ඒවා ගණන් කිරීමට මූල්‍යමය අධ්‍යක්ෂකට සහාය වීම.

4. අමුත්තන් සඳහා වූ කාඩ් පත් බෙදා දී ඒවා නැවත එක් කිරීම,

5. දේව මෙහෙය වේලාවේ සෙනඟ අසුන් ගැන්වීම.

6. දේව මෙහෙයට බාධා පමුණුවන ශබ්ද හා වෙනත් දේ ගැන සැලකිලිමත් වීම.

7. වටාපිටාව පිරික්සීම (ආලෝකය, උණුසුම ආදි ගැටලු) මේවා දේපල නඩත්තු කිරීමේ අධ්‍යක්ෂකට වාර්තා කිරීම.

8. ගීතිකා පොත් හා වෙනත් අවශ්‍ය දේ බංකුවල තිබේ දැයි පිරික්සීම.

9. වේදිකාවේ ඇති දේ පිරික්සීම (පාලකවරුන්ට පුටු, කවිකයන්, ජලය, ආලේපතෙල් ගීතිකා පොත් ආදිය)

10. පැමිණීම ලබා ගැනීම (මේ පිළිබඳව වාර්තා තබා ගන්නේ නම්)

11. යාච්ඤා කිරීම්වලට සහාය වීම.

12. ශුද්ධවූ රාත්‍රී භෝජනය බෙදීම (හෝ එය බෙදන වැඩිමහල්ලන්ට සහාය වීම)

**ප්‍රචාරක සභාපති**

මෙම රාජකාරි කටයුතු අතර සහභාගිත්වය තුළ හා සමූහයාට සභා වැඩ සටහන් ප්‍රචාරය කිරීම සඳහා පහත දැක්වෙන දේ භාවිත කළ හැකිය.

1. පුවත් ලිපි

2. පුවත්පත් වාර්තා හා ප්‍රචාරක දැන්වීම්

3. පෝස්ටර

4. ගුවන් විදුලිය හා රූපවාහිනිය

5. දේවමෙහෙයෙදී වාචිකව දැනුම් දීම්

6. සභා ප්‍රවෘත්ති නිවේදන පත්‍රිකා

7. දැන්වීම් පුවරුව හා ප්‍රදර්ශක පුවරු

**විශේෂ (කාරක සභා) කමිටු**

(කාරක සභාවක්) කමිටුවක් යනු විශේෂ කාර්යයක් සඳහා සංවිධානය කළ කුඩා කණ්ඩායමකි (20 ට වැඩිය නොසිටිය යුතුය). නිදසුනක් වශයෙන් සභාව සඳහා සේවා සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීමට විශේෂ කමිටුවක් පත් කළ හැකිය. එමෙන්ම නගරය පුරා කෙරෙන ප්‍රචාරයක් සඳහා හෝ අලුත් සභා ගොඩනැගිල්ලක් සඳහා හෝ සැලසුම් කිරීමට කමිටුවක් පත් කළ හැකිය.

සභාවේ කෙරෙන විවිධ සේවාවන් සංවිධානය සඳහා අවශ්‍ය වන සියලුම කමිටු පිළිබඳව සාකච්ඡා කිරීම කෙසේවත් කළ නොහැකිය. එහෙත් කමිටු සඳහා පොදු උපදෙස් සමහරක් පහත දැක්වේ.

1. සභාව තුළ ඇති ඕනෑම කමිටුවක් සෑම විටම පාලකතුමා යටතේ පැවැත්විය යුතුය. සභාවේ නායකයා ලෙස එම පාලකතුමා පත්කර ඇත්තේ දෙවියන්වහන්සේ වේ. කමිටු පත් කරනු ලබන්නේ සේවා කටයුතු සඳහා ඔහුට සහායවීමට මිස ඔහුව පාලනය කිරීමට හෝ ඔහුට අණ කිරීමට හෝ නොවේ.

2. කමිටුවේ සෑම සාමාජිකයෙකුම කමිටුවේ පරමාර්ථය දැනගත යුතුය. ඔවුන්ව කමිටුවක් ලෙස සංවිධානය කර ඇත්තේ මන්ද? පරමාර්ථය කුමක්ද? ඔවුන් සාක්ෂාත් කළ යුත්තේ කවරක්ද?

3. කමිටුවට අවශ්‍ය අය පමණක් පත් කරන්න.

4. කමිටු සාමාජිකයන් තම වගකීම්වල සීමාවන් දැනගත යුතුය. ඔවුන්ගේ සීමාවන් තුළ කාර්යය කිරීම සඳහා අවශ්‍ය අධිකාරී බලය ඔවුන්ට තිබිය යුතුය.

5. අවශ්‍ය අවස්ථාවලදී පමණක් රැස්වන්න. සෑම රැස්වීමක්ම මනාව සංවිධානය කර ඇති බවට සහතික වන්න (රැස්වීම් සඳහා උපදෙස් බලන්න). සෑම සාමාජිකයෙකුම නියමිත වේලාවට සූදානම් සහිතව පැමිණ සිටිය යුතුය. ඔහුට පවරා ඇති කාර්යයන් පිළිබඳව ඔහු සටහන් ගත යුතුය. ඔහුගේ කාර්ය කිරීමට අවශ්‍ය ඕනෑම දෙයක් පිළිබඳව ප්‍රශ්න ඇසිය යුතුය.

6. සෑම කමිටුවකටම සභාපති කෙනෙක් සිටිය යුතුය. සභාපතිගේ වගකීම් වන්නේ කමිටුව සංවිධානය කිරීම, රැස්වීම් නියම කිරීම හා පැවැත්වීම, සහ ගැටලු පිළිබඳ ප්‍රගතිය පාලකත=මාට වාර්තා කිරීම වේ.

7. සෑම කමිටු සාමාජිකයෙකුටම නියමිත කාර්යයක් තිබිය යුතු අතර ඔහු කළ යුතු දෙය ස්ථිර වශයෙන්ම දැනගත යුතුය.

8. කමිටු රැස්වීමකට පසු සෑම සාමාජිකයෙකුම
   - තමාට පැවරූ දෙය කළ යුතුය
   - ඔවුන් සමඟ කටයුතු කරන අනෙක් අයට ඔවුන් දත යුතු තොරතුරු, තීරණ ආදිය දැන්විය යුතුය.
   - රහසිගතව තබාගත යුතු බවට දැනුම් දුන් දේ රහසිගතව තබා ගත යුතුය.

9. තම කාර්යන් ඉටු කර අවසන් කළ පසු කමිටුව විසුරුවා හැරිය යුතුය.

**සේවයේ කාර්යයන් සඳහා සෙනඟ තෝරා ගැනීම**

විවිධ කාර්යයන් කිරීම සඳහා සෙනඟ තෝරා ගැනීමට යෝජනා කීපයක් පහත දැක්වේ.

1. කළ යුතු කාර්යයන් පිළිබඳව ලයිස්තුවක් සකසන්න.

2. ඔබ හඳුනාගත් එක් එක් කාර්යයක් කිරීමට හැකියාවක් ඇති අයගේ ලයිස්තුවක් සකසන්න. ඔබගේ තේරීම්, ඔවුන්ගේ ජීවිතයේ දැකිය හැකි ආත්මික දීමනාවන් මත පදනම් කරගන්න.

3. තේරීම් කරන විට, අවශ්‍ය මඟපෙන්වීම දෙන ලෙස ඉල්ලා මෙම ලයිස්තුව උදෙසා යාච්ඤා කරන්න.

4. සෑම පුද්ගලයෙක්ම මෙම කරුණු මත අගයන්න.
   - ආත්මික අත්දැකීම්
   - ශක්තීන්
   - දුර්වලතාවන්
   - අධ්‍යාපනය
   - අත්දැකීම්
   - ආත්මික දීමනා
   - නායකයන් වෙනුවෙන් බයිබලීය ප්‍රමිති

5. එක් එක් කාර්යය සඳහා එක් පුද්ගලයෙකු බැගින් තෝරන්න.

6. සෑම තත්වයකටම සේවා විස්තරයක් ලියන්න.

7. පුද්ගලයෙකු පත් කර ඔහුට කාර්යය පවරන්න. සෑම පුද්ගලයෙකු ළඟම තම වගකීම පිළිබඳ ලිඛිත විස්තරයක් ඇති බවට සහතික වන්න. මේවා ලිවීම සඳහා මෙම කොටසෙහි ඇති සේවා තත්ව විස්තර භාවිත කරන්න.

8. තමාගේ කාර්යය ඉටු කිරීමට අවශ්‍ය පුහුණුව සෑම කෙනෙකුටම ලබා දෙන්න.

# ඇමුණුම පහ

# සැලසුම් කිරීම

**සැලසුම් සාම්පල**

සැලසුම් කිරීමේ ක්‍රම මෙම පාඨමාලාවෙන් විස්තරාත්මකන පැහැදිලි කෙරිනි. සැලසුම් සකස් කිරීම සඳහා උපකාරී වීමට හතරවන පරිච්චේදයද, ක්‍රියාත්මක කිරීම සඳහා පස්වන පරිච්ජේදයද ඇගයීමට හයවන පරිච්ජේදයද භාවිත කරන්න.

සභාව සැලසුම් සකස් කළ යුතු ක්ෂේත්‍ර කීපයක් පහත දැක්වේ.

- එවැන්ජලිස්ත සේවය
- දීම
- පුහුණු කිරීම/ශ්‍රාවක භාවය
- සහභාගිත්වය
- නමස්කාරය
- යාච්ඥාව
- පිටත කෙරෙන විශේෂ සේවාවන්

ඇතැම් සභා සකස් කළ අරමුණු සඳහා නිදසුන් පහත දැක්වේ. එක් එක් සැලැස්ම විස්තර (කවුරු, කවරක් කරයිද, දින, වැය ආදිය) මෙහි සඳහන්ව නැත. මෙහි ඇත්තේ ඔබට සැලසුම් වර්ග පිළිබඳ යම් අදහසක් දීමට, ඇතැම් සභා සකස් කළ ප්‍රධාන අරමුණුවල කෙටි සටහනකි.

1. ඊළඟ අවුරුදු පහ ඇතුළත සෑම අවුරුද්දකම නමස්කාරයට සහභාගි වන්නන්ගේ සාමාන්‍ය පැමිණීම 20% කින් වැඩි කිරීම.

2. ඊළඟ අවුරුදු පහ ඇතුලත සාමාජික සංඛ්‍යාව 50% කින් වැඩි කිරීම.

3. අවුරුදු පහක් ඇතුලත නමස්කාරය සඳහා සාමාන්‍ය පැමිණීම 300 දක්වා වැඩිකර ඉන්පසු ඔවුන් බෙදා තවත් දේවස්ථානයක් පිහිටුවීම.

4. ඊළඟ අවුරුද්දේ කුඩා කණ්ඩායම් තුනක් ආරම්භ කිරීම

5. ඊළඟ අවුරුද්දේ ඉරිදා පාසල් පැමිණීම 15% කින් වැඩි කිරීම.

6. අවුරුද්දකට සභා වැඩසටහන් සඳහා දෙන දීමනාව, සාමාන්‍ය සෑම නිවෙසකම ආදායමෙන් 10% ක් වන තුරු අවුරුද්දකට 1% කින් වැඩි කිරීම.

7. ඊළඟ අවුරුද්දේ කුඩා කණ්ඩායම් නායකයන් පස් දෙනෙකු පුහුණු කිරීම.

8. අවුරුදු පහක් ඇතුලත, ධර්මදූත සේවය සඳහා අය-වැය ලේඛණයෙන් වෙන් කෙරෙන මුදල 40% දක්වා වැඩි කිරීම.

9. ඊළඟ අවුරුදු පහ ඇතුලත ඉරිදා පාසල් ගුරුවරුන් දස දෙනෙකු අලුතින් පුහුණු කිරීම.

10. අවුරුදු දහයක් ඇතුලත අපගේම පහසුකම් අපම සපයා ගැනීම.

11. ඊළඟ අවුරුද්දේ අවම වශයෙන් සහභාගිත්ව පහක්වත් සැලසුම් කිරීම.

12. ඊළඟ අවුරුද්ද ඇතුලත පුරුෂ සහභාගිත්ව කණ්ඩායම් සංවිධානය කිරීම.

13. ඊළඟ අවුරුද්දේ සභාවට අලුතින් නිවෙස් දහයක් එක්කර ගැනීම.

14. ඊළඟ අවුරුද්ද ඇතුලත කිතු දහම පැතිරවීම සඳහා සහාය කණ්ඩායමක් සංවිධානය කිරීම.

**සේවා සිද්ධියක් සැලසුම් කිරීම.**

සේවය සඳහා ඔබ සැලසුම් කරන සෑම සිද්ධි වර්ගයක් පිළිබඳවම අපට සාකච්ඡා කිරීම අපහසුය. ඔබට සම්මන්ත්‍රණ, සම්මේලන, පිබිදීම් සැසි හා ධර්ම පැතිරවීම් පැවැත්වීම අවශ්‍ය විය හැකිය. මෙහි දැක්වෙන්නේ සාමාන්‍යයෙන් ඕනෑම සේවා-සිද්ධියක් සැලසුම් කිරීම භාවිත කළ හැකි මාර්ගෝපදේශ කිපයකි.

1. සේවා සිද්ධිය සඳහා පරමාර්ථයක් පිහිටුවන්න.

සම්මන්ත්‍රණයේ, සම්මේලනයේ, පිබිදීම් සැසියේ ආදියේ පරමාර්ථය කුමක්ද? ඔබ උගත් පරිදි පරමාර්ථය සැලසුමට මඟපෙන්වයි.

2. එම සිද්ධියේ දිනය හා කාලය වෙන්කරන්න.

3. තැනක් සොයාගන්න. එය තෝරා ගැනීමේදී මේ දේවල් ගැන සැලකිලිමත් වන්න.

ප්‍රමාණය – ඊට පැමිණීමට නියමිත සංඛ්‍යාවට ඉඩකඩ ප්‍රමාණවත් විය යුතුය.

ලක්ෂණයන් – එම සිද්ධියට අදාළ ලක්ෂණයන්ට ගැළපිය යුතුය. නිදසුනක් වශයෙන්, ඔබ පළමුව විශාල කණ්ඩායමක් ලෙස රැස්වී පසුව කුඩා කණ්ඩායම් වලට වෙන්වීම අවශ්‍ය නම්, ඔබට විශාල කාමරයක් සහ කුඩා කාමර කිපයක් අවශ්‍ය වේ. ඔබ අහාර පිසීමට සැලසුම් කරන්නෙහි නම් කුස්සියක් ඇති ස්ථානයක් අවශ්‍යය.

පිහිටීම-පොදු ප්‍රවාහන පහසුකම් භාවිතයෙන් පැමිණිය හැකි තැනක් විය යුතු අතර හැකි පමණ ඊට සහභාගි වන්නන්ගේ නිවෙස්වලට ආසන්න තැනක් වීම සුදුසුය.

වියදම - ඔබට දැරිය හැකි විය යුතුය.

4. කමිටුවක් පිහිටුවා පහත දැක්වෙන වගකීම් පවරන්න.

පොදු සම්බන්ධීකරණය: සම්බන්ධීකරන නිලධාරි තැන අනෙක් සියලු දෙනාගේම කටයුතු අධීක්ෂණය කරන අතර මුළු සිද්ධියේ සියලුම කොටස් සම්බන්ධීකරණය කරයි.

- කාල සීමාවන් පැනවීම: කාලසීමාවන් ගැන සැලකීමේදී මේවාද ඇතුළත් විය යුතුය.

1. මීට පෙර කළ යුතු සියලුම දේ: එය කරන්නේ කවුරුන්ද? කවදාද?

2. සැබෑ සිද්ධියේ කාල සීමාවන්: එය සැබවින්ම සිදුවන දිනයේ සිදුවිය යුත්තේ කුමක්ද? කුමන වේලාවන් වලද?

3. ඉන් පසු කළ යුතු කාර්යයන් මොනවාද?

- අය-වැය: එම සිද්ධියට අදාළව අය-වැය සකස් කිරීමේදී මුදල් ඉපයීම, බිල් පත් සඳහා ගෙවීම්, සිද්ධිය දිනයේදී දීමනා ලබා ගැනීම, පිටතින් පැමිණෙන කථිකයන් සඳහා දීමනා ලබා ගැනීම කළ යුතු වේ.

- පහසුකම් සැපයීම: පහසුකම් සැපයීමට මේවා අවශ්‍ය විය හැකිය. පුටු, වේදිකාව, මේස, දීමනා තබන තැන්, මයික්‍රොෆෝන්, විවිධ උපකරණ, දේශනා කුඩුව, ශ්‍රව්‍ය-දෘශ්‍ය උපකරණ, උපදේශනය හා ලියා පදිංචි කිරීම සඳහා සැලයීම්.

- ලියා පදිංචි කිරීම: ඔබ පුද්ගලයන් ලියා පදිංචි කරන්නෙහිද? එසේ නම් ලියා පදිංචි කරන වේලාවේ බෙදා දෙන දේ මොනවාද? ලියා පදිංචිය සඳහා පැමිණෙන අයගේ පෝලිම පිළිබඳව ඔබ කටයුතු කරන්නේ කෙසේද? ලියා පදිංචි වීමට මුදලක් වැය වේද? නාම පුවරු අවශ්‍යද? ඔබට අවශ්‍ය වන පෝරම මොනවාද? ඔබ අවශ්‍ය වන පුද්ගලයන් කවරේද?

- ප්‍රචාරය කිරීම: ඔබගේ සිද්ධියට ප්‍රචාරයක් ලබා දෙන්නේ කෙසේද? විශේෂ ලිපි යැවීම්, දුරකථන පණිවුඩ, ග=වන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත්, පෝස්ටර, එම පෙදෙසේ දේවස්ථානවල කරන දැන්වීම් ආදි ප්‍රචාරණ කටයුතු සඳහා කෙනෙකු තෝරා ගන්න.

- උපදේශනය: ආත්මික අවශ්‍යතා ඇති අයට සහාය වීම සඳහා උපදේශකවරුන් පුහුණු කිරීමට කෙනෙක්ව යොදවන්න. මෙම උපදේශකවරුන්, ක්‍රිස්තුන්වහන්සේ වෙතට යම් කෙනෙකු ගෙන ඒමට, අසනීප අයට යාච්ඤා කිරීමට, මිදීම ලබා දීම සඳහා සේවය කිරීමට දැන ගැනීම අවශ්‍යය. ඔවුන් අත බයිබල්, ශුද්ධ ලියවිලි පාඨ සහිත පත්‍රිකා, ආත්මික උපකාර බලාපොරොත්තුවන අයගේ තොරතුරු ලිවීමට, ඔවුන්ගේ නම් හා ලිපිනයන් සහිත කාඩ්පත් ආදිය තිබිය යුතුය. ඔවුන් සමඟ පසුව  සම්බන්දකම් පැවැත්වීමට මෙම කාඩ්පත් ප්‍රයෝජනවත් වනු ඇත.

- ආරාධිත කථිකයෝ :මෙම කාරණය උදෙසා ආරාධිත කථිකයින් අවශ්‍යද? එසේ අවශ්‍ය නම්, ඔවුන්ව සම්මුඛ වී ඔවුන් ආරාධනා කිරීමට , දිනය, කාලය ආදිය ඔවුන්ට දැනුම් දීමට, අවශ්‍ය වන්නේ නම් ගමන් පහසුකම් හා නවාතැන් සැපයීමට, ඒ කටයුත්තේ ඔවුන් යෙදෙන අතර තුර ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීමට කෙනෙකුට භාරදිය යුතුය.

- සංගීතය: අවශ්‍ය සංගීත භාණ්ඩ හා සංගීතඥයින් ලබා ගැනීමට, සංගීත කණ්ඩායම මෙහෙයවීමට, විශේෂ සංගීත සැලසුම් කිරීමට හා සමූහයා සමඟ ගීත ගැයීමට සංගීත අධ්‍යක්ෂකවරයකු තෝරාගන්න.

- ළදරු කාමරය: මේ සිද්ධිය සිදුවන අවස්ථාවේ බිළිඳුන්ට හා කුඩා දරුවන්ව රැක බලා ගැනීමට ඔබ කෙනෙකුව යොදවන්නෙහිද? එසේ නම් එම පහසුකම ලබා දීමටත් ළදරුවන්ව බලා ගැනීමටත් කෙනෙකු අවශ්‍ය වේ.

- විකිණීම: ඔබ එදින බයිබල, කිතුනු පොත් හා කැසට් පට, ආහාර ආදිය විකිණීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහාද කෙනෙකු අවශ්‍යය.

- ආසන පෙන්වන්නෝ: ආසන පෙන්වන අය, ද්‍රව්‍ය බෙදන හා එක් කරන අය, දීමනා එකතු කරන අය, ගැටලු විසඳන හා රැස්වීම වේලාවේ බාධාවන් ගැන බලන අය භාරව සිටීමටද කෙනෙකු පත් කරන්න.

- ශබ්ද විකාශනය: ඔබ විශාල ලෙස මෙය කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, හොඳ ශබ්ද විකාශන පද්ධතියක් අවශ්‍ය වේ. මේ පිළිබඳව දන්නා හා උපකරණ ඇති කෙනෙකු මේ සඳහා සොයාගන්න.

- ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය පටිගත කිරීම්: මේ සිද්ධිය පිළිබඳව ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය හෝ පටි නිපදවීමට ඔබ බලාපෙරොත්තු වන්නෙහිද? එසේ නම් නියමිත වේලාවට පටි ගත කිරීමට, පිටපත් ලබා ගැනීමට හා අවශ්‍ය උපකරණ සැපයීමට කෙනෙකු අවශ්‍ය වේ.

- සහභාගිවන්නෝ: සහභාගිවන්නන් සම්බන්ධීකරණයට කෙනෙකු අවශ්‍යය. නිදසුනක් වශයෙන් ගමන් පහසුකම්, ආහාර පාන, අවශ්‍ය නම් නැවතීමේ පහසුකම් ආදිය සැපයීමටත්, ප්‍රායෝගික ගැටලූ මතුවුවහොත් ඒ ගැන බැලීමටත් කෙනෙකු අවශය වේ.

- පසුගාමී වැඩ: පසුව කළ යුතු වැඩ සඳහා කෙනෙකු අවශ්‍යය. ඒවා අතර ඔබට අයත් දේවල් එකතු කර ගැනීම, එතැන ශුද්ධ පවිත්‍ර කිරීම, උපකරණ ආදිය රැගෙන යෑම, ඔබට උදව් කළ අයට ස්තුති කිරීම වැනි කටයුතු ඇත.

**කාර්ය පත්‍රිකා සැලසුම් කිරීම**

මිළඟ පිටු දෙකේ ඇත්තේ "දෛනික සැලසුම්" හා "මාසික සැලසුම්" සඳහා වූ කාර්ය පත්‍රිකා වේ. දෛනික හා මාසික සැලසුම් වලදී ඔබට සහාය වීමට මේවා යොදා ගන්න.

- දෛනික සැලසුම්: පිටුවේ ඉහළ කෙළවරේ දිනය ලියන්න. සැලසුම් කිරීමට තීරු භාවිත කරන්න.

- මාසික සැලසුම්: නියමිත ස්ථානයේ මාසය ලියන්න. කොටු තුළ දින ලියන්න. ඉන්පසු මාසයේ සෑම සතියකටම සැලසුම සකස් කරන්න.

## දෛනික සැලසුම

දිනය: ____________________

**ලිවිය යුතු ලිපි**

_____________ _____________________

_____________ _____________________

**දිය යුතු දුරකථන පණිවුඩ**

_______________________

_______________________

**හමුවීම්**

පෙ.ව. 06.30. ____________________
07.00 ____________________
07.30 ____________________
08.00 ____________________
08.30 ____________________
09.00 ____________________
09.30 ____________________
10.00 ____________________
10.30 ____________________
11.00 ____________________
11.30 ____________________
ප.ව. 12.00 ____________________
12.30 ____________________
01.00 ____________________
01.30 ____________________
02.00 ____________________
02.30 ____________________
03.00 ____________________
03.30 ____________________
04.00 ____________________
04.30 ____________________
05.00 ____________________
05.30 ____________________
06.00 ____________________
06.30 ____________________
07.00 ____________________
07.30 ____________________
08.00 ____________________

**කළ යුතු දේ**

________________________

________________________

________________________

**සැලසුම් කළ යුතු දේ**

________________________

________________________

________________________

**ලබා ගත යුතු දේ**

________________________

________________________

________________________

**බැලීමට යා යුතු අය**

________________________

________________________

________________________

| ඉරිදා | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

**මාසික සැලසුම** ______________________________ **මාසය**

# ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය

1. සියල්ල ඔබිනා ලෙසද පිළිවෙළින්ද කරනු ලැබේවා (1 කොරින්ති 14:40).

2. අරමුණු මගින් කළමණාකරනය යනු සැලසුම් කිරීම හා සංවිධානය මගින් කෙරෙන සේවයේ ගබඩාකාරකමය.

3. ඔබගේ ලයිස්තුව පළමුවන පරිච්ඡේදයේ සාකච්ජා කළ ලයිස්තුව හා සසඳා බලන්න.

4. ඔබගේ සාකච්ජාව පළමුවන පරිච්ඡේදයේ දී ඇති සාකච්ජාව හා සසඳා බලන්න.

## දෙවන පරිච්ඡේදය

1. කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුන්වහන්සේ තුළ එක්රාශි කරන්ට, තමන්වහන්සේ තුළ අදහස් කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වා දීමෙන්ය. (එපීස 1:9-10)

2. දෙවියන්වහන්සේගේ පරමාර්ථය වන්නේ සියලු දෙනාම යේසුස් ක්‍රිස්තුන්වහන්සේ තුළින් පාප කමාව අත්දැක, උන්වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවට ගෙනැවිත්, දෙවියන්වහන්සේගේ රාජයයේ කොටස්කරුවන් වීමය. එපීස 3:11 හා 1:9-10 ද යොහන් 3 ද බලන්න.

3. ඔබ දෙවියන්වහන්සේගේ පරමාර්ථය අවබෝධ කර නොගතහොත් ඔබගේ ජීවිතය හා සේවය ඒ හා සමඟ සුසංගත වන්නේ නැත.

4. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් සාක්ෂාත් කර ගැනීමේ උපකරණ ලෙස පුද්ගලයන්ද, ජාතීන්ද, යේසුස්වහන්සේද, ශුද්ධාත්මයාණන්ද, සභාවද භාවිත කරන සේක.

5. ඔබගේ සාරාංශය දෙවන පරිච්වේදයේ සාකච්ජාව හා සසඳන්න.

6. ඔබගේ සාරාංශය දෙවන පරිච්වේදයේ සාකච්ජාව හා සසඳන්න.

7. ඔබගේ සාරාංශය දෙවන පරිච්වේදයේ සාකච්ජාව හා සසඳන්න.

## තෙවන පරිච්වේදය

1. ඥානය නැත්තන් මෙන් නොව ඥානවන්තයන් මෙන් ප්‍රවේසමෙන් හැසිරෙන්ට බලාගෙන දවස් නපුරු බැවින්, ප්‍රස්තාව අල්ලා ගනිල්ලා (එපීස 5:15-16).

2. පරමාර්ථ ප්‍රකාශයක්, ඔබගේ සේවය පැවතීමේ සුවිශේෂී හේතුව හඳුන්වා දෙයි. එය ඔබ ක්‍රිස්තුන්වහන්සේගේ ශරීරයේ සපුරන්නාවූ සේවයේ ස්ථානය සුවිශේෂීව සාරාංශ කරයි.

3. තෙවන පරිච්ඡේදයේ දී ඇති ලයිස්තුව නැවත බලන්න.

4. පරමාර්ථය යනු සේවය පැවතීමට හේතුව දක්වන ප්‍රකාශයකි. අරමුණු පරමාර්ථය සපුරාලීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සැලැස්මේ ප්‍රකාශයන් වේ.

5. දේවධාර්මික ප්‍රකාශයක්, ඔබ දේව ධාර්මිකව විශ්වස කරන දෙය සඳහන් කරයි. දෙවියන්වහන්සේගේ සැලැස්මේ ඔබගේ සුවිශේෂී කොටස පරමාර්ථ ප්‍රකාශයෙන් පැහැදිලි කරයි.

6. ඔබගේ ලයිස්තුව තෙවන පරිච්ඡේදයේ දී ඇති ලයිස්තුව හා සසඳන්න.

7. ඔබගේ පෞද්ගලික සේවයට හා ඔබ සම්බන්ධ සංවිධානයට හෝ සභාවට හෝ පරමාර්ථ ප්‍රකාශයක් ඔබ නොලිවෙහි නම්, ඊළඟ පාඩම අධ්‍යයනයට පෙර එය ලියන්න.

## හතරවන පරිච්ඡේදය

1. තමාගේ ස්වාමියාගේ කැමැත්ත දැනගෙනත් සූදානම් නොකළාවූ ඔහුගේ කැමැත්ත ලෙස නොකළාවූ දාසයා බොහෝ පහර ලබන්නේය. (ලූක් 12:47)

2. "අරමුණ" ක් යනු ඉලක්කයකි නැතහොත් ක්‍රියාවක අවසානයයි. එය ළඟාවිය යුතු පරමාර්ථයකි. නැතහොත් අභිප්‍රායකි. ඔබ සේවයක් සඳහා "අරමුණු" පිහිටවූ විට ඔබ දෙවියන්වහන්සේගේ පරමාර්ථ සාක්ෂාත් කිරීම සඳහා සංවිධානාත්මක සැලසුම් සකස් කරන්නෙහිය.

3. පරමාර්ථ මූලික වශයෙන් ආත්මික දැක්මකි. එය ඔබ සේවයට බැඳීමට, දෙවියන්වහන්සේගේ සැලැස්මේ ඔබගේ කොටස ඉටු කිරීමට ඔබගේ සුවිශේෂි හේතු දැන ගැනීම වේ. අරමුණු යනු දෙවියන්වහන්සේ ඔබට දී ඇති පරමාර්ථය ඉටු කිරීමට ඔබට ගත හැකි පියවර වේ. ඒවා පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමේ සැලසුම් වේ.

4. මූලික අරමුණු වර්ග දෙක වන්නේ, පෞද්ගලික හා කණ්ඩායම් අරමුණු වේ.

5. ඔබගේ සාකච්ඡාව හතරවන පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව හා සසඳන්න.

6. දිගු-කාලීන අරමුණු ඈත අනාගතය වෙනුවෙනි. කෙටි-කාලීන අරමුණු මෑත අනාගතය සඳහා සැලසුම් වේ.

7. අරමුණු තෝරාගනු ලබන්නේ යාච්ඤාවෙන්, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීමෙන්, දේව වචනය අධ්‍යයනයයෙන්, හා දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ ඔබගේ සුවිශේෂි පරමාර්ථය අවබෝධ කර ගැනීමෙනි.

## පස්වන පරිච්ඡේදය

1. කැමතිවීමට සූදානම්ව සිටියාක් මෙන්ම නුඹලාගේ පුළුවන්කමේ හැටියට එහි තීන්දුවක් පැමිණෙන පිණිස දැන් කිරීමත් තීන්දු කරපල්ලා (2 කොරින්ති 8:11).

2. ක්‍රියාවලිය යනු ඔබ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට ගන්නා පියවර වේ. ඒවා නායකයෙකු විසින් සැලසුමක් සාක්ෂාත් කිරීමට ගන්නා ක්‍රම හෝ කාර්යයන් වේ.

3. මෙම උපමා මගින් යේසුස්වහන්සේ පෙන්වූයේ, අලුත් සැලසුම් හා එළිදරව්වීම් පිළිගැනීමට දැනට පවතින මිනිසුන්ගේ සම්ප්‍රදායික ආත්මික ව්‍යුහයනට ඇතැම් විට නොහැකි බවය.

4. ඔබගේ සාරාංශ, මේ පාඩමේ දී ඇති කළමණාකරන වගකීම් පිළිබඳ සෑම සාකච්ඡාවක් හා සසඳන්න.

## හයවන පරිච්ඡේදය

1. නුඹලා එකිනෙකා සුදුසු තරමට වඩා තම තමා ගැන උතුම්කොට නොසිතා, දෙවියන්වහන්සේ එකිනෙකාට බෙදා දුන් ඇදහිල්ලේ ප්‍රමාණය ලෙස පමණ දැන සිතන හැටියට මට දෙන ලද අනුග්‍රහයෙන් නුඹලා අතරෙහි එකිනෙකාට කියමි. (රෝම 12:3)

2. ඔබ යමක් අගයන විට ඔබ එහි අගය නිර්ණය කිරීම සඳහා එය පරෙස්සමෙන් පරීක්ෂාකර ලබන්නෙහිය. ඇගයීම යනු පරමාර්ථය සාක්ෂාත් කරගැනීම සඳහා ඒවායේ අගය නිර්ණය කිරීමට සැලසුම් පරීක්සාකර බැලීමේ ක්‍රියාවලිය වේ. ඔබ කිරීමට සැලසුම් කරන දෙය අරමුණුවලින් සඳහන් වේ. බලාපොරොත්තු වූ දේ ඉටු වී ඇත්දැයි ඇගයීම නිර්ණය කරයි.

3. ඇගයීම ඔබ දෙවියන්වහන්සේටත් ඔබ සමඟ සේවය කරන හා ඔබගේ සේවය ලබන අයටත්. ඔබටමත් ගණන්දීමට සලස්වයි. ඔබගේ සාර්ථකවීම් හා අසා[1]ථකවීම් මගින් ඉගෙනගැනීමට ද, සැලසුම් සංශෝධනය කිරීමටද හා අලුත් සැලසුම් සැසදීමටද ඇගයීම ඉඩ සලසයි.

4. ඔබගේ සාකච්ජාව හයවන පරිච්ඡේදයේ දී ඇති සාකච්ජාව හා සසඳන්න.

5. ඔබගේ ලයිස්තුව හයවන පරිච්ඡේදයේ දී ඇති ලයිස්තුව හා සසඳන්න.

6. ඔබ ඇගයීමෙන් උගත් දේ: දැනට පවතින සැලසුම් සංශෝධනය කිරීමට හා වැඩි දියුණු කිරීමට ද, පැරණි සැලසුම් සම්පූර්ණ කළ විට අලුත් ඒවා සැදීමටද, ඔබගේ සාර්ථකවීම්වලින් ඉගෙනීමටද, ඔබගේ වැරදීම්වලින් ඉගෙනීමටද භාවිත කරන්නෙහිය.

7. ඔබ සැලසුමක් ඇගයීමක් නොකළේ නම් හා ඇගයීමකින් ලද ප්‍රතිඵල භාවිත නොකළේ නම්, කරුණාකර එසේ කරන්න.